# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2022



## විදේශ කටයුතු අමාත්‍යාංශය
## வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
## Ministry of Foreign Affairs

# විදේශ කටයුතු අමාත්‍යාංශය
# வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
# MINISTRY OF FOREIGN AFFAIRS

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2022

වැය ශීර්ෂ අංක : **112**
செலவினத் தலைப்பு இல. : 112
**Expenditure Head No. : 112**

ජනරජ ගොඩනැගිල්ල” කොළඹ-1” ශ්‍රී ලංකාව
குடியரசு கட்டிடம், கொழும்பு -1, இலங்கை
Republic Building, Colombo -1, Sri Lanka

# පටුන


1වැනි පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ........ 1
1.1 හැඳින්වීම ........ 1
1.2 දැක්ම සහ මෙහෙවර ........ 2
1.3 කාර්යන් හා කර්තව්‍යන් ........ 3
1.4 ආයතනික ව්‍යුහය ........ 5
1.5 විදේශ දූත මණ්ඩල/ දූත කාර්යාල ජාලය ........ 6
1.6 අංශවල ව්‍යුහය ........ 7
2 වැනි පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම ........ 8
2.1 ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය ........ 8
2.2 ශ්‍රී ලංකාවේ කලාපීය සහ බහුපාර්ශ්වික නියැලීම ........ 13
2.3 අභියෝගවලට මුහුණදීම ........ 14
2.4 කාර්ය සාධන විශ්ලේෂණය: හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ ........ 15
2.4.1 ආර්ථික කටයුතු අංශය ........ 15
2.4.2 ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්ත මර්දන අංශය ........ 18
2.4.3 සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය ........ 19
2.4.4 විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය ........ 21
2.4.5 ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය ........ 22
2.4.6 මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය ........ 24
2.4.7 සාර්ක් අංශය ........ 25
2.4.8 එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය ........ 28
2.5 කාර්ය සාධන විශ්ලේෂණය: භෞමික අංශ ........ 32
2.5.1 අප්‍රිකානු කටයුතු අංශය ........ 32
2.5.2 අමෙරිකානු අංශය ........ 33
2.5.3 නැගෙනහිර ආසියානු අංශය ........ 33
2.5.4 යුරෝපය සහ මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩලයීය අංශය ........ 35
2.5.5 මැද පෙරදිග අංශය ........ 39
2.5.6 දකුණු ආසියානු අංශය ........ 41
2.5.7 අග්නිදිග ආසියානු අංශය ........ 43
2.6 කාර්ය සාධන විශ්ලේෂණය: මෙහෙයුම් අංශ ........ 45
2.6.1 කොන්සියුලර් කටයුතු අංශය ........ 45
2.6.2 සාමාන්‍ය පරිපාලන අංශය ........ 48
2.6.3 මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ........ 50
2.6.4 අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය ........ 52
2.6.5 නීති අංශය ........ 52
2.6.6 විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය ........ 56
2.6.7 සන්ධාන අංශය ........ 56
2.6.8 හදිසි ප්‍රතිචාර ඒකකය ........ 57

2.7 2022 වසරේ සුවිශේෂී අවස්ථා ....................59
3 වැනි පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය ....................61
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ....................61
3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ....................62
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ....................63
3.4 ආදායම් රැස් කිරීම පිළිබඳ කාර්ය සාධනය ....................65
3.5 ප්‍රතිපාදන උපයෝගී කරගැනීම පිළිබඳ කාර්ය සාධනය ....................66
3.6 අමාත්‍යාංශයේ වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම ....................66
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ....................68
3.8 2022 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය ....................68
3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ....................69
4 වැනි පරිච්ඡේදය - ප්‍රධාන කාර්යසාධන දර්ශක ....................81
4.1. අමාත්‍යාංශයේ සමස්ත ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම ....................81
4.2. ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම : හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ ....................83
4.3 ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම : භෞමික අංශ ....................93
4.4 ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම : මෙහෙයුම් අංශ ....................109
5 වැනි පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිළිබඳ කාර්ය සාධනය ....................119
5.1 තිරසාර සංවර්ධන ඉලක්ක ....................119
6 වැනි පරිච්ඡේදය - අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ ....................120
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ....................120
6.2 මානව සම්පත් සංවර්ධනය ....................122
7 වැනි පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ....................126

# 1 වැනි පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල හැටක (60)[1] ජාලයක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පරිපාලනය කරනු ලබන අතර, කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල / දූත කාර්යාල 43 ක් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන 30 ක් සහ ඊට අනුබද්ධ ආයතන සඳහා පහසුකම් සපයයි. ජාතික සාගර කටයුතු කමිටු (NOAC) ලේකම් කාර්යාලය, ජාත්‍යන්තර සබඳතා සහ උපාය මාර්ගික අධ්‍යයනය සඳහා වන ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKIIRS) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) යන ආයතනවල කාර්ය සාධනය ද සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ දී මෙම අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබිණි.

කොවිඩ්-19 සහ අනෙකුත් සමාන හදිසි අවස්ථා සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2020 දී අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කොවිඩ්-19 හදිසි කේන්ද්‍රස්ථාන ඒකකයට අමතරව, අමාත්‍යාංශයේ විෂය පථය (2022 ජූලි 22 දිනැති අංක 2289/43 අතිවිශේෂ ගැසට් පත්‍රය) විවිධ අංශ 23කට වෙන් කර පවරා ඇත. ඒ අනුව, එක් එක් අංශයට පවරා ඇති කාර්යයේ ස්වභාවය අනුව, හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ අටක් (8), භෞමික අංශ හතක් (7) සහ මෙහෙයුම් අංශ අටක් (8) අමාත්‍යාංශයේ අංශවල ව්‍යුහයට ඇතුළත් වේ.

ද්විපාර්ශ්වික දේශපාලන හා ආර්ථික සබඳතා, ආරක්ෂාව සහ උපායමාර්ගික සහයෝගීතාව, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව, සංවර්ධන ආධාර, සංස්කෘතික සහ ජනතාව අතර සබඳතා වැඩිදියුණු කිරීම තුළින් විදේශයන්හි ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට මෙන්ම බහුපාර්ශ්වික සහ කලාපීය මැදිහත්වීම් පෝෂණය කිරීම සඳහා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල ජාලය මූලික වශයෙන් කටයුතු කරනු ලැබිණි. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල විසින් විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්ගේ රැකියා සුබසාධනය සහතික කරන අතරම අක්ත ගන්වන ලද රටවල වෙසෙන විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාවන්ට අවශ්‍ය කොන්සියුලර් කටයුතු සැපයීමේ වගකීම දරයි.

[1] තානාපති කාර්යාල 34ක්, මහ කොමසාරිස් කාර්යාල 12ක්, ජිනිවාහි හා නිව්යෝර්ක්හි පිහිටි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාල, චෙන්නායිහි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය, පලස්තීනයේ නියෝජිත කාර්යාල සහ කොන්සල් ජනරල් කාර්යාල 10ක් මෙම ශාඛා ජාලයට ඇතුළත් වේ.

**1.2** දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම



**මෙහෙවර**

ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂා කිරීම, විදහා දැක්වීම, ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම

## 1.3 කාර්යන් හා කර්තව්‍යන්

1 කොටස: වගන්තිය (I) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක: 2289/43 - 2022 ජුලි මස 22 වැනිදා

| රාජකාරි සහ කාර්යයන් | II වැනි තීරුව<br>(දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා) | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ ප්‍රඥප්ති |
|---|---|---|
| 1. විදේශ කටයුතු විෂය සම්බන්ධයෙන් සහ රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ප්‍රතිපත්ති මත පදනම්ව II තීරුවේ ලැයිස්තුගත කර ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා විෂය පථයට අයත් විෂයයන් පිළිබඳ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම, ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය සහ ඇගයීම. | 1. විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල | 1. 1981 අංක: 4 දරන කොන්සියුලර් කාර්යයන් පිළිබඳ පනත. |
| 2. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ එන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ ජනතා හිතකාමී ලෙස සැපයීම. | 2. ජාතික සාගර කටයුතු කමිටු ලේකම් කාර්යාලය | 2. 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත |
| 3. නවීන කළමනාකරණ ශිල්පීය ක්‍රම සහ තාක්ෂණය භාවිතා කරමින් සියලුම පද්ධති සහ ක්‍රියා පටිපාටි ප්‍රතිසංස්කරණය කිරීම සහ එමඟින් දූෂණය හා නාස්තිය තුරන් කරමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු වන බව සහතික කිරීම. | 3. ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය | 3. 2000 අංක 45 දරන ශ්‍රී ලංකා උපායමාර්ගික අධ්‍යයන ආයතන පනත. |
| 4. ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව සහයෝගීතාවය පුළුල් කරමින් විදේශ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම මගින් විදේශයන්හි ශ්‍රී ලංකාව පිළිබඳ යහපත් ප්‍රතිරූපය ස්ථාවර කිරීම. | | 4. I සහ II තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති විෂයයන්ට අදාළ සහ වෙනත් කිසිදු අමාත්‍යවරයෙකුගේ විෂය පථය යටතට ගෙන නොමැති අනෙකුත් සියලුම නීති සම්පාදනය |
| 5. ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, සම්බන්ධීකරණය සහ රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම. | | |
| 6. ශ්‍රී ලංකාවේ යහපත් ප්‍රතිරූපයට බලපාන අහිතකර ප්‍රචාර මැඩලීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ස්ථාවර කිරීම සඳහා සුදුසු ලෙස ප්‍රතිචාර දැක්වීම. | | |
| 7. දේශපාලන, ආර්ථික, පාරිසරික, සාමාජීය සහ සංස්කෘතික සහයෝගීතාවය පිළිබඳ ජාත්‍යන්තර සහ කලාපීය සංගම් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම. | | |

| රාජකාරි සහ කාර්යයන් | II වැනි තීරුව<br>(දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා) | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ ප්‍රඥප්ති |
|---|---|---|
| 8. විදේශ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීම සහ සන්ධාන, ගිවිසුම් සහ සම්මුතීන් සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම. | | |
| 9. රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද ලබාදීම. | | |
| 10. බාහිර වෙළඳාම, ආයෝජන, සංචාරක, රැකියා සහ බාහිර මූල්‍ය සම්බන්ධතා ප්‍රවර්ධනය සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත අවශ්‍ය සහය ලබා දීම. | | |
| 11. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව සහ සමුද්‍රීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විදේශ සබඳතා තහවුරු කිරීම. | | |
| 12. විදේශ රටවල පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනයට අදාළව අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම. | | |
| 13. කොන්සියුලර් සේවා සැපයීම. | | |
| 14. ශ්‍රී ලංකා විදේශ සේවයේ සහ එතෙර රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට අනුයුක්තව සිටින පිරිස් පරිපාලනය කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය කුසලතා ඉහළ නැංවීමට පියවර ගැනීම. | | |
| 15. භූ-දේශපාලනික ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවේ යහපතට හිතකර ලෙස එවැනි ප්‍රවණතා කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු උපාය මාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම. | | |
| 16. II තීරුවේ සඳහන් සියලුම ආයතන සහ එම ආයතන වෙත පවරා ඇති සියලුම විෂයයන් සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීම. | | |
| 17. II තීරුවේ ලැයිස්තුගත කර ඇති සියලුම ආයතන අධීක්ෂණය. | | |

## 1.4 ආයතනික ව්‍යුහය



## 1.5 විදේශදූත මණ්ඩල/ දූත කාර්යාල ජාලය



## 1.6 අංශවල ව්‍යුහය



අමාත්‍යාංශයේ අංශවල ව්‍යුහය
හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ
භෞමික අංශ
මෙහෙයුම් අංශ
ආර්ථික කටයුතු අංශය
ජාත්‍යන්තර ආරක්ෂාව සහ ත්‍රස්ත මර්දන අංශය
සාගර කටයුතු,පරිසර සහ දේශගුණික විපර්යාස අංශය
විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් පිළිබඳ අංශය
ප්‍රතිපත්ති සැලසුම්,පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය
සාර්ක් අංශය
එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය
අප්‍රිකානු කටයුතු අංශය
අමෙරිකානු අංශය
නැගෙනහිර ආසියානු අංශය
යුරෝපය සහ මධ්‍යම ආසියාව,යුරෝපා සංගමය හා පොදුරාජ්‍ය මණ්ඩල අංශය
මැද පෙරදිග අංශය
දකුණු ආසියානු අංශය
අග්නිදිග ආසියානු අංශය
ගිණුම හා මූල්‍ය අංශය
කොන්සියුලර් කටයුතු අංශය
සාමාන්‍ය පරිපාලන අංශය
මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය
අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය
නීති අංශය
විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය
සංධාන අංශය

## 2 වැනි පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම

විදේශ ජාතීන් අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා මෙහෙයවීම සහ පවත්වාගෙන යාම පිළිබඳ වගකීම දරන එකම රාජ්‍ය ආයතනය ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශය, කොවිඩ්-19 වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගෝලීය ආර්ථික අර්බුදය විසින් නිර්මාණය කරන ලද විවිධ අභියෝග සහ දුෂ්කරතා මධ්‍යයේ, රටේ ජාතික අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රක්ෂේපණය කරමින් සහ ප්‍රවර්ධනය කරමින්, ඉහළම මට්ටමින් තෘප්තිමත් විය හැකි අයුරින් සිය රාජකාරි සහ කාර්යයන් ඉටු කළේය. ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල, රේඛීය නියෝජිතායතන/ අමාත්‍යාංශ මෙන්ම කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල/ දූත කාර්යාල සමඟ සමීප සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන් යුතුව, වසර තුළදී හඳුනාගත් ගැටලු සහ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙමින් එහි රාජකාරි හා කාර්යයන් අඛණ්ඩව සංවර්ධනය කිරීම කෙරෙහි ද අමාත්‍යාංශය අවධානය යොමු කරයි.

## 2.1 ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී, ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අමාත්‍යවරු, රටේ ප්‍රමුඛතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විදේශ රටවල ඔවුන්ගේ අදාළ සම මට්ටමේ ප්‍රභූවරුන් සහ මැදිහත්කරුවන් සමඟ නිරත වී අන්තර් ක්‍රියා කළහ. මෙම සන්දර්භය තුළ, ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා රාජ්‍ය අවමංගල්‍ය උත්සවවලට සහභාගී වීම සඳහා එක්සත් රාජධානියේ සහ ජපානයේ නිරතවූ සංචාරවලට අමතරව, 2022 සැප්තැම්බර් මස ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) පාලක මණ්ඩලයේ 55 වැනි වාර්ෂික රැස්වීමට සහභාගී වීම සඳහා පිලිපීනයේ නිරත වූ සංචාරය මෙන්ම, 2022 නොවැම්බර් මස පැවැත්වූ COP-27 දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට (UNFCC) සහභාගී වීම සඳහා ඊජිප්තුවේ නිරත වූ සංචාරය ද සුවිශේෂී විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (2022 දී පැවැත් වූ) එක්ස්පෝ-2020 ප්‍රදර්ශනයට, පැරිසියේ ඉන්දු පැසිෆික් කලාපයේ සහයෝගිතා අමාත්‍ය සංසදයට සහ කාම්බෝජයේ පැවැති ආසියාන් සමුළුවට, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 49 වැනි, 50 වැනි සහ 51 වැනි සැසිවාරවලට, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වැනි සැසිවාරයට (UNGA), පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුවට (CHOGM) සහ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ (IORA) 22 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමට (COM) සහභාගීවීම සඳහා විදේශ කටයුතු අමාත්‍යවරයා සිදු කළ නිල සංචාර මඟින් කලාපීය සහ බහුපාර්ශ්වික සංසද සමඟ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සම්බන්ධය පෙන්නුම් කරනු ලැබිණි.

විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කොරියානු ජනරජය, ඉන්දියාව, කටාර්, සිංගප්පූරුව සහ අමෙරිකා එක්සත් ජනපදය යන රටවල නිරත වූ ද්විපාර්ශ්වික නිල සංචාරයන් මඟින් ද්විපාර්ශ්වික සහයෝගීතාව නව තලයකට ඔසවා තැබීම සඳහා නව දර්ශනපථ විවෘත කරනු ලැබිණි. 2022 ජනවාරි මාසයේ දී වෙළෙඳ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙළෙඳ නියෝජිත කණ්ඩායමක් සමඟ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා නිරත වූ පාකිස්තාන සංචාරය මඟින් පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් සබඳතා තවදුරටත් ශක්තිමත් විය. වාර්තා කරනු ලබන කාලය තුළ දී, ඉන්දියාව, බංග්ලාදේශය, භූතානය, චීනය, හංගේරියාව, සෞදි අරාබිය, නේපාලය, තුර්කි ජනරජය සහ තායිලන්තය යන රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ නිල සංචාර මෙන්ම, මාලදිවයින් ජනාධිපතිවරයාගේ පෞද්ගලික සංචාරය සහ ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායකයාගේ ශ්‍රී ලංකා සංචාරය මඟින් එම රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීමට උපකාරී විය.

මීට අමතරව, සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, එක්සත් රාජධානියේ දකුණු ආසියාව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා, කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායකවරයා, කොරියානු ජනරජයේ රජයේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ අමාත්‍යවරයා, මාලදිවයිනේ පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහ ඔස්ට්‍රේලියාවේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා ද ශ්‍රී ලංකාවට පැමිණි රජයේ ඉහළ පෙළේ නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ අදාළ සම මට්ටමේ ප්‍රභූවරුන් සහ මැදිහත්කරුවන් හා සම්බන්ධ වූහ. වාර්තා කරනු ලබන කාල සීමාව තුළදී, භූතානයේ පැවැති ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) 75 වැනි සැසිවාරයේ අග්නිදිග ආසියාව සඳහා වූ කලාපීය කමිටුවට සහභාගී වීමට සෞඛ්‍ය අමාත්‍යවරයා නිරත වූ සංචාරය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා ජපානයේ නිරත වූ සංචාරය, විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා, විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපල විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා සහ වෙළෙඳ අමාත්‍යවරයා ඕමානයේ නිරත වූ සංචාරය, සංචාරක අමාත්‍යවරයා සහ මැණික් හා ස්වර්ණාභරණ රාජ්‍ය අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයට EXPO-2020 සඳහා සහභාගී වීමට නිරත වූ සංචාරය, මුදල් අමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහ සංචාරක අමාත්‍යවරයා ඉන්දියාවේ නිරත වූ සංචාරය, අනෙකුත් අමාත්‍ය සහ ජ්‍යෙෂ්ඨ නිල මට්ටමේ බාහිර සංචාර අතරින් වැදගත් විය.

පහත වගුව I සහ II මඟින් සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවට පැමිණි සහ පිටතට ගිය ඉහළ මට්ටමේ සංචාර පිළිබඳ විස්තර නිරූපණය කෙරේ.

## *වගුව I - ඉහළ මට්ටමේ සංචාර - අභ්‍යන්තර*

## රාජ්‍ය නායකවරුන්/ ආණ්ඩු ප්‍රධානීන්

| | |
|---|---|
| 1. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මහතා 2021 දෙසැම්බර් 30 සිට 2022 ජනවාරි 2 දක්වා |
| 2. | දකුණු අප්‍රිකා ජනරජයේ ජනාධිපති සිරිල් රම්ෆෝසා මහතා 2022 නොවැම්බර් 14 සිට 16 දක්වා |
| 3. | මාලදිවයින් ජනරජයේ ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මහතා 2022 දෙසැම්බර් 29 සිට 2023 ජනවාරි 2 දක්වා |

## විදේශ අමාත්‍යවරු සහ විදේශ නියෝජ්‍ය අමාත්‍යවරු

| | |
|---|---|
| 1. | මහජන චීන සමූහාණ්ඩුවේ රාජ්‍ය මන්ත්‍රී සහ විදේශ අමාත්‍ය වැන්ග් යී මහතා 2022 ජනවාරි 8-9 දක්වා |
| 2. | හංගේරියාවේ විදේශ කටයුතු සහ වෙළෙඳ අමාත්‍ය පීටර් සිජ්ජාර්ටෝ මහතා 2022 ජනවාරි 12 වැනි දින |
| 3. | තුර්කි ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය මෙව්ලුට් කැවුසොග්ලු මහතා 2022 ජනවාරි 27-28 දක්වා |
| 4. | සෞදි අරාබියේ විදේශ කටයුතු අමාත්‍ය ෆයිසාල් බින් ෆර්හාන් අල් සවුද් මහතා 2022 මාර්තු 13 සිට 14 දක්වා |
| 5. | බංග්ලාදේශයේ විදේශ අමාත්‍ය ආචාර්ය ඒ.කේ. අබ්දුල් මොමන් මහතා 2022 මාර්තු 28-31 දක්වා |
| 6. | භූතානයේ විදේශ අමාත්‍ය ආචාර්ය ටැන්ඩි ඩෝර්ජි මහතා 2022 මාර්තු 28-31 දක්වා |
| 7. | ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2022 මාර්තු 27-30 දක්වා |
| 8. | නේපාලයේ විදේශ අමාත්‍ය ආචාර්ය නාරායන් ඛඩ්කා මහතා 2022 මාර්තු 28-31 දක්වා |
| 9. | තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය දොන් ප්‍රමුද්විනායි මහතා 2022 මාර්තු 28 සිට 30 දක්වා |

## වෙනත් අමාත්‍යවරු

| | |
|---|---|
| 1. | මාලදිවයින් ජනරජයේ කථානායක මොහොමඩ් නෂීඩ් මහතා 2022 ජනවාරි 16-18 දක්වා පැවැති 5 වැනි යොවුන් පාර්ලිමේන්තුවේ 2 වැනි සැසිවාරයේ ප්‍රධාන ආරාධිතයා ලෙස |
| 2. | එක්සත් රාජධානියේ දකුණු ආසියාව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විම්බල්ඩන්හි අහ්මඩ් මහතා 2022 ජනවාරි 18-20 දක්වා |
| 3. | කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායක පාර්ක් බෙයොන්ග් සෙවුග් මහතා 2022 ජනවාරි 19 සිට 22 දක්වා |
| 4. | කොරියානු ජනරජයේ රජයේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ අමාත්‍ය කූ යුන් චෙඕල් මහතා 2022 මාර්තු 30 සිට අප්‍රේල් 2 දක්වා |
| 6. | මාලදිවයින් ජනරජයේ පාර්ලිමේන්තු කථානායක මොහොමඩ් නෂීඩ් මහතා 2022 මැයි 19-22 සහ 2022 ජුනි 17-20 දක්වා |
| 7. | ඕස්ට්‍රේලියාවේ ස්වදේශ කටයුතු අමාත්‍ය ක්ලෙයාර් ඕ නීල් මහතා 2022 ජුනි 19 සිට 22 දක්වා |
| 8. | මාලදිවයින් ජනරජයේ පාර්ලිමේන්තු කථානායක මොහොමඩ් නෂීඩ් මහතා 2022 ඔක්තෝබර් 19 සිට 22 දක්වා |

## වෙනත් විදේශීය සම්භාවනීය අමුත්තන්

| | |
|---|---|
| 1. | එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ සහකාර පරිපාලක සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ආසියා සහ පැසිෆික් කලාපීය කාර්යාංශයේ අධ්‍යක්ෂ කන්නි විග්නරාජා මහත්මිය 2021 දෙසැම්බර් 12 සිට 2022 ජනවාරි 7 දක්වා |
| 2. | ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සභාපති මසට්සුගා අසකාවා මහතා 2022 මාර්තු 9 සිට 11 දක්වා |
| 3. | එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දේශපාලන කටයුතු පිළිබඳ උප ලේකම් වික්ටෝරියා නුලන්ඩ් 2022 මාර්තු 22-23 දිනවල |
| 4. | බිම්ස්ටෙක් සංවිධානයේ මහලේකම් ටෙන්සිං ලෙක්ෂෙල් මහතා 2022 මාර්තු 26 සිට අප්‍රේල් 1 දක්වා |
| 5. | ඉන්දියාවේ විදේශ ලේකම් විනායි මෝහන් ක්වාත්‍රා මහතා 2022 ජුනි 23 වැනි දින |
| 6. | ජපාන විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්නිදිග සහ නිරිතදිග ආසියානු කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කානෝ ටකෙහිරෝ මහතා (ශ්‍රී ලංකාව සහ ජපානය අතර ප්‍රතිපත්ති (දේශපාලන) සංවාදයේ තුන්වැනි වටය) 2022 ජුලි 14-16 දක්වා |
| 7. | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) පරිපාලක සමන්තා පවර් මහත්මිය 2022 සැප්තැම්බර් 10-12 දක්වා |
| 8. | එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) හිටපු විධායක අධ්‍යක්ෂ එරික් සෝල්හයිම් මහතා 2022 ඔක්තෝබර් 10-13 දක්වා |

**සමුළු සහ වෙනත් අවස්ථා**

| | |
|---|---|
| 1. | 2022 මාර්තු 28-30 දක්වා කොළඹ පැවැති බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC) 5 වැනි සමුළුව මේ සඳහා බිම්ස්ටෙක් මහලේකම්වරයා සහ සාමාජික රටවල විදේශ අමාත්‍යවරු 5 දෙනෙක් සහභාගී වූහ. |

***වගුව II - ඉහළ මට්ටමේ සංචාර - බාහිර***

**ජනාධිපතිතුමා**

| අංක | රට | කාලසීමාව (2022) | අරමුණ |
|---|---|---|---|
| 1. | එක්සත් රාජධානිය | සැප්තැම්බර් 19-22 දක්වා | එලිසබෙත්-II මහරැජිණගේ රාජ්‍ය අවමංගල්‍ය උත්සවයට සහභාගී වීම |
| 2. | ජපානය | සැප්තැම්බර් 26-28 දක්වා | ජපානයේ හිටපු ජනාධිපති ෂින්සෝ අබේ මහතාගේ රාජ්‍ය අවමංගල්‍ය උත්සවයට සහභාගී වීම |
| 3. | පිලිපීනය | සැප්තැම්බර් 28-30 දක්වා | ආසියානු සංවර්ධන බැංකුවේ පාලක මණ්ඩලයේ 55 වැනි වාර්ෂික රැස්වීමට සහභාගී වීමට |
| 4. | ඊජිප්තුව | නොවැම්බර් 7-8 දක්වා | එක්සත් ජාතීන්ගේදේශගුණික විපර්යාස පිළිබඳ සම්මේලනයට (UNFCCC), සහභාගී වීම |

## විදේශ කටයුතු අමාත්‍යතුමා

| අංක | රට | කාලසීමාව (2022) | අරමුණ |
|---|---|---|---|
| 1. | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ජනවාරි 2-6 දක්වා | එක්ස්පෝ-2020 ප්‍රදර්ශනයට සහභාගී වීම |
| 2. | කොරියානු ජනරජය | ජනවාරි 6-8 දක්වා | නිල සංචාරය |
| 3. | ඉන්දියාව | පෙබරවාරි 6-8 දක්වා | නිල සංචාරය |
| 4. | පැරීසිය | පෙබරවාරි 21-25 දක්වා | ඉන්දු පැසිෆික් කලාපයේ සහයෝගිතාව පිළිබඳ අමාත්‍ය සංසදය සඳහා නිල සංචාරය |
| 5. | ජිනීවා | පෙබරවාරි 25 සිට මාර්තු 5 දක්වා | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 49 වැනි සැසි වාරයට සහභාගී වීම |
| 6. | ඩෝහා කටාර් | මාර්තු 26-27 දක්වා | නිල සංචාරය |
| 7. | සිංගප්පූරුව | ජූනි 8-11 දක්වා | නිල සංචාරය |
| 8. | ජිනීවා | ජූනි 12-17 දක්වා | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 50 වැනි සැසි වාරයට සහභාගී වීම |
| 9. | රුවන්ඩාව | ජූනි 20-26 දක්වා | පොදුරාජ්‍ය මණ්ඩලයීය රාජ්‍යනායක සමුළුවට (CHOGM) සහභාගී වීම |
| 10. | කාම්බෝජය | අගෝස්තු 4-5 දක්වා | ආසියාන් සමුළුවට සහභාගී වීම |
| 11. | ජිනීවා | සැප්තැම්බර් 7-13 දක්වා | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 50 වැනි සැසි වාරයට සහභාගී වීම |
| 12. | නිව්යෝර්ක් | සැප්තැම්බර් 19-27 දක්වා | එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වැනි සැසි වාරයට සහභාගී වීම |
| 13. | ජිනීවා | ඔක්තෝබර් 3-8 දක්වා | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 51 වැනි සැසි වාරයට සහභාගී වීම |
| 14. | බංගලාදේශය | නොවැම්බර් 22-24 දක්වා | 22 වැනි අයෝරා සම්මන්ත්‍රණයට සහභාගී වීම |
| 15. | එක්සත් ජනපදය | නොවැම්බර් 29 සිට දෙසැම්බර් 5 දක්වා | අමෙරිකා එක්සත් ජනපදයේ සිදුකළ නිල සංචාරය |

**විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා සහ වෙනත් අමාත්‍යවරු**

| අංක | රට | කාලසීමාව (2022) | අරමුණ |
|---|---|---|---|
| 1. | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ජනවාරි 3 වැනි දින | සංචාරක අමාත්‍යතුමා සහ මැණික් හා ස්වර්ණාභරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාරය |
| 2. | පාකිස්ථානය | ජනවාරි 20-27 දක්වා | විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාරය |
| 3. | ඉන්දියාව | පෙබරවාරි 6-8 දක්වා | පාර්ලිමේන්තුවේ කථානායකතුමා, මුදල් අමාත්‍යතුමා සහ සංචාරක අමාත්‍යතුමාගේ සංචාරය |
| 4. | සවුදි අරාබියානු රාජධානිය | මාර්තු 19-24 දක්වා | විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාරය |
| 5. | ඕමානය | මාර්තු 26-28 දක්වා | වෙළෙඳ අමාත්‍යතුමාගේ සංචාරය |
| 6. | ඕමානය | ජුනි 27-29 දක්වා | විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගේ සංචාරය |
| 7. | භූතානය | සැප්තැම්බර් 5-9 දක්වා | ලෝක සෞඛ්‍ය සංවිධානයේ 75 වැනි අග්නිදිග ආසියානු කලාපීය කමිටුවට සහභාගී වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යතුමාගේ සංචාරය |
| 8. | ජපානය | සැප්තැම්බර් 27 සිට ඔක්තෝබර් 4 දක්වා | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ සංචාරය |
| 9. | රුසියාව | ඔක්තෝබර් 9-16 දක්වා | අධ්‍යාපන අමාත්‍යතුමාගේ සංචාරය |
| 10. | කසකස්ථානය | ඔක්තෝබර් 12-13 දක්වා | ආසියාවේ අන්තර් ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සමුළුවට සහභාගී වීමට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාරය |
| 11. | එක්සත් රාජධානිය | නොවැම්බර් 7 වැනි දින | ලෝක සංචාරක වෙළෙඳපොළට සහභාගී වීමට සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගේ සංචාරය |

## 2.2 ශ්‍රී ලංකාවේ කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු

සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ බිම්ස්ටෙක් කාර්ය සාධක බලකායේ (BTFTM) 4 වැනි රැස්වීම, 22 වැනි බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම (SOM) සහ 18 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීම ද ඇතුළුව, බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (BIMSTEC) රැස්වීම්/සම්මන්ත්‍රණ ගණනාවකට ශ්‍රී ලංකාව සහභාගී වී සත්කාරකත්වය සපයන ලදී. සාමාජික රටවල විදේශ අමාත්‍යවරුන් පස් දෙනෙකු (5) සහ බිම්ස්ටෙක් මහ ලේකම්වරයාගේ පුද්ගලික සහභාගීත්වයෙන් යුතුව 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව විසින් පවත්වන ලද 5 වැනි බිම්ස්ටෙක් සමුළුවට, සාමාජික රටවල රාජ්‍ය නායකයින්/ ආණ්ඩු ප්‍රධානීන් සත් (7) දෙනෙකු අතථ්‍ය ලෙස සහභාගී විය.

දූපත් රාජ්‍යයක් ලෙස, 2022 වර්ෂයේදී ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානය (IORA) සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම වැදගත් වූ අතර, විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා 2022 නොවැම්බර් මාසයේදී බංග්ලාදේශයේ පැවැති එහි 22 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමට සහභාගි විය. කොළඹ ක්‍රියාවලිය (CP), ආසියානු සංවර්ධන බැංකුව (ADB) මෙන්ම, දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC) සහ අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) වැනි අනෙකුත් කලාපීය සහයෝගීතා ආයතන සමඟ අමාත්‍යාංශයේ මැදිහත්වීම් රාශියක් සිදු කෙරිණ. 2022 ඔක්තෝබර්

මාසයේදී කසකස්තානයේ පැවැති ආසියාවේ අන්තර් ක්‍රියා සහ විශ්වාසය ගොඩනැඟීමේ ක්‍රියාමාර්ග පිළිබඳ 6 වැනි සමුළුවට (CICA) විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතාගේ සහභාගීත්වය ද බහුවිධ සහයෝගීතා ක්ෂේත්‍රයක සාමාජික රටවල් අතර සබඳතා වැඩිදියුණු කිරීමට හේතු විය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 49, 50 සහ 51 වැනි සැසිවාරවලදී ශ්‍රී ලංකාව අඛණ්ඩව අන්තර්ක්‍රියා සහ නියෝජනයන් සිදු කළ අතර, රටේ ජනතාවගේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය සහ සමාන අයිතිවාසිකම්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ ස්ථාවරය නැවත අවධාරණය කළේය.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 77 වැනි සැසිවාරය සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට නායකත්වය ලබා දෙමින් විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා එම සැසියේදී ප්‍රකාශයක් කරමින්, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය සහ වත්මන් ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ රටේ ජනතාව මුහුණ දෙන අන්තර් සම්බන්ධිත අභියෝගවලට මුහුණ දීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය ඉස්මතු කළේය.

2022 ජූනි 23 වැනි දින නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී පැවැති, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයන්ගේ 22 වැනි රැස්වීම අතරතුර දී පවත්වන ලද මැතිවරණයේදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවේ (CEDAW) 2023-2026 කාලසීමාව සඳහා මහාචාර්ය රංගිතා ද සිල්වා ද අල්විස් මහත්මිය තේරී පත් විය. නිව්යෝර්ක් හි ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය, අනෙකුත් ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල සමඟ එක්ව මෙම මැතිවරණයේ සාර්ථක ජයග්‍රහණය සඳහා ප්‍රචාරක කටයුතුවල නිරත විය.

2022 ජූනි මාසයේදී, තිරසාර සංවර්ධන කවුන්සිලය (SDC) විසින් තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රයේ පදනම මත ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම පිළිබඳව විශ්ලේෂණය කොට, එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) ඉහළ මට්ටමේ දේශපාලන සංසදයට ඉදිරිපත් කරන ලදී.[2] ගෝලීය තිරසාර සංවර්ධන වාර්තාවට අනුව, අඛණ්ඩව දෙවැනි වරටත්, ශ්‍රී ලංකාව සිය ගෝලීය ශ්‍රේණිගත කිරීම ස්ථාන 11 කින් වැඩිදියුණු කර ඇති අතර, 2022 දී රටවල් 163 කින් 76 වැනි ස්ථානයට පත්ව ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ස්ථාවර ප්‍රගතියක් පෙන්නුම් කරමින්, 2021 දී ශ්‍රී ලංකාව රටවල් 165 කින් 87 වැනි ස්ථානය දක්වා ස්ථාන 7 කින් ඉදිරියට පැමිණියේය.

## 2.3 අභියෝගවලට මුහුණ දීම

කොවිඩ්-19 වසංගතයෙන් පසුව ඇති වූ මූල්‍ය බාධාවන්ට මුහුණදීමේ දී ද්විපාර්ශ්වික පරිත්‍යාගශීලීන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ඊට අනුබද්ධ ආයතන වැනි බහුපාර්ශ්වික සංවිධාන සමඟ සහයෝගයෙන් යුතුව, ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. රට හමුවේ පැවැති ආර්ථික අභියෝගවලට මුහුණ දීමට ගත් ක්‍රියාමාර්ග අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිවලට සහාය වීම පිණිස අමෙරිකානු ඩොලර් බිලියන 2.9 ක විස්තීරණ අරමුදල් පහසුකමක් (EFF) සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට එළඹීම, ශ්‍රී ලංකා රජය විසින් ලබාගත් වැදගත්ම ජයග්‍රහණවලින් එකකි.

ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ගැටලු විසඳීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි අනුබද්ධ ආයතන විසින් 2022 ජූනි 9 වැනි දින දියත් කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 47.2 ක් වටිනා ඒකාබද්ධ මානුෂීය අවශ්‍යතා සහ ප්‍රමුඛතා (HNP) ද එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි අනුබද්ධ ආයතන සමඟ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ සහ ස්ථිර සහසම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් විය.විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල /දූත කාර්යාල එක්ව, රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සහ කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල සමඟ සහයෝගයෙන් යුතුව, මෙකී ඒකාබද්ධ මානුෂීය අවශ්‍යතා සහ ප්‍රමුඛතා සම්බන්ධීකරණය කොට පහසුකම් සපයන ලදී.

[2] 2030 තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ න්‍යාය පත්‍රය අනුව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට අදාළව දෙවැනි ජාතික ස්වේච්ඡා සමාලෝචනය (VNR) 700 කට අධික බහුවිධ පාර්ශ්වකරුවන්ගේ උපදේශන හරහා සිදු කරනු ලැබිණි. 2030 තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ න්‍යාය පත්‍රයට ශ්‍රී ලංකාවේ කැපකිරීම් අනුව, එකී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ වර්තමාන තත්වය, ප්‍රවණතා, පරතරයන්,අභියෝග සහ අවස්ථා පිළිබඳ විග්‍රහයක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

රාජ්‍ය වියදම් කපා හැරීමේ පියවරක් ලෙස, විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල අත්‍යවශ්‍ය නොවන කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව අඩු කරමින් විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල ඇතුළු අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් තාර්කික කිරීමට අමාත්‍යාංශය මූල පිරීම් ගණනාවක් සිදු කොට ඇත. ඒ අනුව, එම රටවල් අතර අඛණ්ඩ රාජ්‍යතාන්ත්‍රික සබඳතා සහතික කරමින්, ආසන්නයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත ඒවායෙහි කාර්යයන් සහ කර්තව්‍යයන් අක්ත ගැන්වීම මඟින්, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාල තුනක් (3)[3] තාවකාලිකව වසා දැමීම සඳහා පියවර ගන්නා ලදී.

අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය සහ යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලවලින් පිටත දිගු පෝලිම් නිර්මාණය වීමට විසඳුම් සෙවීම සඳහා මාර්ගගතව කාලය කලින් වෙන්කර ගැනීමේ ක්‍රමය හඳුන්වා දීම මඟින්, සාමාන්‍ය ජනතාව වෙත කොන්සියුලර් සේවාවන් ලබා දීමෙන් අමාත්‍යාංශය සුවිශේෂී ජයග්‍රහණයක් ලබා ඇත. හදිසියේ ඉහළ ගිය සේවා ඉල්ලුම හේතුවෙන් කොන්සියුලර් සේවා සැපයීම සම්බන්ධයෙන් වූ පුළුල් පරාසයක වූ ගැටලුවලට විසඳුම් ලබා දෙන අතරම, වසර තුළදී මහජනතාවගේ සියලුම කොන්සියුලර් ඉල්ලීම් පිළිබඳව නියමිත වේලාවට කටයුතු කිරීමට අමාත්‍යාංශය සමත් විය. 2022 දී, ලේඛන සත්‍යාපනයෙන් ලැබූ ආදායම ලෙස අමාත්‍යාංශය විසින් රුපියල් 386,892,508/- ක මුළු ආදායමක් උපයා ඇති අතර, එය 2021 ට සාපේක්ෂව 120% ක පමණ ඉහළ යාමකි.

අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර අංශය විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල සමඟ සහයෝගයෙන් යුතුව රටේ වෛද්‍ය උපකරණ සහ ඖෂධ සැපයුම් හිඟයට සහාය වීම සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. ඒ අනුව, සමාලෝචිත කාල සීමාව තුළදී එම ඒකකය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් හදිසි සැපයුම් තොග 122 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අදාළ බලධාරීන් වෙත භාර දෙන ලදී. 2022 සැප්තැම්බර් මාසයේදී පාකිස්තානයේ ගංවතුරෙන් විපතට පත් වූවන් සඳහා ලංකා තේ තොගයක් පරිත්‍යාග කිරීමට ද අමාත්‍යාංශය විසින් පහසුකම් සලසා ඇත.

2022 ජූලි 19 වැනි දින එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පුද්ගල ජාවාරම් (TIP) වාර්තාවේ ශ්‍රී ලංකාව දෙවැනි ස්ථරය (Tier 2) දක්වා උසස් කරන ලදී. පසුගිය වසර තුන තුළ දී ශ්‍රී ලංකාව 3 වැනි ස්ථරයට පහත හෙළීමේ වැඩි අවදානමක් සහිතව, දෙවැනි ස්ථරයේ පිරික්සුම් ලැයිස්තුවේ රැඳී සිටියේය.

මෙම වාර්තාව මඟින් විදේශයන්හි අදාළ දූත මණ්ඩල / දූත කාර්යාල, රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සහ කොළඹ පිහිටි විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව අමාත්‍යාංශයේ එක් එක් අංශයෙහි කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කරමින් 2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දී අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය සමාලෝචනය කරයි.

## 2.4 කාර්ය සාධන විශ්ලේෂණය: හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ

### 2.4.1 ආර්ථික කටයුතු අංශය

අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල සහ ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සඳහා පහසුකම් සැලසීමෙන් ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ වගකීම දරයි. විදේශයන්හි ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා මෙම අංශය ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත උපාය මාර්ගික මාර්ගෝපදේශන සහ සහාය ලබා දෙයි.

ආර්ථික කටයුතු අංශයේ එක් ප්‍රධාන කාර්යයක් වන්නේ, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන, වාණිජ දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, වාණිජ මණ්ඩල, ඒකාබද්ධ ඇඟලුම් සංගමය,

[3] නොර්වේහි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය, ඉරාකයේ බැග්ඩෑග්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය මෙසේ තාවකාලික ව වසා දැමිණි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, සහ කොළඹ කොටස් හුවමාරුව වැනි විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත ආර්ථික ඉලක්ක පවරමින්, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි.

වෙළෙඳ හා ආයෝජන ප්‍රවර්ධනය, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට සහාය වීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් ඵලදායී ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ආර්ථික කටයුතු අංශයේ අරමුණ වේ.

## 2.4.1.1 ආර්ථික කටයුතු (ද්විපාර්ශ්වික)

ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, ණයගැති රටවල් 23 ක් සඳහා ජනාධිපති කාර්යාලයේ පැවැති තානාපතිවරුන්ගේ සංසදය සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ටෝකියෝ සහ මැනිලා සංචාරයන් සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.

ඉන්දියානු රේඛීය ණය පහසුකම, එක්සත් ජනපද සහ චීන ආධාර සහ වෙනත් පරිත්‍යාග ඇතුළුව, ශ්‍රී ලංකා ආර්ථිකයට සහාය වීම සඳහා විදේශ ආධාර (ඉන්ධන, තිරිඟු, සීනි, පොහොර, ඖෂධ, රසායනික ද්‍රව්‍ය, කාර්මික භාණ්ඩ, සිවිල් ගුවන් සේවා සඳහා ආධාර ආදිය) ලබා ගැනීම සඳහා මෙම අංශය මූලික විය. මෙම අංශය ඉන්ධන, අතුරු මූල්‍යකරණය සහ ණය සඳහා යෝජනා සපයා ගැනීමට රජයේ ඇගැයීම් කමිටු සමඟ කටයුතු කළේය. සිංගප්පූරුව, ඉන්දියාව, චීනය සහ තායිලන්තය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් සාකච්ඡා නැවත ආරම්භ කිරීම සඳහා ජාතික වෙළෙඳ සාකච්ඡා කමිටුව සමඟ ද මෙම අංශය කටයුතු කළේය.

අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩල / දූත කාර්යාලවල කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සංචාරක ප්‍රවර්ධනය සඳහා වූ විදේශ සෘජු ආයෝජන (FDI) ප්‍රවර්ධන අංග පහක් සහ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් පහක් සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.වෙළෙඳාම, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන සම්බන්ධ අතථ්‍ය රැස්වීම් සංවිධානය කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ රැස්වීමක් කැඳවා වෙළෙඳ සහ සංචාරක ප්‍රවර්ධනය සඳහා ජාලයක් නිර්මාණය කිරීම සිදු කරන ලදී.

2022 ඔක්තෝබර් 13 වැනි දින ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල හා එක්ව කොළඹදී පවත්වන ලද ජාතික ඩිජිටල් ආයෝජන සමුළුව-2022 ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අංශය පහසුකම් සැපයීය.

2022 ජනවාරි මස පැවති හංගේරියා-ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය සහ ව්‍යාපාර අතර රැස්වීම් සහ ද්විත්ව බදුකරණය වැළැක්වීම, විදේශ රැකියා ප්‍රවර්ධනය, සංචාරක ප්‍රවර්ධනය ආදී ක්ෂේත්‍රවල අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් ගණනාවක කටයුතු අවසන් කිරීම සඳහා අමාත්‍යාංශයේ නීති අංශය සමඟ සාකච්ඡා කර පහසුකම් සපයන ලදී. අදාළ පාර්ශ්වයන් සමඟ සහයෝගයෙන් යුතුව වෙළෙඳ ආරවුල් නවයක් (09) සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

## 2.4.1.2 ආර්ථික කටයුතු (බහුපාර්ශ්වික)

පස්වැනි බිම්ස්ටෙක් සමුළුවට (අථත්‍ය) පෙර 2022 මාර්තු 30 වැනි දින පැවති මූලික බිම්ස්ටෙක් රැස්වීම (දෙමුහුන් ආකෘතියේ) සඳහා ශ්‍රී ලංකාව සත්කාරකත්වය සැපයූ අතර, මෙම සමුළුවේදී බිම්ස්ටෙක් ප්‍රඥප්තිය, සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහය පිළිබඳ බිම්ස්ටෙක් සම්මුතිය, බිම්ස්ටෙක් සාමාජික රටවල රාජ්‍යතාන්ත්‍රික ඇකඩමි/පුහුණු ආයතන අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MoU) සහ ශ්‍රී ලංකාවේ කොළඹ බිම්ස්ටෙක් තාක්‍ෂණ හුවමාරු පහසුකම (TTF) පිහිටුවීම පිළිබඳ සහයෝගිතා ගිවිසුම යනාදියට අත්සන් තබන ලදී.

මීට අමතරව, ප්‍රවාහන සම්බන්ධතාවය පිළිබඳ මහා සැලැස්ම ද නායකයින් විසින් සම්මත කරගත් අතර, ප්‍රතිසංවිධානය කරන ලද සහයෝගීතා අංශ සහ උප අංශ ද අනුමත කළහ.

2022 ජනවාරි 20 වැනි දින කොළඹදී පැවැති සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ බිම්ස්ටෙක් කාර්ය සාධක බලකායේ සිව්වැනි රැස්වීම සහ 2022 අගෝස්තු 15-16 දිනවල මහනුවරදී අතථ්‍ය ලෙස පැවැති "විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වටිනාකම් දාම කළමනාකරණය සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීම පිළිබඳ බිම්ස්ටෙක් වැඩමුළුව, පසු අස්වනු කළමනාකරණය, අගය දාම සංවර්ධනය කිරීම" සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය සපයන ලදී.

මෙම අංශය ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (IORA) කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරමින්, අයෝරා හා සම්බන්ධ රැස්වීම් 46කට සහභාගී වීම හා පහසුකම් සලසා දීම සිදුකොට ඇත. 2021 නොවැම්බර් 15 සිට 17 දක්වා ඩකා හිදී පැවති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීම්වලට පෙරාතුව පැවති 21 වැනි අමාත්‍ය මණ්ඩල කවුන්සිලයේදී ශ්‍රී ලංකාව විසින් වසර දෙකක (2021-2023) කාලසීමාවක් සඳහා උප සභාපති ධුරය භාර ගන්නා ලදී. විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා නියෝජිත පිරිස අයෝරා සංවිධානයේ උප සභාපතිත්වය දරන රට ලෙස 2022 නොවැම්බර් 22 සිට 24 දක්වා ඩකා හි පැවැති 22 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමට (COM) සහ පෙර පැවැති රැස්වීම්වලට සහභාගී විය. ආයතනික විධිවිධාන සහ පුළුල් කිරීමේ කටයුතු පිළිබඳ පර්ෂදයේ (IABE) සම්බන්ධීකාරක රටක් ලෙස, 2022 මාර්තු 2 වැනි දින ශ්‍රී ලංකාව විසින් 2 වැනි ආයතනික විධිවිධාන සහ පුළුල් කිරීමේ කටයුතු පිළිබඳ පර්ෂද කණ්ඩායම් රැස්වීම (අතථ්‍ය) පැවැත්විය.

## 2.4.1.3 තාක්ෂණික සහයෝගීතාව

ආර්ථික කටයුතු අංශයේ "තාක්ෂණික සහයෝගිතා වැඩසටහන" මඟින් ශ්‍රී ලංකාවේ රේඛීය ආයතන සමඟ එක්ව ශ්‍රී ලංකාවට සිය විශේෂඥ දැනුම ලබාදීමට හැකියාව ඇති ක්ෂේත්‍රවල පුහුණු වැඩසටහන් පවත්වමින් සාර්ක් සහ ආසියා සහ අප්‍රිකා කලාපයේ අවම සංවර්ධිත රටවල (LDC) සහභාගිවන්නන්ට තාක්ෂණික සහාය ලබා දේ. ධාරිතා වර්ධනය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හොඳම භාවිතයන් සහ තාක්‍ෂණික ප්‍රවීණත්වය බෙදා හදා ගනිමින් අවම සංවර්ධිත රටවල් සඳහා සහය දැක්වීමට මුලපිරීමේ අදියරක් ලෙස, ශ්‍රී ලංකාව මෙම වැඩසටහන දියත් කළේය.

මේ අතර, ආර්ථික කටයුතු අංශය විසින් පළමු වරට 2022 නොවැම්බර් 13 වැනි දින අමාත්‍යාංශයේ (ශ්‍රී ලංකා විදේශ සේවය, පරිපාලන සේවය සහ ගණකාධිකාරී සේවය) සේවයේ නියුතු නිලධාරීන් සඳහා අන්තර් ක්‍රියාකාරී වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ආයෝජන ආකර්ශනය කර ගැනීම, විදේශයන්හි ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා සඳහා විවිත්‍රවත් වෙළඳපොළවල් ගවේෂණය කිරීම, සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම සහ විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම, දත්ත පිළිබඳ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සහ සමාජ මාධ්‍යවල සුරක්ෂිත භාවිතය, ගෝලීය සහ දේශීය සයිබර් ආරක්ෂණ තර්ජන පිළිබඳ භූ දර්ශනය, තොරතුරු සහ රජයේ සංවිධාන සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳව අවධානය යොමු කෙරිණ.

මෙම අංශය ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාව, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA), කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA), කොළඹ සැලසුම් ලේකම් කාර්යාලය යනාදී ජාත්‍යන්තර සංවිධානවල ශ්‍රී ලංකාවට නිශ්චිත පැවරුම් මත සිටින සේවකයින් සඳහා කෙටිකාලීන ප්‍රවේශ වීසා 190 ක්, දිගුකාලීන ප්‍රවේශ වීසා 51 ක් සහ නේවාසික වීසා 72 ක් සත්‍යාපනය කර නිර්දේශ කර ඇත. මුදල් අමාත්‍යාංශය යටතේ පවතින තිරසාර සංවර්ධන සභාව ඇතුළු රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ පැවති වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වන විදේශිකයින් සඳහා වීසා බලපත්‍ර පහසුකම් සපයන ලදී.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ සීමාසහිත ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් වැනි ආයතනවලින් ලැබුණු ප්‍රසම්පාදන දැන්වීම් 100 කට පහසුකම් සැලසූ අතර, එම නිවේදනවලට ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල වෙබ් අඩවිවල පළකිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දුණි.

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල හරහා ජාත්‍යන්තර සමාගම් සත්‍යාපනයට පහසුකම් සැලසූ අතර, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලැබුණු ජාතික ඛනිජ ප්‍රතිපත්ති කෙටුම්පත් ලේඛනයට ප්‍රතිපෝෂණ/යෝජනා ලබා දෙන ලදී.

## 2.4.2 ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්ත මර්දන අංශය

**එල්.ටී.ටී.ඊ සම්බන්ධ කරුණු:** යුරෝපා සංගමය, ඕස්ට්‍රේලියාව සහ ඇමරිකා එක්සත් ජනපදය තුළ එල්ටීටීඊය අඛණ්ඩව තහනම් කිරීම සම්බන්ධයෙන් මෙම අංශය විසින් තොරතුරු ලබා දී අදාළ දූත මණ්ඩල / දූත කාර්යාල සමඟ සම්බන්ධීකරණය කරන ලදී. යුරෝපා සංගමය සහ ඕස්ට්‍රේලියාව පිළිවෙළින් 2022 ජූලි සහ සැප්තැම්බර් මාසවලදී ඔවුන්ගේ එල්ටීටීඊ ලැයිස්තුගත කිරීම් තවදුරටත් රඳවා තබා ගැනීම නිවේදනය කළේය. 2022 ඔක්තෝබර් මාසයේදී යුරෝපා සංගමය වෙත ඉදිරිපත් කරන ලද දෙවැනි ද්විවාර්ෂික ඉදිරිපත් කිරීම මෙම අංශය විසින් සකස් කරන ලදී. මෙම සමාලෝචනයේ තීරණය 2023 පෙබරවාරි මාසයේදී අපේක්ෂා කෙරේ. ඕස්ට්‍රේලියාවේ නැවත ලැයිස්තුගත කිරීම තවත් වසර 3ක් සඳහා බලපැවැත්වේ. එක්සත් ජනපද සමාලෝචනයේ ප්‍රතිඵලය අපේක්ෂාවෙන් පවතී. මෙම අංශය කැනඩාවේ එල්.ටී.ටී.ඊ ලයිස්තුගත කිරීම් රඳවා තබා ගැනීමට සහාය දැක්වීම සඳහා තොරතුරු ඉදිරිපත් කර ඇත. එක්සත් රාජධානියේ එල්.ටී.ටී.ඊ තහනම් කිරීම සඳහා තහනම් කරන ලද සංවිධාන අභියාචනා කොමිෂන් සභාවට අයදුම්පතක් / අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර, අදාළ රේඛීය ආයතනවල උපදෙස් මත යාවත්කාලීන ලේඛනයක් එක්සත් රාජධානියේ රජයේ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. විනිශ්චය / තීරණය 2023 ජූලි / අගෝස්තු මාසවලදී අපේක්ෂා කෙරේ. කැනේඩියානු බලධාරීන් විසින් ජන සංහාරය පිළිගැනීමට ප්‍රතිරෝධය දැක්වීමේ අරමුණින් යුතුව, මෙම අංශය අමෙරිකානු අංශය හා ඔටාවා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත කරුණු ඉදිරිපත් කළේය. ඉතාලි මහ නගර සභාවන් විසින් ජන සංහාරය පිළිගැනීමට ප්‍රතිරෝධය දැක්වීමේ අරමුණින් යුුතුව, මෙම අංශය යුරෝපා අංශයට කරුණු ඉදිරිපත් කළේය. කටයුතු කළ යුතු රටා සහ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු දින සහ සිදුවීම්වල දී එල්.ටී.ටී.ඊයට සම්බන්ධ සමාජ මාධ්‍ය සහ දේශපාලන ක්‍රියාකාරකම් විදේශයන්හි පවත්වාගෙන යාම මෙම අංශය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව පුළුල් කිරීම:** බුද්ධි තොරතුරු බෙදාගැනීම, ත්‍රස්ත විරෝධී සහයෝගීතාව සහ ආරක්ෂාව / ආරක්ෂක කටයුතු සම්බන්ධ කරුණු පිළිබඳ අවබෝධතා ගිවිසුම් කිහිපයක් එම අංශය විසින් මූලාරම්භ කර ඇත. ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර අවබෝධතා ගිවිසුමට අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය හිමිව තිබේ. අත්සන් තැබීම සඳහා පිලිපීන පාර්ශ්වයෙන් ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පවතී. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කෙරෙමින් පවතී. ඉන්දුනීසියානු පාර්ශ්වයෙන් ප්‍රතිචාරය අපේක්ෂා කෙරේ. එක්සත් ජනපද-ශ්‍රී ලංකා හවුල්කාරිත්ව සංවාදයට මෙම අංශය තොරතුරු ලබා දී ඊට සහභාගී විය. විදේශ කටයුතු අමාත්‍යවරයා සහ CTED හි විධායක අධ්‍යක්ෂ (ජූලි 2022) අතර හමුව සඳහා සහ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සම්බන්ධ රැස්වීම් සඳහා (2022 සැප්තැම්බර්) ද මෙම අංශය විසින් දායකත්වය සපයන ලදී.

**දේශීය ආරක්ෂාව, සුරක්ෂිත භාවය සහ නෛතික ආයතනවල ධාරිතා සංවර්ධනය:** නීතිපති දෙපාර්තමේන්තුවේ, සන්නද්ධ හමුදාවල, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා වෙනත් රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන (උදා: මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය - UNODC) විසින් පිරිනමනු ලබන ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන් ද මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

**ප්‍රචණ්ඩ අන්තවාදී ප්‍රයත්න වැලැක්වීමට/ ප්‍රතිරෝධය දැක්වීමට සහාය වීම**: විදේශයන්හි වෙසෙන සහ ශ්‍රී ලංකාවට වැදගත්වන ත්‍රස්තවාදයට සම්බන්ධ සැකකරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම සහ ශ්‍රී ලංකා රජයේ අදාළ ආයතන සහ විදේශ නියෝජිතායතන අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය අඛණ්ඩව සහාය විය. ශ්‍රී ලංකාව සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම සහ අරමුදල් ඒකාබද්ධ කිරීම සඳහා එහි වේගවත් අරමුදල් යාන්ත්‍රණය යටතේ ගෝලීය ප්‍රජා බැඳීම් සහ ඔරොත්තු දීමේ අරමුදල (GCERF- ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා කැප වූ ගෝලීය අරමුදල) සමඟ රැස්වීම් පැවැත්විණි. තුන්වන අනුග්‍රාහක කණ්ඩායම ශ්‍රී ලංකාව විසින් අනුමත කර ඇත. ප්‍රචණ්ඩ අන්තවාදය වැලැක්වීම සහ මැඩපැවැත්වීම පිළිබඳ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ දකුණු ආසියා ජාලය යටතේ, 2022 මාර්තු මස මාලේ හි දී පැවති SAN-PVE හි ක්‍රමවේද සහ වැඩ සැලැස්ම පිළිබඳ 4 වැනි ඉහළ මට්ටමේ සහ තාක්ෂණික රැස්වීම් සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිස සඳහා මෙම අංශය විදේශ අමාත්‍යාංශය නියෝජනය කළේය. SAN-PVE සඳහා ජාතික සම්බන්ධතා ස්ථානයක් ලෙස, මෙම අංශය මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ ශ්‍රී ලංකා පාර්ශ්වකරුවන් අතර අදාළත්වය සම්බන්ධීකරණය කරන ලද අතර, රැස්වීම්වලට ද සහභාගී විය.

**ත්‍රස්තවාදී මූල්‍යකරණයට එරෙහිව කටයුතු කිරීම:** එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1373 ප්‍රකාශයට පත් කිරීම සඳහා 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයින් සහ ආයතන ලැයිස්තුව සමාලෝචනය කිරීම සඳහා ජාතික බුද්ධි ප්‍රධානියා විසින් කැඳවන ලද නිලධාරීන්ගේ කමිටුවේ නියෝජ්‍ය නීති උපදේශක සමඟ එක්ව, මෙම අංශය විදේශ අමාත්‍යාංශය නියෝජනය කළේය. නව ලැයිස්තුව 2022 අගෝස්තු 1 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

## 2.4.3 සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය

**කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායම (MELAG):** පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තිය (CBC) 2018 අප්‍රේල් මස ලන්ඩනයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුවේදී සම්මත කරන ලදී. මෙම නීල ප්‍රඥප්තිය හරහා, පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් සාගර සම්බන්ධ ගැටලු විසඳීම සහ ජාතික හා ජාත්‍යන්තර බැඳීම් සපුරාලීම සඳහා ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ වේ. පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායම් නීල ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරයි. මෙම අංශය ශ්‍රී ලංකාවේ පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තිය සඳහා කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි. කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායම (MELAG) සඳහා ශ්‍රී ලංකාව පෙරමුණ ගෙන සිටී. මෙම අංශය MELAG සඳහා සම්බන්ධීකරණ කේන්ද්‍රස්ථානය වේ. කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩායම සඳහා ශ්‍රී ලංකාවේ නායකත්වය සහ කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති සාර්ථක මුලපිරීම් ප්‍රදර්ශනය කිරීම සඳහා COP27 ට සමගාමීව පැවති MELAG පාර්ශ්වික අංගයට මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය.

**ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IORA) සමඟ පවතින කැපවීම:** සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ අයෝරා ක්‍රියාකාරී කණ්ඩායම (WGMSS) සඳහා සම්බන්ධීකරණ රට ලෙස ශ්‍රී ලංකාව ශ්‍රී ලංකාවේ කැපවීම් සහ බැඳීම් ඉටු කිරීම සහතික කිරීමට සහ 2027 දක්වා එහි වගකීම අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමට මෙම අංශය විසින් පියවර කිහිපයක් ගෙන ඇත. ඒ අනුව, මෙම අංශය පහත සඳහන් සිදුවීම් සඳහා මූලාරම්භ කිරීම/ සම්බන්ධ වීම සිදුකළේය.

i. 2 වැනි සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ අයෝරා ක්‍රියාකාරී කණ්ඩායමේ වැඩ සැලැස්මේ (2022-2026) දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කිරීමට නියම කර ඇති අදාළ නියෝජිතායතනවල සහභාගීත්වයෙන් යුතුව පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් 3 ක් සංවිධානය කරන ලදී;

ii. තීරණාත්මක යටිතල පහසුකම් ආරක්ෂණය පිළිබඳව කටයුතු කිරීමේදී කලාපීය ප්‍රවේශයක්, සහසම්බන්ධ ප්‍රවේශයක් සංවර්ධනය කිරීම සඳහා කමිටු 2 ක් පිහිටුවන ලදී. මෙහි දෙවැන්න, ඉන්දියානු සාගර කලාපයේ අන්තර්ජාතික අපරාධ වැළැක්වීම සඳහා අයෝරා අවබෝධතා ගිවිසුමක් සකස් කිරීමේ තාර්කිකත්වය පිළිබඳ සංකල්ප සටහනක් සැකසීම සඳහා වේ;

iii. ශ්‍රී ලංකා නාවික හමුදාව දැනට මුහුදු කොල්ලකෑම් විරෝධී නිරූපණ පිළිබඳ පුහුණු වැඩසටහන් සහ 2023 දෙවැනි කාර්තුවේදී සංචාරය, ඇතුළුවීම, සෙවීම සහ අල්ලා ගැනීම (VBSS) පිළිබඳ පුහුණුව සඳහා යෝජනාවක් සම්පාදනය කරමින් සිටී.

iv. සාමජික රටවල නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම පිළිබඳ කලාපීය නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර සංවාදයකට පහසුකම් සැලසීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය 2023 4 වැනි කාර්තුවේදී කලාපීය සමුළුවක් පැවැත්වීමට සහාය වේ.

හවුල් සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු හඳුනාගැනීම මෙන්ම, සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (UNCLOS) රාමුව තුළ මේවා විසඳීම සඳහා පවතින නීතිමය බැඳීම් සහ හැකියාවන් පිළිබඳව කලාපය පුරා අයෝරා සාමාජික රටවල සහ අයෝරා ලේකම් කාර්යාලයේ ධාරිතාවන් ඉහළ නැංවීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් දින තුනක වැඩමුළුවක් සමඟ ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ අයෝරා ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වැනි රැස්වීම සංවිධානය කිරීම සඳහා ජර්මනියේ ජාත්‍යන්තර සාමය සහ නීතිය පිළිබඳ මැක්ස් ප්ලාන්ක් පදනම (MPFPR) සමඟ මෙම අංශය සම්බන්ධීකරණය කරයි. මැක්ස් ප්ලාන්ක් පදනමේ යෝජනාව සඳහා අයෝරා ලේකම් කාර්යාලය අනුමැතිය ලබා දුන්නේය. මෙම අංශය දැනට 2023 මාර්තු 20-24 දක්වා 3 වැනි WGMSS රැස්වීම සංවිධානය කිරීමට කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයට කිසිදු මූල්‍ය වගකීමක් නොමැතිව මැක්ස් ප්ලාන්ක් පදනම මගින් අරමුදල් සපයනු ලැබේ.

**නීල ග්‍රහලෝක අරමුදල - සාගර රට සහයෝගීතා වැඩසටහන (BPF-OCPP) සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම:** එක්සත් රාජධානිය පවුම් මිලියන 500ක නීල ග්‍රහලෝක අරමුදලක් (BPF) පිහිටුවීමට කැපවී සිටී. මෙම නීල ග්‍රහලෝක අරමුදල මඟින් සමුද්‍ර ගැටලු සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ ගෝලීය නායකත්වය ශක්තිමත් කරන අතර, අපගේ ඒකාබද්ධ එක්සත් රාජධානිය-වනුවාටු ප්‍රමුඛ CBC ක්‍රියාකාරී කණ්ඩායම, 'පොදුරාජ්‍ය මණ්ඩලයීය පිරිසිදු සාගර එකමුතුව' (CCOA) හරහා සාගරයට ඇතුලු වන ප්ලාස්ටික් ගැටලුව විසඳීම සඳහා එක්සත් රාජධානියේ පවතින කැපවීම් ශක්තිමත් කරයි. නීල ග්‍රහලෝක අරමුදල - සාගර රට සහයෝගීතා වැඩසටහන විසින් මූලික අවධානය යොමු කරන අංශ 3ක් ඇත: එනම්, සමුද්‍ර ජෛව විවිධත්වය, තිරසාර මුහුදු ආහාර සහ සමුද්‍ර දූෂණයයි. සාගර රට සහයෝගීතා වැඩසටහන යනු නීල ග්‍රහලෝක අරමුදල හරහා අරමුදල් සපයන ව්‍යාපෘති මාලාවකින් එකක් වන අතර, තෝරා ගත් ODA සුදුසුකම්ලත් හවුල්කාර රටවල් සමඟ තාක්ෂණික සහාය හවුල්කාරිත්වයන් හරහා එහි බෙදාහැරීමේ පළමු වසර තුළදී වෙන් කරන ලද මුදල පවුම් මිලියන 5.7 කි. එක්සත් රාජධානියේ පරිසර, ආහාර සහ ග්‍රාමීය කටයුතු දෙපාර්තමේන්තුවේ (Defra) සහ පරිසර, ධීවර හා ජලජීවී වගා විද්‍යා මධ්‍යස්ථානයේ (Cefas) කණ්ඩායමක් 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණ, සාගර රට සහයෝගීතා වැඩසටහන යටතේ එන මූලික අවධානය යොමු කරන ක්ෂේත්‍ර 3 කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ පාර්ශ්වකරුවන් සහ ප්‍රවීණයන් සමඟ මූලික රැස්වීම් මාලාවක් පැවැත්වීය. තවද ජාතික කමිටුවක් පිහිටුවීමට ද එකඟ විය. 30x30 සාගර මුලපිරීමේ පාර්ශ්වකරුවන් සමඟ Defra හි අන්තර්ක්‍රියා සඳහා සූදානම් වීමේදී, මෙම අංශය MPA ද ඇතුළත් සමුද්‍ර අවකාශීය සැලසුම් (MSP) පිළිබඳ ශ්‍රී ලංකා පාර්ශ්වකරුවන් සමඟ අන්තර් ක්‍රියාකාරී සැසියක් ද සංවිධානය කළේය. තවද, මෙම අංශය 2022 ජූලි මාසයේදී තවත් අතථ්‍ය රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලද අතර, එය MSP සහ ශ්‍රී ලංකාවේ EEZ හි MSP සඳහා ඇති අවශ්‍යතාවය පිළිබඳ හවුල් අවබෝධය ගොඩනැගීම සඳහා පොකුරු පහක (5) ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන සමඟ පවත්වන ලදී.

**දේශගුණික සහ සාගර අවදානම් දර්ශකය [CORVI] වේගවත් තක්සේරුව:** මෙය පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත සඳහා අමෙරිකා එක්සත් ජනපදයේ ස්ටිම්සන් මධ්‍යස්ථානය විසින් සපයන ලද තාක්ෂණික සහාය ඇතිව සිදු කරන ලද නියමු ව්‍යාපෘතියකි. මෙම නව තක්සේරුව මඟින් ශ්‍රී ලංකාව අධික ලෙස ඉහළ

යන උෂ්ණත්වයන්ට සහ වෙරළබඩ ගංවතුරට ගොදුරු වීමේ අවදානම සොයා ගනු ලබන අතර, වෙරළබඩ ප්‍රජාවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය ආයෝජන සහ නිර්දේශ හඳුනා ගනී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ නගර සහ පහත්බිම් දේශගුණික තත්ත්වයන්ට ගොදුරු වීමේ අවදානම හුවා දක්වමින් පොදුරාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වීමෙන්, මෙම නියමු ව්‍යාපෘතිය සඳහා සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍ය වලින් පිටත හඳුනා ගනු ලැබූ එකම රට ශ්‍රී ලංකාවයි.

**මුහුදු තෘණ පිළිබඳ ජාත්‍යන්තර දිනය (මාර්තු 1):** මාර්තු 1 වැනි දින "මුහුදු තෘණ පිළිබඳ ජාත්‍යන්තර දිනය" ලෙස නම් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා සභාවේ යෝජනාවක් සම්මත කිරීම සඳහා මෙම අංශය නිල් සම්පත් භාරයේ තාක්ෂණික විශේෂඥතාව ඇතිව BDS-MoE සහ නිව්යෝර්ක් හි නිත්‍ය නියෝජිත සමඟ සම්බන්ධීකරණය කළේය.

**ශ්‍රී ලංකා මුහුදේ විදේශීය යාත්‍රා විසින් සිදු කරන ලද සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ (MSR) පිළිබඳ මාර්ගෝපදේශ සහ රෙගුලාසි සංවර්ධනය කිරීම:** අන්තර් නියෝජිතායතන පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාවලියක් නීති අංශය සමඟ එක්ව කටයුතු කිරීම මෙම ක්‍රියාවලිය 2018 දී ආරම්භ විය. සම්පූර්ණ කරන ලද මාර්ගෝපදේශය අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය සඳහා යවනු ලැබේ. කෙසේ වෙතත්, දැන් එම පාඨයම සාගර සහ ගුවන් යාත්‍රා සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරන විශාල ලේඛනයකට ඇතුළත් කර ඇත. තවද, මෙම අංශය විසින් 2022 දී විදේශීය සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ යාත්‍රා 2ක් සඳහා නිෂ්කාශන ලබා දී ඇත.

**ජාතික සබ්මැරීන් කේබල් ආරක්ෂණ සහ ඔරොත්තු දීමේ රාමුව:** මෙම අංශය විසින්, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ගෝලීය සමුද්‍රීය අපරාධ වැඩසටහන සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ එක්ව පාඨය සකස් කොට ජනාධිපති ලේකම්වරයා වෙත (තාක්ෂණ අමාත්‍යාංශය ඔහුගේ විෂය පථය යටතට පත් වූ බැවින්) 2021 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩලය හරහා ඉදිරිපත් කරන ලදී. 2021 ජූනි මස 21 දිනැති අමාත්‍ය මණ්ඩලයීය තීරණය හරහා, විදුලි සංදේශ නියාමන පනත සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පිහිටුවා, එහි තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් (CII) සුරැකීමේ විධිවිධාන ඇතුළත් සයිබර් ආරක්ෂණ කෙටුම්පත් පනත් කෙටුම්පත අවසන් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත ප්‍රතිපෝෂණ සඳහා යවා ඇති අතර, ඉන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. රාමුවේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2022 ඔක්තෝබර් 28 වැනි දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ මෙම අංශය රැස්වීමක් සඳහා කැඳවන ලදී. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා, ඉදිරි ගමන් මග සඳහා ලෙස වහාම ගත යුතු පහත සඳහන් පියවර නිර්දේශ කළේය:

i. සබ්මැරීන් කේබල් ආරක්ෂා කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීම පිණිස නව ක්‍රියාවලියක් ආරම්භ කිරීම;

ii. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නව නීති සම්පාදනය ආරම්භ කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ලිඛිතව දැන්වීම; සහ

iii. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් නව පනත/ ඉහත සඳහන් පනතට කළ සංශෝධන පිළිබඳ වැඩිදුර පසු විපරම් කිරීම.

## 2.4.4 විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් පිළිබඳ අංශය

විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් සමඟ වැඩි දියුණු කළ සබඳතාවයකට අදාළව අමාත්‍යාංශයේ ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගෙන යමින්, 2021 ඔක්තෝබර් මාසයේ දී විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් පිළිබඳ අංශය පිහිටුවන ලදී. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම, ශ්‍රී ලංකාව සහ එහි එතෙර ජනගහනය යන දෙකටම ප්‍රතිලාභ සැලසෙන පරිදි විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් සමඟ සම්බන්ධ වීමේ තිරසාර මාධ්‍යයන් හඳුනා ගැනීම කෙරෙහි මෙම අංශය අවධානය යොමු කරයි. මෙම කාර්යය සඳහා, අංශය 'ශ්‍රී ලංකාව අමතන්න' වෙබ් ද්වාරය සහ මධ්‍යම දත්ත ගබඩාව පවත්වාගෙන යයි. දූත මණ්ඩල දත්තවලට අනුව, 2022 සැප්තැම්බර් මස වන විට විදේශගත ශ්‍රී ලාංකිකයන් මිලියන 1.5 ක් පමණ සිටිති.

විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ තොරතුරු එක්රැස් කිරීම සඳහා වන 'ශ්‍රී ලංකාව අමතන්න' වෙබ් ද්වාරය, ශ්‍රී ලාංකිකයින්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට සහය වීම සඳහා කොවිඩ්-19 වසංගතය ආරම්භ වීමත් සමඟ ආරම්භ වූ අතර, එතෙර සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් බොහෝ විමසුම් සඳහා කටයුතු කොට තිබුණි. දැනට, මෙම අමාත්‍යාංශය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව වෙබ් ද්වාරය පිළිබඳව පවතින ගැටලු විසඳීමේ ක්‍රියාවලියක යෙදී සිටී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ සංවර්ධකයා සමඟ පැවැත්වූ සාකච්ඡා මාලාවක් මඟින් ද්වාරයෙහි වැඩිදියුණු කළ සහ ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වැඩිදුර වර්ධනයන් හඳුනා ගැනීමට මෙම අංශයට හැකි විය.

මෙම අංශය විසින් විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා මාසිකව විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ඩයස්පෝරාවේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම වසර මුලදී ආරම්භ කරන ලද මධ්‍යගත දත්ත සමුදාය ද මෙම අංශය විසින් අධීක්ෂණය කරයි. ගූගල් ආකෘති පත්‍රයක් (Google Form) හරහා ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල මඟින් විස්තර ඉදිරිපත් කරනු ලබන අතර, 2022 දෙසැම්බර් අවසන් වන විට ඇතුළත් කිරීම් 2872ක් මෙම අංශයට ලැබී තිබුණි. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය , කම්කරු අමාත්‍යාංශය ආදී ශ්‍රී ලංකාවේ බාහිර ආයතන මඟින් කරන ලද දත්ත රැස්කිරීමේ ඉල්ලීම් ද මෙම අංශය විසින් ඉටු කරයි.

අධ්‍යාපන අමාත්‍යාංශය සහ බුද්ධ ශාසන, ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම් මත විදේශගත ශ්‍රී ලාංකිකයින් ප්‍රමුඛ ව්‍යාපාරික, ආගමික හා සංස්කෘතික සංවිධාන පිළිබඳ තොරතුරු මෙම අංශය විසින් සපයන ලදී. අවසාන යාවත්කාලීන කිරීම මෙම වසරේ පෙබරවාරි මාසයේදී සිදු කරන ලද අතර, දැනට විදේශයන්හි එවැනි සංගම් 886 ක දත්ත මෙම අංශය සතුව පවතී. එතෙර සිටින ශ්‍රී ලාංකිකයින් සමඟ වැඩි අන්තර් ක්‍රියාකාරීත්වයක් ප්‍රවර්ධනය කිරීම සඳහා එවැනි දත්ත භාවිතා කළ හැකිය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රාජ්‍ය බුද්ධි සේවය, කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය, ස්විට්සර්ලන්ත සහ ඕස්ට්‍රේලියානු දූත මණ්ඩල ආදිය වැනි අදාළ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, නැවත ඇතුළත් කිරීමේ ගිවිසුම් යටතේ විදේශගත නීතිවිරෝධී/ සරණාගත තත්ත්වයේ සිටින ශ්‍රී ලාංකිකයින් නැවත ඇතුළත් කර ගැනීමට/ නැවත ගෙන්වා ගැනීමට මෙම අංශය විසින් පහසුකම් සලසා ඇත. ශ්‍රී ලාංකික පුරවැසියන් නැවත ඇතුළත් කර ගැනීමට අදාළ කරුණු සාකච්ඡා කිරීම සඳහා මෙම අංශය 2022 ජනවාරි මාසයේදී කොළඹ ස්විට්සර්ලන්ත සහ මාලදිවයිනේ තානාපති කාර්යාලය සමඟ අතථ්‍ය රැස්වීමක් පවත්වන ලදී. ස්විට්සර්ලන්ත, බ්‍රිතාන්‍ය සහ ඕස්ට්‍රේලියානු දූත මණ්ඩල සහ අදාළ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, 2022 පෙබරවාරි සිට අගෝස්තු දක්වා නීතිවිරෝධී ලෙස විදේශගත ශ්‍රී ලාංකිකයින් 79 දෙනෙකු ස්විට්සර්ලන්තයේ සිට, 2022 මැයි සිට අගෝස්තු දක්වා එක්සත් රාජධානියේ සිට 70 දෙනෙකු සහ 2022 අගෝස්තු මාසයේදී ඕස්ට්‍රේලියාවෙන් 46 දෙනෙකු ගෙන්වා ගැනීම සඳහා මෙම අංශය සහාය විය.

විදේශගත ශ්‍රී ලාංකිකයින් සඳහා වන කෙටුම්පත් නිර්වචනය ඇතුලු රැස්වීම්වලට සහභාගී වීම සහ ලේඛන සකස් කිරීම තුළින් විදේශගත ශ්‍රී ලාංකිකයින් සඳහා ලේකම් කාර්යාලය පිහිටුවීමට මෙම අංශය සහාය විය. 2022 අග භාගයේදී, අතිරේක ලේකම් (මැදපෙරදිග, අප්‍රිකාව, කොන්සියුලර් කටයුතු සහ විදේශගත ශ්‍රී ලාංකිකයින්) ගේ උපදෙස් මත, මෙම අංශය රැකියා ප්‍රවර්ධන කටයුතු ආරම්භ කර ඇති අතර, අනාගත විදේශ ආයතන හඳුනාගැනීම සඳහා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත ළඟා වී ඇත. 'සුදුසුකම් සමීකරණයේ' අවශ්‍යතාවය හඳුනා ගනිමින්, දූත මණ්ඩලය අදාළ සුදුසුකම් රාමු සංසන්දනය කිරීමට සහ සංවර්ධනය සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අභ්‍යාසයක් ආරම්භ කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රමිකයින් සඳහා වඩා හොඳ රැකියා ප්‍රමිතීන් සුරක්ෂිත කිරීමේ අරමුණින් යුතුව, මැදපෙරදිග කලාපයේ ඇති කර ගත් කම්කරු කොන්ත්‍රාත්තු සමාලෝචනය කිරීමේ ප්‍රයත්නයන් සඳහා අංශය සහාය විය.

## 2.4.5 ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය රජයේ විදේශ ප්‍රතිපත්තිය මත පදනම්ව ප්‍රතිපත්ති අරමුණු හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ සහ දූත මණ්ඩල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට අදාළ කරුණු සම්බන්ධීකරණය කරමින් ඊට පහසුකම් සපයයි.

**සේවක සංඛ්‍යාව තාර්කිකකරණය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා වන නව ප්‍රවර්ධන යෝජනා ක්‍රමය:** පවතින මූල්‍ය බාධාවන් සහ අමාත්‍යාංශයේ/ දූත මණ්ඩලවල පවතින කාර්ය මණ්ඩල ව්‍යුහය නැවත ඇගයීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, විදේශ කටයුතු ලේකම්ගේ මඟපෙන්වීම යටතේ සහ අනෙකුත් අභ්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් යුතුව, අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව තාර්කිකකරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ කටයුතු මෙම අංශය දිගටම පවත්වාගෙන ගියේය. ඒ අනුව, සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළදී මෙම අංශය මඟින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කමිටු ස්ථාපිත කොට පහසුකම් සපයන ලදී.

i. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල කාර්යයන් සහ මෙහෙයුම් පිළිබඳ විස්තීරණ සමාලෝචනය;

ii. තරඟකාරී තේරීම් ක්‍රියාවලියක් හරහා අමාත්‍යාංශයට අනුයුක්තව සිටින ඇතැම් නිළධාරීන්ට විදේශ දූත මණ්ඩල/තනතුරු වල සේවය කිරීමට ඇති අවස්ථා හඳුනා ගැනීම සහ ප්‍රතිපත්තිමය යෙදවුම් ලබා දීම; සහ

iii. අනෙකුත් සමස්ත ලංකා සේවාවන්ට සමගාමීව III සහ II ශ්‍රේණිවල ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා නව උසස්වීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණිය සහ ව්‍යවස්ථාව:** ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ පුළුල් ලෙස සම්බන්ධ විය. පුරප්පාඩු වූ විශේෂ ශ්‍රේණියේ තනතුරු 17ක් සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගෙන් පිරවීම සඳහා තේරීම් කාරක සභාවෙන් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව නිලධාරීන් 17 දෙනෙකු ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ නව විධිවිධාන සහ විශේෂ ශ්‍රේණියේ තනතුරු ඇතුළත් කිරීම සඳහා 2016 ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ද මෙම අංශය තේරීම් කාරක සභාව සමඟ සම්බන්ධීකරණය කළේය.

**අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම (2022):** මුදල් වර්ෂය අවසානයේ දී අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධනය තක්සේරු කිරීමේ අරමුණින් යුතුව, සමාලෝචිත කාල සීමාව තුළදී අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ එක්ව අමාත්‍යාංශය (2022) සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

**දූත මණ්ඩල නාමාවලිය (2021/2022):** දූත මණ්ඩල නාමාවලිය 2021/2022 සම්පාදනය කර, ප්‍රකාශයට පත් කර, අමාත්‍යාංශයේ අංශ, විදේශ දූත මණ්ඩල/ දූත කාර්යාල සහ අනෙකුත් රාජ්‍ය ආයතන අතර බෙදා හරින ලදී.

**ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති රාමුව:** විදේශ ලේකම්ගේ සෘජු විෂය පථය යටතේ, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා පිහිටුවා ඇති කමිටුවේ රැස්වීම් සම්බන්ධීකරණය සහ පහසුකම් සලසා දීම මෙම අංශය විසින් සිදු කරන ලදී.

**විභාග:** 2022 ජූනි 19 වැනි දින විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ශ්‍රී ලංකා විදේශ සේවා ප්‍රවේශ විභාගයේ I කොටස සඳහා පහසුකම් සපයන ලද අතර, විභාග දෙපාර්තමේන්තුව ඇතුලු අදාළ රජයේ බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එම විභාගයේ II කොටස 2023 ජනවාරි මාසයේදී පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා වන තරග විභාගය පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය -2020 (2022), 2022 පෙබරවාරි 3 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. 2020 (2022) රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පෞද්ගලික සහකාර සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා වන තරග විභාගය සඳහා වන ගැසට් නිවේදනය අවසන් කිරීමට ගන්නා ලදී.

**වෘත්තීය සංවර්ධන වැඩසටහන්:** සලකා බලනු ලබන කාල සීමාව තුළදී මෙම අංශය මඟින් අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, විදේශ

පුහුණු වැඩසටහන් 45ක් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කරන ලදී. මෙම අංශය විසින් අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 9ක් අමාත්‍යාංශයේදී සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේදී පවත්වන ලදී. මෙම අංශය විසින් 2022 ජනවාරි මාසයේදී බංග්ලාදේශ විදේශ සේවා නිලධාරීන් පිරිසක් සඳහා පුහුණු වැඩසටහනක් ද 2022 සැප්තැම්බර් මාසයේදී පාකිස්ථාන ආරක්ෂක සේවා නිලධාරීන් පිරිසක් සඳහා පුහුණු වැඩසටහනක් ද සංවිධානය කරන ලද ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ සේවා අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද පැය 200 ක දෙමළ භාෂා පුහුණු වැඩසටහනක් සූදානම් කොට පහසුකම් සළසන ලදී. මෙම අංශය විසින් 2022 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් තිස්පස් දෙනෙකු සඳහා රාජ්‍යතාන්ත්‍රික භාවිතය පිළිබඳව දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී. 2022 දෙසැම්බර් මාසයේදී මෙම අංශය විසින් රටවල් 14ක් සඳහා අලුතින් පත් කරන ලද දූත මණ්ඩල/ දූත කාර්යාල ප්‍රධානීන් 15 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

## 2.4.6 මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය

මෙහෙයුම් අංශයක් වන මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය, විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රක්ෂේපණය කිරීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා රජය සහ බාහිර ආයතන අතර අතුරු මුහුණත වේ. මෙම අංශය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතාවලට අදාළව අමාත්‍යාංශයේ සහ පොදුවේ රට තුළ සිදුවන සිදුවීම්/ තත්වයන් ආවරණය කරයි. මෙම අංශය විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල අතර සිදුවීම් සහ ප්‍රවණතා පිළිබඳ තොරතුරු ද බෙදා හරිනු ලැබේ.

විදේශ කටයුතු අමාත්‍යතුමා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා, විදේශ ලේකම් සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල ඇතුළු අමාත්‍යාංශයේ සියලුම මාධ්‍ය සහ මහජන සන්නිවේදන කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. විදේශ ප්‍රතිපත්ති ඉදිරි දර්ශනයක් සහිත ශ්‍රී ලංකා රජයේ වැදගත් රැස්වීම්, සිදුවීම්, විස්තර කිරීම්, ප්‍රතිපත්තිමය තීරණ සහ ස්ථාවරයන් මෙයට ඇතුළත් වේ. මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය සති අන්ත සහ නිවාඩු දින ඇතුළු ව දවසේ පැය විසිහතර පුරාම ක්‍රියාත්මක වන අතර, එමගින් අමාත්‍යාංශයේ/ දූත මණ්ඩලයේ මාධ්‍ය නිවේදන යෝග්‍ය ආවරණය සඳහා නියමිත වේලාවට මාධ්‍ය වෙත මුදා හැරේ.

මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් දේශීය/විදේශීය මාධ්‍ය සහ අන්තර්ජාල ප්‍රවෘත්තිවල අමාත්‍යාංශය/ ශ්‍රී ලංකාව සම්බන්ධ වැදගත් ප්‍රවෘත්ති නිරීක්ෂණය කරනු ලබන අතර, විදේශ කටයුතු අමාත්‍යතුමා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා, විදේශ කටයුතු ලේකම්, අමාත්‍යාංශයේ නිලධාරීන් සහ සියලුම දූත මණ්ඩල/ දූත කාර්යාල දැනුම්වත් කර තබයි. අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානියක් වන ප්‍රවෘත්ති පිළිබඳ දිනපතා යාවත්කාලීන කිරීම් විදේශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී ප්‍රතික්ෂේප කිරීම් නිකුත් කරනු ලැබේ.

සමාලෝචිත කාලසීමාව තුළ දී අමාත්‍යාංශයේ මාධ්‍ය නිවේදන 265ක්, ප්‍රකාශ 14ක් සහ දූත මණ්ඩල ප්‍රවෘත්ති 421ක් සහ නිවේදන 116ක් කොළඹ පිහිටි දේශීය මුද්‍රිත හා අන්තර්ජාල මාධ්‍ය සහ විදේශ වාර්තාකරුවන් වෙත බෙදා හැර ඇති අතර, රූපවාහිනිය සහ ගුවන් විදුලිය මගින් නිරතුරුව විකාශනය කර ඇත.

ට්විටර් (ට්වීට්-514), ෆේස්බුක් (පළ කිරීම්-206), යූ ටියුබ් (මුදාහැරීම්-5) සහ ඉන්ස්ටග්‍රෑම් (පළ කිරීම්-200) හරහා මහජන සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය දිනපතා සමාජ මාධ්‍යන් හා සහ සම්බන්ධ වේ. ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත ඵලදායී ලෙස තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකාවල නිරත වීමට සියලුම දූත මණ්ඩල/දූත කාර්යාල බොහෝ විට දිරිමත් කරනු ලැබේ. අදාළ වන පරිදි අමාත්‍යාංශ ට්වීට්/ පළ කිරීම් නැවත ට්වීට් කිරීමට/ නැවත පළ කිරීමට දූත මණ්ඩල/ දූත කාර්යාල දිරිමත් කරනු ලැබේ.

මෙම අංශය ශ්‍රී ලංකාවේ විදේශීය මාධ්‍ය ආවරණය/රූගත කිරීම් සඳහා ද පහසුකම් සපයයි. කොවිඩ්-19 ගෝලීය වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් සමාලෝචනයට භාජනය වූ කාල සීමාව පසුබෑමකට ලක්ව තිබුණද, මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් චිත්‍රපට කණ්ඩායම් නවයකගේ සංචාරයන් සඳහා පහසුකම් සලසා ඇත. මෙම අංශය විදේශ මාධ්‍ය කාර්ය මණ්ඩල සහ මාධ්‍යවේදීන්ගේ පහත ආකාරයේ බොහෝ සංචාර සම්බන්ධීකරණය කළේය:

i. හංගේරියාවේ විදේශ කටයුතු සහ වෙළෙඳ අමාත්‍ය (MFAT) පීටර් සිජ්ජාර්ටෝ මහතා 2022 ජනවාරි 12 වැනි දින;

ii. කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායක බියෙඕංග් සෙවුග් මහතා 2022 ජනවාරි 19 වැනි දින;

iii. තුර්කි ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය මෙවුලොට් කැවුසොග්ලු මහතා 2022 ජනවාරි 28 වැනි දින;

iv. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දේශපාලන කටයුතු පිළිබඳ උප ලේකම් වික්ටෝරියා නුලන්ඩ් මහත්මිය 2022 මාර්තු 22-23 දිනවල; සහ

v. ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2022 මාර්තු 28-30 දිනවල.

2022 ජනවාරි මාසයේදී, මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් වන් වර්ල්ඩ් මීඩියා (One World Media) හි කණ්ඩායමක් සඳහා පහසුකම් සැලසූ අතර, එම කණ්ඩායම විසින් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉල්ලා සිටි පරිදි, සෑම අංශයකම පවතින ව්‍යාපාරික සහ ආයෝජන අවස්ථා ඉස්මතු කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ යූඑස්ඒ ටුඩේ (USA Today) සඟරාවෙහි වාර්තාවක් පළ කිරීම සඳහා අමාත්‍යවරුන්/පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය නිලධාරීන්, කර්මාන්ත සහ ආයතනික ප්‍රධානීන් සමඟ සම්මුඛ සාකච්ඡා මාලාවක් සැලසුම් කර සම්බන්ධීකරණය කරන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලය, මෙම අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් යුතුව 2022 මාර්තු 28-30 දිනවල දී බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වූ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (BIMSTEC) 5 වැනි සමුළුවට සත්කාරකත්වය සපයන ලදී. මෙම අංශය දින තුනේම සමුළුව මෙන්ම ප්‍රභූවරුන් සමඟ පැවති තනි තනි රැස්වීම් ආවරණය කිරීම පිණිස විදේශීය සහ දේශීය මාධ්‍ය කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

2022 දෙසැම්බර් මස වන විට, මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් ප්‍රධාන සංචාර 5 ක් සහ කෙටි සාකච්ඡා 9 ක් ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සිටින දේශීය හා විදේශීය මාධ්‍ය සමඟ සම්බන්ධීකරණය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ විදේශ මාධ්‍යවේදීන් සඳහා නේවාසික වීසා 10 ක් දීර්ඝ කිරීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. 2022 දෙසැම්බර් මාසය දක්වා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය පිළිගැනීම් 247ක් නිකුත් කර ඇත.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය සහ වෙනස් වන ආර්ථික තත්ත්වය වැනි හදිසි අවස්ථාවල දී වෙළෙඳ, ආයෝජන ප්‍රවර්ධන, සංචාරක ප්‍රවර්ධනයට අදාළ ප්‍රාදේශීය අමාත්‍යාංශ/ ආයතනවලට අදාළ ප්‍රධාන සංවර්ධන පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශ සහ දෛනික යාවත්කාලීන කිරීම් පිළිබඳ තොරතුරු මෙම අංශය විසින් ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත ක්‍රියාකාරීව සපයයි.

මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය උපාය මාර්ගික සන්නිවේදන ඒකකයේ කටයුතු ද සම්බන්ධීකරණය කර ඇත. මේ සම්බන්ධයෙන්, වැදගත් සහ කාලීන කරුණු පිළිබඳව අමාත්‍යාංශයේ ආඛ්‍යානය ප්‍රචාරය කිරීම සඳහා අංශය ප්‍රමුඛ ස්වාධීන මාධ්‍ය සමඟ සම්බන්ධ විය. තවද, මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව උපාය මාර්ගික සන්නිවේදන ඒකකයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

## 2.4.7 සාර්ක් අංශය

සාර්ක් අංශය විසින් සාර්ක් ලේකම් කාර්යාලය, එහි ප්‍රාදේශීය මධ්‍යස්ථාන පහ (5), විශේෂිත ආයතන සහ අග්‍රස්ථ ආයතන විසින් මෙහෙයවනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරයි. මෙම අංශය අවශ්‍ය අවස්ථාවලදී සහ කොළඹ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ පරිපාලන හා ක්‍රියාකාරී කටයුතු සඳහා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වේ. තවද, මෙම අංශය රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව සාර්ක් වීසා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය (SVES) යටතේ වීසා නිකුත් කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කරයි.

**සාර්ක් වීසා - 2022 දෙසැම්බර් 31 දින වන විට සාර්ක් වීසා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද සාර්ක් වීසා ගණන:**

**අ කාණ්ඩය -** 93 (පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්: 43 (යැපෙන්නන්-33) / අනෙකුත් නිලධාරීන්: 16 (යැපෙන්නන් -01)

**ආ කාණ්ඩය -** නැත

**සාර්ක් මහලේකම් කාර්යාලයට ශ්‍රී ලංකා සම්බන්ධීකරණ නිලධාරියා බඳවා ගැනීම:** බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේ සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කළ එස්.එම්. කපිල බණ්ඩාර මහතා ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ නිලධාරියා ලෙස පත් කොට, 2022 ජනවාරි 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සාර්ක් මහලේකම් කාර්යාලයේ වැඩ භාරගත් අතර, මෙම අංශය විසින් බණ්ඩාර මහතා බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයන ලදී.

**සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය (SCC):** 2022 අගෝස්තු 25 වැනි දින මෙම වසරේ පැවැත්වීමට නියමිත ක්‍රියාකාරකම්/ වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මහත්මිය සමඟ කොළඹදී රැස්වීමක් පවත්වන ලදී. මාතර, නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා අර්ධ වශයෙන් ඉදිකරන ලද ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් අදාළ නිලධාරීන් සහ සාර්ක් අධ්‍යක්ෂ ජනරාල් සමඟ 2022 ඔක්තෝබර් 06 වැනි දින රැස්වීමක් පවත්වන ලදී.

**සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය (SAC):** අධ්‍යාපන අමාත්‍යාංශයේ විදේශ අධ්‍යාපන අධ්‍යක්ෂ ත්‍රිෂාන්ති මීගහපොළ මහත්මිය සමඟ 2022 සැප්තැම්බර් 21 වැනි දින සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය (SAC) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA-UoP) අතර ඇති වූ ගිවිසුමේ යාවත්කාලීන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් පවත්වන ලද අතර, මෙම අංශය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒ පිළිබඳ පසුවිපරම් කරමින් සිටී. සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශේෂඥ (බෝග) තනතුර සඳහා වන පුරප්පාඩු පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම මෙම අංශය විසින් සිදු කරන ලද අතර, ශ්‍රී ලංකා නිලධාරීන්ගෙන් අයදුම්පත් දෙකක් සම්ප්‍රේෂණය කරන ලදී. ඩකාහි සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කෘෂිකර්ම ආයතනය (PGIA-UoP) අතර සංශෝධිත අවබෝධතා ගිවිසුම, මාර්ගය වෙනස් කිරීමේ මාදිලිය සමඟ එකඟතාව/ නිරීක්ෂණ සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යවා ඇත. සාර්ක් මහලේකම් කාර්යාලයේ ඉල්ලීම මත, ‘‘සාර්ක් කෘෂිකර්ම දැක්ම’’ නම් වූ මෙහෙයුම් කෙටුම්පත් උපාය මාර්ගික රාමුවට එකඟතාව/ දැක්ම/ අදහස් ඉල්ලා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලිපියක් 2022 දෙසැම්බර් 5 වැනි දින යවා ඇත.

**සාර්ක් බලශක්ති මධ්‍යස්ථානය (SEC):** පහත දැක්වෙන අවබෝධතා ගිවිසුම් (MoU)/ ගිවිසුම් පිළිබඳ එකඟතාව ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය (විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) සමඟ සම්බන්ධීකරණය කර ඇත.

i. සාර්ක් කලාපයේ බලශක්ති වෙළෙඳාමේ නියැලී සිටින ආයතන මිලදී ගැනීම සහ විකිණීම සඳහා සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් ආකෘතියක් සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයනය සඳහා කෙටුම්පත් යොමුකිරීමේ අනුදේශ (ToR) සැකසීම. මෙම යොමුකිරීමේ අනුදේශ කෙටුම්පත සඳහා 2022 මාර්තු 03 වැනි දින ශ්‍රී ලංකා රජය සිය එකඟතාව ලබා දී ඇත.

ii. සාර්ක් සහ ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනය (IRENA) අතර යෝජිත අවබෝධතා ගිවිසුම 2022 දෙසැම්බර් 15 වැනි දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.

පහත සඳහන් මාර්ගගත/භෞතික වැඩසටහන් සඳහා සහභාගී වීමට පහසුකම් සලසා ඇත:

i. 2022 මැයි 17-26 දිනවල පැවැති ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සංවිධානය කරන ලද සාර්ක් රටවල් අතර දේශසීමා හරහා විදුලිබලය විකිණීම සහ සහ විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම (PPA) පිළිබඳ මාර්ගගත පුහුණුව.

ii. සාර්ක් මහලේකම් කාර්යාලයේ ඉල්ලීම මත, දකුණු ආසියාවේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් අන්තර් සම්බන්ධ කිරීම සඳහා වන තාක්ෂණික ප්‍රමිති සමීකරණය පිළිබඳ අධ්‍යයනයේ කෙටුම්පත් නියමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ එකඟතාව සාක් ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇත.

**සාර්ක් ක්ෂය රෝග සහ එච්අයිවී/ඒඩ්ස් මධ්‍යස්ථානය (STAC):** සාර්ක් ක්ෂය රෝග සහ එච්අයිවී/ඒඩ්ස් මධ්‍යස්ථානයේ (STAC) වසංගත රෝග විද්‍යාඥ සහ තාක්ෂණ නිලධාරී (එච්අයිවී/ඒඩ්ස්) තනතුරු සඳහා වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධ තොරතුරු බෙදා හැර ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය වයි.එල්. සුමල් නන්දසේන මහතා ශ්‍රී ලංකාවෙන් මෙම තනතුර සඳහා ඉල්ලුම් කර ඇත.

**සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (SDMC):** පහත සඳහන් මාර්ගගත/භෞතික වැඩසටහන් සඳහා සහභාගී වීමට පහසුකම් සලසන ලදී:

i. "වෙනස්වන පරිසරයක දේශගුණික අවදානම් කළමනාකරණය" පිළිබඳ වෙබිනාර් වැඩසටහන - 2022 මාර්තු 15 වැනි දින;

ii. "පෘථිවි නිරීක්ෂණ දත්ත භාවිතා කරමින් නියඟ අවදානම් තක්සේරු කිරීම" සහ දකුණු ආසියානු නියඟ කළමනාකරණ පද්ධතිය (SADMS) දියත් කිරීම පිළිබඳ නේවාසික කලාපීය වැඩමුළුව - 2022 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 2 දක්වා ඉන්දියාවේ SDMC (IU) හිදී; සහ

iii. "නාගරික ඔරොත්තු දීමේ හැකියාව සහ නගරවලට ඔරොත්තු දීමේ හැකියාව ඇතිකිරීම පිළිබඳ නේවාසික වැඩමුළුව" - දෙසැම්බර් 5-8 දක්වා ඉන්දියාවේ ගාන්ධිනගර් හි සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී. (මෙම වැඩමුළුව සඳහා රේඛීය අමාත්‍යාංශයේ (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ) නිලධාරීන් දෙදෙනෙකු සහභාගී විය.)

ස්වභාවික විපත් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සාර්ක් ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය සම්බන්ධ විස්තර අදාළ රේඛීය අමාත්‍යාංශය (ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය) සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව යාවත්කාලීන කර ඇත.

**දකුණු ආසියානු විශ්වවිද්‍යාලය (SAU):** දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ නිත්‍ය සභාපතිවරයා පත් කිරීමේ ක්‍රියාවලිය සඳහා රේඛීය නියෝජිතායතනය (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) සමඟ සම්බන්ධීකරණයෙන් රජයේ එකඟතාව 2022 ජූලි 12 වැනි දින ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාව තුළ දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් පිහිටුවීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2022 සැප්තැම්බර් 21 වැනි දින අධ්‍යාපන අමාත්‍යාංශයේ විදේශ අධ්‍යාපන පිළිබඳ අධ්‍යක්ෂ ක්‍රිෂාන්ති මීගහපොල මහත්මිය සමඟ රැස්වීමක් පවත්වන ලදී. සාර්ක් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාරණය සම්බන්ධයෙන් මූලික යෝජනාවක් ඉල්ලා සිටි අතර, එය දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අදාළ රේඛීය ආයතන සමඟ සහයෝගයෙන් යුතුව සකස් කරන ලදී. මෙම අංශය මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පසුවිපරම් කරයි. ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු හිඟ මුදල් නිෂ්කාශනය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරසිංහ මහතා සහ අදාළ නිලධාරීන් සමඟ රැස්වීමක් 2022 දෙසැම්බර් 28 වැනි දින පැවැත්විණි.

**දකුණු ආසියානු කලාපීය ප්‍රමිති සංවිධානය (SARSO):** දකුණු ආසියානු කලාපීය ප්‍රමිති සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ආචාර්ය ෂාසාඩ් අෆ්සාල් පත් කිරීම සඳහා රේඛීය නියෝජිතායතනය (ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය) සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ එකඟතාව ලබා ගන්නා ලදී. 2022 ඔක්තෝබර් 11-12 දිනවල නේපාලයේ කත්මන්ඩු හි පැවති ගුණාත්මක යටිතල පහසුකම් පිළිබඳ සාර්ක්-පීටීබී සහයෝගිතාවෙහි අවසන් වැඩමුළුවට සහභාගීත්වය සඳහා පහසුකම් සපයන ලදී

**සාර්ක් සංවර්ධන අරමුදල (SDF):** බංග්ලාදේශයේ ඩකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සාර්ක් සංවර්ධන අරමුදල විසින් අරමුදල් සපයන ලද ශිෂ්‍යත්ව සහ පුනරුත්ථාපන විද්‍යාව පිළිබඳ විද්‍යාපති වැඩසටහනේ හය වැනි කණ්ඩායම සඳහා ඇතුළත් වීම පිළිබඳ අදාළ රේඛීය නියෝජිතායතනය (සෞඛ්‍ය අමාත්‍යාංශය) සමඟ තොරතුරු 2022 සැප්තැම්බර් 23 වැනි දින බෙදා හරින ලදී. සාර්ක් කලාපයේ ජාත්‍යන්තර සිසුන් සඳහා ශිෂ්‍යත්ව පහළොවක් (15) පවතින බව දන්වා ඇත.

## 2.4.8 එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික සබඳතා සන්දර්භය තුළ, නිව්යෝර්ක් සහ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය දූත මණ්ඩල සහ වියානා, පැරිස්, රෝමය, නයිරෝබි, බැංකොක් සහ හේග් හි එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන සඳහා අක්තගන්වන ලද තානාපති කාර්යාල/ නිත්‍ය නියෝජිත කණ්ඩායම් මෙම අංශයේ විෂය පථයට අයත් වේ.

**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වැනි සැසිවාරය (UNGA), නිව්යෝර්ක්, 2022 සැප්තැම්බර්:** 2022 සැප්තැම්බර් මාසයේදී විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිසට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වැනි සැසිවාරයේ ඉහළ පෙළේ අංශයට සහභාගී වීම සඳහා අමාත්‍යාංශය විසින් පහසුකම් සහ සැපයුම් කටයුතු සිදු කරන ලදී. විදේශ කටයුතු අමාත්‍යවරයා 2022 සැප්තැම්බර් 24 වැනි දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ඉහළ මට්ටමේ සැසිවාරය ඇමතූ අතර, 2022 සැප්තැම්බර් 21 වන දින 77 වැනි එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සමගාමීව පවත්වන ලද ජාතික හෝ වාර්ගික, ආගමික සහ භාෂාමය සුළුතරයන්ට අයත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය සම්මත කිරීමේ සංවත්සරයේ 30 වැනි සැමරුම සනිටුහන් කිරීමේ ඉහළ පෙළේ රැස්වීමට සහභාගී වී ප්‍රකාශයක් ද කළේය.

විදේශ කටයුතු අමාත්‍යවරයා 77 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සමුළුවට සමගාමීව පැවැති ගෝලීය සංවර්ධන මුලපිරීම පිළිබඳ මිතුරන්ගේ කණ්ඩායමේ අමාත්‍ය රැස්වීම, නොබැඳි ජාතීන්ගේ (NAM) අමාත්‍ය රැස්වීම, සමුළුවේ විදේශ අමාත්‍යවරුන්ගේ නිල නොවන රැස්වීම ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර (CICA) සහ 77 කණ්ඩායමේ සාමාජික රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 46 වැනි වාර්ෂික රැස්වීම ඇතුළු අනෙකුත් ඉහළ පෙළේ රැස්වීම්වලට සහභාගී වී ප්‍රකාශ නිකුත් කළේය.

විදේශ කටයුතු අමාත්‍යවරයා එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා, ත්‍රස්තවාදය වැළැක්වීමේ එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය මහලේකම්වරයා, දේශපාලන සහ සාමය ගොඩනැඟීමේ කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය මහලේකම්වරයා සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහකාර මහ ලේකම්වරයා හමුවිය. එක්සත් ජනපද රාජ්‍ය නායකයා විසින් 77 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සැසිවාරයට සහභාගි වන නියෝජිත කණ්ඩායම් ප්‍රධානීන් වෙත පිරිනැමූ පිළිගැනීමේ උත්සවයේදී අමාත්‍යවරයා අමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ජෝ බයිඩන් මහතා ද හමුවූ අතර, එහිදී ඔහු අමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා ද හමු විය.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ඉහළ පෙළේ සැසිවාරයට සමගාමීව අමාත්‍යවරයා එක්සත් රාජධානිය, සෞදි අරාබිය, උස්බෙකිස්තානය, ආර්මේනියාව, සෝමාලියාව, ගැම්බියාව, නැමීබියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, චීනය, කුවේට්, පාකිස්ථානය, ඉරානය, ඉරාකය සහ සුඩානය යන රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන් සමඟ ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීය. අමාත්‍යවරයා ඇමරිකා එක්සත් ජනපදයේ දේශපාලන කටයුතු පිළිබඳ උප රාජ්‍ය ලේකම්වරයා, USAID සංවිධානයේ නියෝජ්‍ය පරිපාලකවරයා සහ නේපාල විදේශ ලේකම්වරයා ද හමුවිය. අමාත්‍යවරයා ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩල පරිශ්‍රයේ පැවති ත්‍රිවිධ රාජ්‍ය ප්‍රදේශයේ ශ්‍රී ලාංකික ප්‍රජාවගේ නියෝජිත රැස්වීමක් ද අමතමින් අදහස් දැක්වීය.

**ප්‍රතිසන්ධානය සහ මානව හිමිකම්: එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ජිනීවා (49, 50 සහ 51 වැනි සැසිවාර):** මෙම අංශය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවේ ස්ථාවරය සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සියලුම සාමාජිකයින් සහ සියලුම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්වල නිලධාරීන්, අමාත්‍යවරුන් සහ රාජ්‍ය නායක මට්ටමින් සහයෝගය ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ අඛණ්ඩ නියැලීම සම්බන්ධීකරණය කළේය. 2021 මාර්තු (49 වැනි සැසිවාරය) සහ ජූනි (50 වැනි සැසිවාරය) සහ සැප්තැම්බර් (51 වැනි සැසිවාරය) යන මාසවල ජිනීවාහි දී පැවැති මානව හිමිකම් කවුන්සිලයේ නිත්‍ය සැසිවාරයේදී ශ්‍රී ලංකාවේ ස්ථාවරය සම්බන්ධීකරණය ද මෙම අංශය විසින් සිදු කරන ලදී. මානව හිමිකම් කවුන්සිලයේ 49 වැනි සහ 51 වැනි සැසිවාරවල දී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ වාර්තාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ ඇයගේ ලිඛිත යාවත්කාලීන සහ සවිස්තර වාර්තාව පිළිවෙළින් මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ අවස්ථාවේදී, විදේශ අමාත්‍යවරයා අදාළ රට ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශය කළේය. 2022 ජූනි මස මානව හිමිකම් කවුන්සිලයේ 50 වැනි සැසිවාරයට අමාත්‍යවරයා විශේෂ ප්‍රකාශයක් සිදු කළේය. මානව හිමිකම් කවුන්සිලයේ මාර්තු, ජූනි සහ සැප්තැම්බර් සැසිවාරවලදී ශ්‍රී ලංකාව මැදිහත්වීම් ගණනාවක් සිදු කළ අතර, ඒකාබද්ධ ප්‍රකාශ 23 ක් සහ යෝජනා 12 ක් සඳහා සම අනුග්‍රහය දැක්විය. විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අධිකරණ අමාත්‍යවරයාගේ සම ප්‍රධානත්වයෙන් මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ සම්බන්ධීකරණ ක්‍රියාවලියක් අඛණ්ඩව සිදු කරන ලදී. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP), වන්දි ගෙවීමේ කාර්යාලය (OR), ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය (ONUR), ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) සහ තිරසාර සංවර්ධන කවුන්සිලය (SDC) ඇතුළු දේශීය ආයතනවල සහභාගීත්වයෙන් යුතුව, විදේශ අමාත්‍යාංශයේ දී ඒකාබද්ධ රැස්වීම් 3 ක් මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. 2022 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී, මානව හිමිකම් කවුන්සිලයේ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පිහිටුවන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ රැස්වීම් දෙකක් අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

**ගිවිසුම් ආයතන සහ එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි විධාන දරන්නන්:** ප්‍රධාන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ගිවිසුම් 9 යටතේ එහි පවතින වාර්තා කිරීමේ වගකීම් ශ්‍රී ලංකාව විසින් අඛණ්ඩව ඉටු කරනු ඇත. 2022 අප්‍රේල් මාසයේදී, රේඛීය අමාත්‍යාංශ 21ක සහභාගීත්වයෙන් යුතුව විශ්ව කාලාන්තර සමාලෝචනයේ (UPR) 4 වැනි චක්‍රය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාව කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ උපදේශන කැඳවන ලදී.

**විශ්ව කාලාන්තර සමාලෝචනයේ (UPR) 4 වැනි චක්‍රය:** විශ්ව කාලාන්තර සමාලෝචනයේ 4 වැනි චක්‍රය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාව ශ්‍රී ලංකා රජය විසින් 2022 දෙසැම්බර් 22 දින ඉදිරිපත් කරන ලදී. මෙම ජාතික වාර්තාව සකස් කිරීමේ ක්‍රියාවලියේදී අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය සහ උපදේශන පැවැත්වීම මෙම අංශය විසින් සිදු කරන ලදී. 2022 නොවැම්බර් මාසයේදී සිවිල් සමාජ උපදේශන දෙකක් සම්බන්ධීකරණය කරන ලදී. පළමු සිවිල් සමාජ උපදේශනය සිවිල් සමාජ නියෝජිතයින් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව කොළඹදී පැවැත්වුණු අතර, දෙවැනි උපදේශනය සිවිල් සමාජ නියෝජිතයින් 35 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව උතුරු පළාතේ දී පැවැත්විණි. මෙම උපදේශන දෙකම දෙමුහුන් ආකෘතියෙන් පැවැත්වුණු අතර, සිවිල් සමාජයෙන් ලැබුණු දායකත්වය ඵලදායී විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස් විමසනු ලැබ, ස්වාධීන ආයතනයක් ලෙස එහි දායකත්වය ද ලබා දෙන ලදී.

**ශ්‍රී ලංකාවේ කාලාන්තර වාර්තා ඉදිරිපත් කිරීම:** 2019 අප්‍රේල් 2-12 දිනවල පැවති එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ අනුකමිටුවේ (SPT) සංචාරයෙන් පසුව, එම වාර්තාව පිළිබඳ සිය ප්‍රතිචාරය ශ්‍රී ලංකා රජය විසින් 2022 දෙසැම්බර් 2 වැනි දින ඉදිරිපත් කරන ලදී. OPCAT හි 16 වැනි වගන්තියට අනුව, එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ අනුකමිටුවේ වාර්තාව මෙන්ම රජය විසින් එවන ලද ප්‍රතිචාරය රහසිගතව තබා ගන්නා ලෙස රජය ඉල්ලා සිටියේය. 2023 ඔක්තෝබර් දක්වා කල් දැමූ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) යටතේ ශ්‍රී ලංකාවේ 6 වන කාලාන්තර වාර්තාව සමාලෝචනයට අදාළ ගැටළු ලැයිස්තුව සඳහා සිය ප්‍රතිචාරය, ශ්‍රී ලංකාව 2022 මැයි 6 වැනි දින ඉදිරිපත් කළේය. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) යටතේ සිය 9 වැනි වාර වාර්තාව ශ්‍රී ලංකාව විසින් 2022 අප්‍රේල් 22 වැනි දින ඉදිරිපත් කරන ලදී.

**නිරායුධකරණය:** යුරෝපයේ යුදගැටුම් ආරම්භ වීමෙන් පසු, සන්නද්ධ වීම කෙරෙහි අවධානය යොමු කර ඇති මෙම කාල සීමාව තුළදී, ශ්‍රී ලංකාව හු දේශපාලනික වර්ධනයන්ට සංවේදී බව සහතික කිරීමටත්, නිරායුධකරණයට අදාළ සෑම සංසදයකම සමබර ප්‍රවේශයක් පවත්වා ගැනීමටත් මෙම අංශය කටයුතු කරයි. බහුපාර්ශ්වික නිරායුධකරණ ප්‍රයත්නයන් සඳහා ශ්‍රී ලංකාවේ දිගුකාලීන කැපවීමට අනුකූලව, ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සහ 2022 වසරේ පැවති නිරායුධකරණ රැස්වීම් පිළිබඳ රජයේ ස්ථාවරය සම්බන්ධයෙන් අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා මෙම අංශය අඛණ්ඩව සම්බන්ධ විය.

i. 2022 අගෝස්තු 1 සිට 26 දක්වා පැවති අවි ප්‍රගුණනය නොකිරීමේ ගිවිසුමේ (NPT) පාර්ශ්වවල 10 වැනි සමාලෝචන සමුළුව සඳහා ශ්‍රී ලංකාව විසින් මැදිහත්වීම් 15කට අධික සංඛ්‍යාවක් සිදු කරන ලදී;

ii. 2022 පෙබරවාරි මස පැවති නිරායුධකරණය පිළිබඳ සම්මන්ත්‍රණය. එහිදී විදේශ අමාත්‍යවරයා මැදිහත් විය;

iii. ශ්‍රී ලංකාව උප සභාපති ලෙස ද කටයුතු කළ, 2022 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 2 දක්වා ජිනීවාහිදී පැවති පොකුරු බෝම්බ පිළිබඳ සම්මුතියේ (CCM) රාජ්‍ය පාර්ශ්වයන්ගේ 10 වැනි රැස්වීම;

iv. 'නිරායුධකරණය සහ ජාත්‍යන්තර ආරක්ෂාව' පිළිබඳ 77 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පළමු කමිටුවේ දී ශ්‍රී ලංකා රජයේ නියෝජිත පිරිස විසින් භාවිතා කළ යුතු කෙටි සටහන සම්පාදනය කිරීමේ දී මෙම අංශය පෙරමුණ ගත්තේය. පළමුවැනි කමිටුව 2022 සැප්තැම්බර් වැනි 29 දින සිට නොවැම්බර් 4 වැනි දින දක්වා පැවැත්විණි. ඉදිරිපත් කරන ලද යෝජනා/ තීරණ 76 ට අදාළව ශ්‍රී ලංකාවේ ස්ථාවරයන් මෙම අංශය විසින් සකස් කරන ලදී. නිව්යෝර්ක් හි ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතවරයා පළමු කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළේය. සාමාන්‍ය විවාදයේදී සහ පොකුරු රැස්වීම් 6කදී ශ්‍රී ලංකාව ප්‍රකාශ ඉදිරිපත් කළේය.

v. 2022 නොවැම්බර් 28 වැනි දින සිට දෙසැම්බර් 2 වැනි දින දක්වා හේග් හි දී පැවති රසායනික අවි සම්මුතියේ (CWC) පාර්ශ්වයන්ගේ 27 වැනි සමුළුව; සහ

vi. IFE-2025 හි සත්කාරකත්වය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ අභිමතය පරිදි 2022 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 7 දක්වා CTBTO වෙතින් පැමිණි ස්ථානීය පරීක්ෂකවරුන්ගේ (OSI) තොරතුරු සොයාබැලීමේ සංචාරය සම්බන්ධීකරණය කිරීම.

**විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ බහුපාර්ශ්වික නියැලීම:** ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) සමඟ ශ්‍රී ලංකාවේ නියැලීම මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලැබේ. 2022 සැප්තැම්බර් 26 වැනි දින සිට 30 වැනි දින දක්වා පැවති 66 වැනි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ මහා සමුළුවට ශ්‍රී ලංකාව සහභාගී වී, ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය. එක්සත් ජාතීන්ගේ සයිබර් අපරාධ සම්මුතියක් විස්තාරණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලයේ (UNODC) අවිධිමත් කමිටුවට අදාළ ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ සහභාගිත්වයෙන් යුතුව මේ වසරේ දී මේ දක්වා සැසි තුනක් පවත්වා ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) 41 වැනි මහා සභා රැස්වීමට ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සහභාගිත්වය මෙම අංශය සම්බන්ධීකරණය කළ අතර, එහි දී ගත යුතු ස්ථාවරයන් සැකසීම සඳහා සහාය විය. 2022 දෙසැම්බර් 6 වැනි දින සිට 9 වැනි දින දක්වා වියානා හි CTBT හි 3 වැනි විද්‍යා රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන සඳහා විදේශ ලේකම් ඇතුළු 4 දෙනෙකුගෙන් යුත් දූත පිරිසේ ශ්‍රී ලංකා සහභාගීත්වය මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, එම වැඩසටහන සඳහා ප්‍රකාශ සකස් කරන ලදී.

**සමාජ-ආර්ථික ක්ෂේත්‍රයේ බහුපාර්ශ්වික නියැලීම:** සමාජ-ආර්ථික ක්ෂේත්‍රවල ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කරන බහුපාර්ශ්වික සංසදවල දී ශ්‍රී ලංකාවේ නියැලීම මෙම අංශය අඛණ්ඩව සම්බන්ධීකරණය කරයි. මෙම සංසද සමඟ නිතිපතා සම්බන්ධ වීමට අමතරව, අංශය පහත සඳහන් කරුණු සම්බන්ධීකරණය කළේය:

**i. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO):** 2022 ජූලි සහ සැප්තැම්බර් මාසවලදී පැවැති ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නියෝජිත විම්ලේන්ද්‍ර ෂැරන් මහතාගේ සංචාරය සඳහා මෙම අංශය පහසුකම් සැලසූ අතර, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අනෙකුත් ප්‍රභූවරුන් සමඟ පැවති රැස්වීම් සම්බන්ධීකරණය කළේය.

ii. **ලෝක ආහාර වැඩසටහන (WFP):** ලෝක ආහාර වැඩසටහනේ ආසියා සහ පැසිෆික් කලාපීය අධ්‍යක්ෂ ජෝන් අයිලියේෆ් මහතා 2022 සැප්තැම්බර් 1-2 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම අංශය සංචාරය සඳහා පහසුකම් සලසා දුන් අතර, අග්‍රාමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ පැවති රැස්වීම් සම්බන්ධීකරණය කළේය.

iii. **යුනිසෙෆ් (UNICEF):** 2022 අගෝස්තු 21 සිට 27 දක්වා පැවැති දකුණු ආසියාව සඳහා යුනිසෙෆ් හි කලාපීය අධ්‍යක්ෂ ජෝර්ජ් ලැරියා-ඇඩ්ජේ මහතාගේ සංචාරය සඳහා අංශය පහසුකම් සලසා දුන් අතර, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අනෙකුත් ඉහළ පෙළේ ප්‍රභූවරුන් සමඟ පැවති රැස්වීම් සංවිධානය කළේය.

iv. **එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP):** 2022 අගෝස්තු මාසයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නියෝජ්‍ය කලාපීය අධ්‍යක්ෂ ක්‍රිස්ටෝෆ් බහුවෙට් මහතාට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා පහසුකම් සැලසූ අතර, විදේශ අමාත්‍යවරයා සමඟ පැවති රැස්වීමක් සම්බන්ධීකරණය කළේය. 2022 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත රොබර්ට් ජුකම් මහතා විසින් විදේශ කටයුතු අමාත්‍යවරයා වෙත ලබා දුන් සමුගැනීමේ රැස්වීමක් සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ නව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත අසූසා කුබෝටා මහතා සඳහා 2023 ජනවාරි මාසයේ දී වැඩ භාර ගැනීමට පහසුකම් සැලසීම, වීසා සහ අවශ්‍ය නිෂ්කාශනය සහ සම්බන්ධීකරණය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ආසියා සහ පැසිෆික් කලාපීය අධ්‍යක්ෂිකා කන්නි විග්නරාජා මහත්මිය සඳහා ඉල්ලා සිටින ලද ඉහළ මට්ටමේ දේශපාලන ප්‍රභූවරුන් (අගමැති සහ විදේශ අමාත්‍ය) සමඟ රැස්වීම් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කරන ලදී.

v. **ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO):** ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියාව සඳහා වන කලාපීය කමිටුවේ 75 වැනි සැසිවාරය 2022 සැප්තැම්බර් 5-9 දක්වා භූතානයේ පාරෝ හිදී පැවැත්වුණු අතර, සෞඛ්‍ය අමාත්‍යවරයාට මෙම කමිටුවට සහභාගී වීමට මෙම අංශය විසින් පහසුකම් සලසා ඇත. තවද, 75 වැනි ලෝක සෞඛ්‍ය සමුළුව සහ අනෙකුත් ඉහළ මට්ටමේ රැස්වීම් (36 වැනි විධායක මණ්ඩලයේ අයවැය සහ පරිපාලන කමිටුවේ 36 වැනි රැස්වීම සහ විධායක මණ්ඩලයේ 151 වැනි සැසිවාරය) සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා මෙම අංශය විසින් සම්බන්ධීකරණය සහ පහසුකම් සපයන ලදී.

vi. **එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය:** 2022 දෙසැම්බර් 19 සිට 22 දක්වා එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR) ආසියා සහ පැසිෆික් කලාපීය කාර්යාංශයේ අධ්‍යක්ෂිකා ඉන්ද්‍රිකා රත්වත්තේගේ මහත්මියගේ සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. උතුරු මුහුදේ පාවෙන විපතට පත් වූ යාත්‍රාවක සාමාජිකයින් 105 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් බේරා ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව දැරූ ප්‍රයත්නය අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

vii. **ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC):** 2022 ජූලි මාසයේ නිව්යෝර්ක් හි දී පැවැති එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) තිරසාර සංවර්ධනය පිළිබඳ ඉහළ මට්ටමේ දේශපාලන සංසදයේදී ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිය 2 වැනි ස්වේච්ඡා ජාතික සමාලෝචන (VNR) 2022 වාර්තාව ඉදිරිපත් කළේය. ECOSOC 2022 සැසිවාරයේ ඉහළ මට්ටමේ අංශයට සහභාගී වීම සඳහා විදේශ අමාත්‍යවරයාට සහ 13 සිට 16 දිනවල 2022 ජූලි මස නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී අතථ්‍ය ලෙස පැවති ECOSOC 2022 සැසියේ මහා විවාදයට විදේශ ලේකම්වරයාගේ සහභාගීත්වය සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී. 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීමේදී තිරසාර සංවර්ධන කවුන්සිලය (SDC) සහ අනෙකුත් ශ්‍රී ලංකා රජයේ නියෝජිතායතන සමඟ සමීප සම්බන්ධීකරණයෙන් යුතුව තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදී. මෙහෙයුම් කමිටු සාමාජිකයෙකු ලෙස, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකාව සඳහා 2023-2027 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව (UNSDCF) සංවර්ධනය කිරීම සම්බන්ධ කටයුතු සඳහා මෙම අංශය දායක විය. 2022 ඔක්තෝබර් මාසයේදී රුවන්ඩාවේ කිගාලි හි පැවති අන්තර් පාර්ලිමේන්තු සංගමයේ (IPU) රැස්වීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.

**මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC):** මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම්, දූෂණ හා සයිබර් අපරාධ පිළිබඳව කටයුතු කිරීම සම්බන්ධ ක්ෂේත්‍රවල රැස්වීම් සහ පුහුණුවීම් සඳහා මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකාවේ සහභාගීත්වය ඇතිව, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සමඟ ශ්‍රී ලංකාවේ නියැලීම 2022 වසරේදී අඛණ්ඩව සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන්, මෙම අංශය ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය (NAHTF), ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය (NDDCB) සහ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) ඇතුළු රේඛීය ආයතන සමඟ කටයුතු කළේය. 2022 දෙසැම්බර් 13 වැනි දින ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "ජාතික මානව ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය (NAHTTF) - පාර්ශ්වකරුවන්ගේ සංවාදය 2022" සඳහා පිලිපීනය, මාලදිවයින සහ මැලේසියාවේ ජාවාරමට එරෙහිව සටන් කිරීම පිළිබඳ විශේෂඥයින්ගේ සහභාගීත්වය මෙම අංශය සම්බන්ධීකරණය කළේය. ජාත්‍යන්තර මානව හිමිකම් සඳහා කැපවීම් සහ බැඳීම් පිළිබඳ වාසිදායක ස්ථානයේ සිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉදිරිපත් කිරීම් සහිතව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පුළුල් ත්‍රස්ත විරෝධී නීති කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද නිලධාරීන්ගේ කමිටුව සඳහා මෙම අංශය සාමාජිකයෙකු ලෙස දායක විය.

**අපේක්ෂකත්ව:** 2022 ජූනි 23 වැනි දින නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී පැවැති කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ (CEDAW) 22 වැනි රාජ්‍ය පාර්ශ්ව රැස්වීමේදී පවත්වන ලද මැතිවරණවල දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, මහාචාර්ය රංගිකා ද සිල්වා ද අල්විස් මහත්මිය 2023-2026 කාලසීමාව සඳහා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට තේරී පත් විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල විවිධ තනතුරු සඳහා වෙනත් රාජ්‍යයන් විසින් යෝජනා කරන ලද අපේක්ෂකත්වයන්ට සහාය දීමෙන් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ මිත්‍ර සබඳතා පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීමට මෙම අංශය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, 2022 සැප්තැම්බර් 30 වැනි දින වන විට, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO), ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (ISO), සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN), ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA), වාර්ගික වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ කමිටුව (CERD), සියලුම සංක්‍රමණික කම්කරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කමිටුව (CMW), එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC), එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), අධ්‍යාපන සංවර්ධන සන්ධානය (CED), ජාත්‍යන්තර ජංගම චන්ද්‍රිකා සංවිධානය (IMSO) යනාදිය සඳහා පවත්වන ලද මැතිවරණ 22 ක් සම්බන්ධයෙන් මෙම අංශය විසින් කටයුතු කරන ලදී. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC), ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම (UNCITRAL) සහ කාන්තා තත්ත්වය පිළිබඳ කොමිසම (CSW) සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්ව සඳහා අන්‍යෝන්‍ය සහයෝගිතා වැඩපිළිවෙලවල් ද මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

## 2.5 කාර්ය සාධන විශ්ලේෂණය: භෞමික අංශ

### 2.5.1 අප්‍රිකානු කටයුතු අංශය

ඊජිප්තුව, ඉතියෝපියාව, කෙන්යාව, සීෂෙල්ස් සහ දකුණු අප්‍රිකාව යන රටවල පිහිටි නේවාසික ශ්‍රී ලංකා දූත මණ්ඩල 5ක් හරහා අප්‍රිකානු සංගමයට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට අමතරව, කලාපයේ රටවල් 54ක් සමඟ ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධීකරණය කිරීමට අදාළ රාජකාරි සහ කාර්යයන් අප්‍රිකා කටයුතු අංශය වෙත පවරා ඇත.

**දකුණු අප්‍රිකාවේ ජනාධිපතිවරයාගේ සංචාරය:** දකුණු අප්‍රිකානු ජනාධිපතිවරයා සමඟ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා අතර හමුවීම් (2022 නොවැම්බර් මස) සඳහා පහසුකම් සැලසීම.

**විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අනෙකුත් ඉහළ පෙළේ නිලධාරීන් අතර රැස්වීම්:** අප්‍රිකානු රටවල (දකුණු අප්‍රිකාව, ඊජිප්තුව, ලිබියාව) දූත මණ්ඩල ප්‍රධානීන් විසින් විදේශ කටයුතු අමාත්‍යවරයා සහ විදේශ කටයුතු ලේකම්වරයා හමුවීමට අමතරව, අප්‍රිකානු රටවල දූත මණ්ඩල ප්‍රධානීන්/ දූත මණ්ඩල නියෝජිතයින් සහ අප්‍රිකා කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් අතර පැවති රැස්වීම් සඳහා පහසුකම් සපයන ලදී.

**ද්විපාර්ශ්වික සබඳතා:** දකුණු අප්‍රිකාවේ සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශ අතර හවුල්කාරිත්ව සංසදයේ 8 වැනි සැසිවාරය (2022 පෙබරවාරි මස) අතථ්‍ය ලෙස පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ ඊජිප්තුව අතර 3 වැනි ඒකාබද්ධ ආර්ථික කොමිසම (2023 පළමු කාර්තුවේදී) පැවැත්වීමට පියවර ගන්නා ලදී. ශ්‍රී ලංකාව සහ ඊජිප්තුව අතර වසර 65 ක රාජ්‍යතාන්ත්‍රික සබඳතා සැමරීම සඳහා මුද්දරයක් නිකුත් කිරීම සම්බන්ධීකරණය කිරීම. (2023 පළමු කාර්තුව)

**බහුපාර්ශ්වික සබඳතා:** පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව (CHOGM), එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (UNGA), එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ දේශගුණික විපර්යාස පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම (COP 27) සමුළු සඳහා පහසුකම් සැපයීම සහ සැලකිය යුතු යෙදවුම් ලබා දීම.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම සහ උගන්ඩා බලධාරීන් අතර ව්‍යාපාර අතර රැස්වීම් සංවිධානය කොට, අප්‍රිකානු මහාද්වීපයේ නව වෙළඳපල අවස්ථා ගවේෂණය කිරීම සඳහා පියවර ගෙන ඇත.

**අප්‍රිකානු මහාද්වීපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පුළුල් කිරීම:** කැමරූන් රාජ්‍යය සමඟ නුදුරේදීම රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීමට පියවර ගන්නා ලදී. කොමොරොස් සහ සාඕ ටෝම් හා ප්‍රින්සිපේ සමඟ විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලීය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කොට ඇත. බුරුන්ඩි සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා විධිමත් කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.

## 2.5.2 අමෙරිකානු අංශය

අමෙරිකානු කලාපය සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා මෙම අමාත්‍යාංශයේ අමෙරිකානු අංශය විසින් අමෙරිකා එක්සත් ජනපදය (වොෂින්ටන් ඩීසී, නිව්යෝර්ක් සහ ලොස් ඇන්ජලීස්), කැනඩාව (ඔටාවා සහ ටොරොන්ටෝ), බ්‍රසීලය සහ කියුබාව යන රටවල දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා මෙහෙයවනු ලැබේ.

ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව, 2022 දී අමාත්‍යාංශය විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල සමඟ සහයෝගයෙන් ජනාධිපති, අගමැති, විදේශ කටයුතු අමාත්‍ය සහ විදේශ ලේකම් සඳහා සම්භාවනීය අමුත්තන් සමඟ රැස්වීම් ඇතුළු දේශපාලන සහ නිල මැදිහත්කරුවන් සමඟ ඉහළ මට්ටමේ අන්තර්ක්‍රියා සම්බන්ධීකරණය කර පහසුකම් සලසා දුන්නේය. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සම්බන්ධයෙන්, අදාළ වෙළඳපල තුළ ශ්‍රී ලාංකීය නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ දූත මණ්ඩල/ දූත කාර්යාල විසින් ක්‍රියාකාරකම් සංවිධානය/පහසුකම් සැලසීම; එම රටවල සහ ශ්‍රී ලංකාවේ අදාළ ආයතන අතර ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීම; සහ රටේ ආර්ථික පුනර්ජීවනය ඉහළ නැංවීම සඳහා අදාළ රටවල අදාළ නිලධාරීන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව යනාදී ආයතන සමඟ අන්තර් ක්‍රියා පැවැත්විය. යුධ උපකරණ, පුහුණු අවස්ථා යනාදිය ලැබීම සහතික කිරීම ඇතුළුව ආරක්ෂක සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා දූත මණ්ඩල/ දූත කාර්යාල අදාළ රජයන්හි නිලධාරීන් සමඟ අඛණ්ඩව සාකච්ඡා පැවැත්විය. දූත මණ්ඩල විසින් අදාළ රටවල විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙත කොන්සියුලර් සහය ලබා දුන් අතර ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා රජය දරන ප්‍රයත්නය සඳහා ඔවුන්ගේ සහාය ද ලබා ගන්නා ලදී.

අදාළ රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතාවල බහුවිධ පැතිකඩ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දැනටමත් පිහිටුවා ඇති 'ප්‍රතිපත්ති සංවාද' යාන්ත්‍රණයන් හරහා අමෙරිකානු අංශය සහ අදාළ දූත මණ්ඩල/ දූත කාර්යාල විසින් ස්ථාවර ප්‍රතිපත්ති සංවාදයක් පවත්වාගෙන යන අතර, එවැනි යාන්ත්‍රණ නොමැති රටවල් සමඟ 'ප්‍රතිපත්ති සංවාද' යාන්ත්‍රණයන් ආරම්භ කිරීමට ක්‍රියා කරනු ඇත.

## 2.5.3 නැගෙනහිර ආසියානු අංශය

සමාලෝචන කාලසීමාව තුළදී, නැගෙනහිර ආසියානු අංශය විසින් කලාපයේ රටවල් සමඟ දේශපාලන, ආර්ථික, සමාජ-සංස්කෘතික සහ පුද්ගලාන්තර සබඳතා තවදුරටත් ශක්තිමත් කරන අතරම, ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය, කොරියානු ජනරජය යන රටවල නේවාසික දූත මණ්ඩල සහ ඒවායේ සමගාමී අක්තගැන්වීම් හරහා ඒ ඒ රටවල වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ට කොන්සියුලර් පහසුකම් සහ කම්කරු සුබසාධනය ලබාදෙන ලදී.

**චීනය:** අ.ඩො. බිලියන 1 ක ද්විපාර්ශ්වික මූල්‍ය ආධාර, අ.ඩො. බිලියන 1.5 ක විනිමය හුවමාරු ගිවිසුම, අ.ඩො. බිලියන 1.5 ක ගැනුම්කරුගේ ණය පහසුකම සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා අ.ඩො. මිලියන 500ක ඉල්ලීම සඳහා ද්වි පාර්ශ්වික මූල්‍ය සහාය සලසන ලදී. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා කොවිඩ්-19 ප්‍රතිසාධනය පිණිස අ.ඩො. මිලියන 180 ක ණයක් අනුමත කළේය. චීනය ශ්‍රී ලංකාවට යුආන් 500 (අ.ඩො. මිලියන 74) හදිසි මානුෂීය ආධාර ලබා දීමට එකඟ විය. 2022 ජනවාරි 8 සිට 9 දක්වා පැවති චීනයේ මන්ත්‍රී සහ විදේශ අමාත්‍ය වැංග් යී මහතාගේ සංචාරය සඳහා ද පහසුකම් සලසා ඇත. ලංකා කුරුඳු චීනයේ ආහාර ද්‍රව්‍යයක් ලෙස ලියාපදිංචි කිරීමට පියවර ගෙන ඇත. රෙදිපිළි, මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රවල ප්‍රමුඛ චීන සමාගම් සමඟ ව්‍යාපාරාන්තර රැස්වීම් සංවිධානය කරන ලදී. පළාත් ආණ්ඩු විසින් සංවිධානය කරන ලද වෙළඳ සහ සංචාරක පොළට සහභාගී විය. පුනර්ජනනීය බලශක්තිය, උසස් අධ්‍යාපනය, දරිද්‍රතාවය පිටුදැකීම, නැවත වන වගාව සහ නිල් ආර්ථික සංවර්ධනය සඳහා දකුණු-දකුණු සහයෝගීතාව යටතේ සහාය ලබා ගැනීම සඳහා චීනයේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය (CIDCA), එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ චීනයේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී.

**ජපානය:** හිටපු අග්‍රාමාත්‍ය අභාවප්‍රාප්ත ෂින්සෝ අබේ මහතාගේ රාජ්‍ය අවමංගල්‍ය උත්සවයට සහභාගී වීම සඳහා 2022 සැප්තැම්බර් 26 සිට 28 දක්වා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ජපානයේ නිල සංචාරය සඳහා පහසුකම් සලසන ලදී. අග්‍රාමාත්‍ය ෆුමියෝ කිෂිඩා මහතා සමඟ සමුළු රැස්වීමක් පැවැත්වූ ජනාධිපතිතුමා, ජපානයේ විදේශ අමාත්‍ය යොෂිමාසා හයාෂි මහතා සමඟ සුහද හමුවක් පැවැත්වීය. කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා 2022 සැප්තැම්බර් 26 වැනි දින සිට ඔක්තෝබර් 4 වැනි දින දක්වා ජපානයේ සංචාරයක නිරත වූ අතර, ජපානයේ අධිකරණ රාජ්‍ය අමාත්‍ය සහ සෞඛ්‍ය, කම්කරු සහ සුබසාධන රාජ්‍ය අමාත්‍යවරයා හමුවිය. එහි දී ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා කාණ්ඩ වැඩි කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණි. ජපානය විසින් අත්‍යාවශ්‍ය ඖෂධ සහ ආහාර සපයා ගැනීම සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 6.5ක් වටිනා මානුෂීය හදිසි ආධාර සම්බන්ධීකරණය කරන ලදී. ජපානයේ අග්නිදිග සහ නිරිතදිග ආසියානු කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කානෝ ටකෙහිරෝ මහතාගේ සංචාරය සඳහා පහසුකම් සලසන ලදී. 2022 ජුලි 15 වැනි දින පවත්වන ලද ජපාන-ශ්‍රී ලංකා තුන්වැනි ප්‍රතිපත්ති සංවාද රැස්වීම සඳහා පහසුකම් සපයන ලදී.

**කොරියානු ජනරජය:** හිටපු විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා 2022 ජනවාරි 5 සිට 7 දක්වා කොරියානු ජනරජයේ නිරත වූ නිල සංචාරය සඳහා පහසුකම් සැලසූ අතර එහිදී ඔහු අග්‍රාමාත්‍ය කිම් බූ-කියුම් මහතා හමුවූ අතර, 2022 ජනවාරි 19 සිට 22 දක්වා කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායකවරයා නිරත වූ ශ්‍රී ලංකාවට නිල සංචාරය සඳහා පහසුකම් සලසා දෙන ලදී. කොරියානු ජනරජයේ මානව පෘථිවි සුභසාධක ලාභ නොලබන සංවිධානය සහ කොරියානු-ශ්‍රී ලංකා මහා විහාරය විසින් රුපියල් මිලියන 42 කට වඩා වටිනා අත්‍යවශ්‍ය ඖෂධ ද්‍රව්‍ය 26 ක පරිත්‍යාගයක් සම්බන්ධීකරණය කරන ලදී. තවද, රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ සංක්‍රමණික සේවකයින්ගේ වර්තමාන නැවත ඇතුළත් වීමේ සීමාව වැඩි කිරීමට මෙන්ම, ශ්‍රී ලංකාව සඳහා දැනට පවතින රැකියා බලපත්‍ර කෝටාව ඉහළ නැංවීම සඳහා මෙම අංශය අදාළ දකුණු කොරියානු බලධාරීන් සමඟ අඛණ්ඩව නිරත විය.

**ඕස්ට්‍රේලියාව:** ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 66.9 ක් (ආසන්න වශයෙන්) වටිනා අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය කරන ලදී. මීට අමතරව, ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල විසින් ශ්‍රී ලාංකික වෙළෙඳාම, අපනයන, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන අතරම කොන්සියුලර් සහ සුබසාධන සේවා හරහා ශ්‍රී ලාංකික පුරවැසියන්ට සහාය විය. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ ලෝක ආහාර වැඩසටහන (WFP) හරහා ඕස්ට්‍රේලියානු රජයෙන් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 50 ක සහාය සහ හදිසි ආහාර සහ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමට අතිරේක ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 25ක් ලබා දීම සම්බන්ධීකරනය කරන ලදී. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ සම්බාධක යටතේ 2022 සැප්තැම්බර් 16 දින සිට තවත් වසර 3ක් සඳහා එල්ටීටීඊය ඕස්ට්‍රේලියාවේ තහනම් සංවිධානයක් ලෙස නැවත ලැයිස්තුගත කිරීම සඳහා සාර්ථක ලෙස බලපෑම් කරන ලදී.

**නවසීලන්තය:** නවසීලන්තයේ සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපල විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් සැකසීම සිදුකෙරිණ. නවසීලන්තයේ එක්සත් ජාතීන්ගේ අත්පොත 2022-23 නිපදවීම සහ සංවිධානය නියෝජනය කරන එක්සත් ජාතීන්ගේ

වටිනාකම් සහ මූලධර්ම කෙරෙහි කැපවීම දන්වා යවා ඇත. එක්සත් ජාතීන්ගේ සාමාජිකයෙකු වශයෙන්, ශ්‍රී ලංකාවට තොරතුරු පිළිබඳ යාවත්කාලීන වීම සඳහා මෙම අත්පොත ඉතා වටිනා වන අතර මෙම විශිෂ්ට කාර්යය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලුම සාමාජික රටවල් සඳහා සිත්ගන්නාසුළු හා ප්‍රයෝජනවත් වේ.

මීට අමතරව, මෙම අංශය විසින් බීජිං, ෂැංහයි, ගුවැන්ෂු, සෝල්, ටෝකියෝ, කැන්බරා, සිඩ්නි සහ මෙල්බර්න් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල සමඟ ඒකාබද්ධව, නැගෙනහිර ආසියාවේ කලාපවල සමගාමීව පිළිගත් රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා නංවාලීම සඳහා ප්‍රගතිශීලී මුලපිරීම් සහ ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත.

## 2.5.4 යුරෝපය සහ මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩලයීය අංශය

**ද්විපාර්ශ්වික සබඳතා:** ඒකාබද්ධ කොමිෂන් සභා/දේශපාලන උපදේශන සහ ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීම- ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන-පළමු වටය 2022 දී අතිරේක ලේකම්වරුන්ගේ මට්ටමින් පැවැත්විණි. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා - රුසියා වෙළෙඳ අන්තර් රාජ්‍ය කොමිෂන් සභාවේ 3 වැනි වටය කොළඹදී පැවැත්වීමට කටයුතු කරගෙන යයි. ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ප්‍රථම ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම. පෘතුගාලය, හංගේරියාව, ජෝර්ජියාව, ජර්මනිය, නෙදර්ලන්තය සහ රුසියානු සමූහාණ්ඩුව (බෙලරුස්, කසකස්තානය සහ යෙකටරින්බර්ග්) යන රටවල ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීමට පහසුකම් සලසන ලදී. කර්ස්ක් (රුසියානු සමූහාණ්ඩුව), ආර්මේනියාවේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරුන් සහ එක්සත් රාජධානියේ කාඩිෆ් හි ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම අලුත් කිරීමට පහසුකම් සලසන ලදී. 2022 දෙසැම්බර් 1 වන දින ඔස්ට්‍රියාවේ ටිරෝල් හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල් කාර්යාලය විවෘත කිරීමට පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකාව සහ රුසියාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 65 වැනි සංවත්සරය ඉහළ පෙළේ බලධාරීන්ගේ සහභාගීත්වයෙන් සමරන ලදී.

**ඉහළ මට්ටමේ, අභ්‍යන්තර සහ බාහිර සංචාර සහ ඇමතුම් සඳහා පහසුකම් සැලසීම**: සැලකිය යුතු සංක්ෂිප්ත තොරතුරු සැපයීම සහ සැපයුම් විධිවිධාන සකස් කිරීම තුළින් බාහිර/ අභ්‍යන්තර චාරිකා සඳහා පහසුකම් සලසන ලදී.

**අභ්‍යන්තර සංචාර:** 2022 ජනවාරි මාසයේදී තුර්කියේ විදේශ කටයුතු අමාත්‍ය මෙවුලුට් කැවුසොග්ලු මහතාගේ ශ්‍රී ලංකා සංචාරය. 2022 ජනවාරි 12 දින විදේශ කටයුතු සහ වෙළෙඳ සහ එක්සත් ජාතීන් පිළිබඳ අමාත්‍ය හංගේරියාවේ විදේශ පොදුරාජ්‍ය මණ්ඩලයීය හා සංවර්ධන කාර්යාලයේ (FCDO) පීටර් සිජ්ජාර්ටෝ මහතා ශ්‍රී ලංකාවට පැමිණීම. දකුණු ආසියාව පිළිබඳ රාජ්‍ය අමාත්‍ය තාරික් අහමඩ් මහතා 2022 ජනවාරි 18-20 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය. 2022 මාර්තු 26 සිට අප්‍රේල් 3 දක්වා එක්සත් රාජධානියේ සාමි මණ්ඩලයේ මන්ත්‍රී ගරු නේස්බි සාමිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය. 2022 මාර්තු 22-27 දක්වා පැවති ශ්‍රී ලංකා ප්‍රංශ සෙනෙට් සභාවේ 'ප්‍රංශ - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ' ඉහළ පෙළේ සංචාරය. 2022 නොවැම්බර් 9 සිට 11 දක්වා ශ්‍රී ලංකාව සඳහා එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍යවරයාගේ වෙළඳ නියෝජිත ඇබර්සොක් හි ඩේවිස් සාමිවරයා ශ්‍රී ලංකාවට පැමිණීම.

**බාහිර සංචාර:** 2022 පෙබරවාරි 24 වන දින පැරිසියේ ඉන්දු පැසිෆික් කලාපයේ සහයෝගිතා අමාත්‍ය සංසදයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතාගේ සංචාරය - නෙදර්ලන්ත විදේශ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පවත්වන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 49 වැනි සැසිවාරයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා 2022 මාර්තු මස ජිනීවා වෙත නිරත වූ සංචාරය - එක්සත් රාජධානියේ දකුණු ආසියාව, එක්සත් ජාතීන් සහ FCDO හි පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ අමාත්‍ය අහමඩ් සාමිවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විය. 2022 මාර්තු 26 සහ 27 දෙදින තුළ දී ඩෝහා සංසදයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා නිරත වූ සංචාරය - තුර්කියේ විදේශ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්විණි. 2022 ජූනි 10 සිට 12 දක්වා සිංගප්පූරුවේ පැවැති IISS ෂැංග්‍රිලා සංවාදයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) පීරිස් මහතා නිරත වූ සංචාරය - යුක්රේනයේ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික හමුවක් පැවැත්විණි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 50 වැනි සැසිවාරයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යවරයා ජූනි 12-17 දක්වා ජිනීවා හි නිරත වූ සංචාරය. 2022 සැප්තැම්බර් මස එක්සත් රාජධානියේ පැවැති දෙවැනි එලිසබෙත් මහ රැජිනගේ රාජ්‍ය අවමංගල්‍ය

උත්සවයට සහභාගී වීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නිරත වූ සංචාරය. 2022 සැප්තැම්බර් මස පැවැති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 77 වැනි සැසිවාරයට සහභාගී වීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා නිරත වූ සංචාරය - උස්බෙකිස්ථානයේ, ආර්මේනියාවේ විදේශ අමාත්‍යවරුන් සහ එක්සත් රාජධානියේ රාජ්‍ය අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විණි. අක්තපත්‍ර පිළිගැන්වීම සඳහා ශ්‍රී ලංකා තානාපතිවරයා (ස්වීඩනයේ පදිංචි) විසින් ලිතුවේනියාවට (2022 අප්‍රේල් 6), නෝර්වේ සහ ෆින්ලන්තයට (2022 සැප්තැම්බර් 26-29) නිරත වූ සංචාර. 2022 ඔක්තෝබර් 12 සිට 13 දක්වා කසකස්තානයේ නූර්-සුල්තාන් හිදී පැවති අන්තර් ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ (CICA) 6 වැනි සමුළුව සඳහා පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිතයා ලෙස අධ්‍යාපන අමාත්‍යවරයා 2022 ඔක්තෝබර් 9-16 දිනවල රුසියානු සමූහාණ්ඩුවේ නිරත වූ සංචාරය සඳහා පහසුකම් සැලසීය. සංචාරක හා ඉඩම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා 2022 නොවැම්බර් 7 වන දින ලෝක සංචාරක ගමනට සහභාගී වීම සඳහා එක්සත් රාජධානියේ සංචාරය කිරීම. කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය 2022 නොවැම්බර් 10 සිට 22 දක්වා ඉතාලියේ සංචාරය කිරීම. 2022 දෙසැම්බර් 6-9 දිනවල දී ඔස්ට්‍රියාවේ CTBTO 3වැනි විද්‍යා රාජ්‍යතාන්ත්‍රික සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා විදේශ ලේකම් ඔස්ට්‍රියාවේ වියානා හි නිරත වූ සංචාරය

**දුරකථන ඇමතුම් සහ වීඩියෝ ඇමතුම් සඳහා පහසුකම් සැලසීම:** 2022 මැයි 30 වන දින එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහ එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍ය බොරිස් ජොන්සන් මහතා අතර. 2022 අගෝස්තු 16 වැනි දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ එක්සත් රාජධානියේ FCDO හි දකුණු ආසියාව, එක්සත් ජාතීන් සහ පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ අමාත්‍ය අහමඩ් සාමිවරයා අතර. 2022 ජූලි 23 වැනි දින ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ එක්සත් රාජධානියේ FCDO හි දකුණු ආසියාව, එක්සත් ජාතීන් සහ පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ අමාත්‍යවරයා අතර.

**වැදගත් ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්/ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සහ පසු විපරම් කිරීම:** 2022 ජනවාරි 18 වැනි දින ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර සෞඛ්‍ය ආරක්ෂණ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමට පහසුකම් සැලසීය. ශ්‍රී ලංකාව සහ රුසියාව අතර රේගු කටයුතුවලදී සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය සහය පිළිබඳ පහසුකම් සලසන ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගැනීම හරහා විධිවිධාන සකස් කිරීම. 2022 ජනවාරි 12 වැනි දින ශ්‍රී ලංකාව සහ හංගේරියාව අතර 2022-2024 වසර සඳහා ස්ටයිපෙන්ඩියම් හංගේරිකම් වැඩසටහනේ රාමුව තුළ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමට පහසුකම් සැලසීය. ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය අතර ගුවන් සේවා ගිවිසුම පිළිබඳ සාකච්ඡා අවසන් කර 2022 මාර්තු 21 දින අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගන්නා ලදී. තරුණ කටයුතු ක්ෂේත්‍රය පිළිබඳ ෆෙඩරල් නියෝජිතායතනය (රුසියානු සමූහාණ්ඩුව) සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය අතර 2022 ජූලි 5 දිනැති තරුණ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධතා ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලැබුණු අතර, රේඛීය අමාත්‍යාංශයේ නම වෙනස් කිරීමෙන් පසුව අත්සන් කිරීම සඳහා සූදානමින් පවතී. භෞතික සංස්කෘතික හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකාව සහ රුසියාව අතර අවබෝධතා ගිවිසුම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් සාකච්ඡා අවසන් කර අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට සූදානමින් පවතී. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පරිත්‍යාග කිරීම පිළිබඳ තුර්කි රජය සහ ශ්‍රී ලංකාව අතර ගිවිසුමට අත්සන් තබන ලදී. ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය සහ තුර්කියේ උසස් අධ්‍යාපන කවුන්සිලය අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා අවබෝධතා ගිවිසුම සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන් කාර්යාලය සහ තුර්කියේ ඔම්බුඩ්ස්මන් ආයතනය අතර අවබෝධතා ගිවිසුම පිළිබඳව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාව සහ ප්‍රංශ රජය අතර 2022 පෙබරවාරි 23 වැනි දින පැරිස් නුවරදී එක් එක් රාජ්‍යයේ නිල දූත මණ්ඩල නියෝජිතයන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා වැටුප් ගෙවන රැකියාවල නියැලීමේ අවසරය පිළිබඳ ගිවිසුම සහ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ප්‍රංශයේ KSAPA සමාගම අතර කුඩා රබර් වතු හිමියන් 6,000ක් සඳහා ධාරිතා ඉහළනැංවීමේ ව්‍යාපෘතිය (ගංහා ව්‍යාපෘතිය) පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ලක්සම්බර්ග් හි විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ ගිවිසුම අවසන් කරන ලදී. ශ්‍රී ලංකාව සහ මෝල්ටාව අතර කම්කරු සහයෝගීතාව පිළිබඳ යෝජිත අවබෝධතා ගිවිසුම පිළිබඳ

පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර සංක්‍රමණ සහ සංචලතා හවුල්කාරිත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර රියදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වූ ද්විපාර්ශ්වික ගිවිසුම සඳහා පහසුකම් සපයන ලදී.

**බහුපාර්ශ්වික සබඳතා: පොදුරාජ්‍ය මණ්ඩලය -** 2022 ජූනි 23 සිට 25 දක්වා රුවන්ඩාවේ කිගාලි හි දී පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව (CHOGM) 2022 සඳහා විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතාගේ සංචාරය සඳහා පහසුකම් සැලසීය. මෙම සංචාරයේදී ඩොමිනිකා, නවසීලන්තය, සීෂෙල්ස්, බංග්ලාදේශය, කෙන්යාව, මොරිෂස්, ඉන්දියාව, මැලේසියාව, සයිප්‍රසය සහ රුවන්ඩා යන රටවල විදේශ අමාත්‍යවරුන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විණි. 2022 අප්‍රේල් 28 වන දින කෙන්යාවේ නයිරෝබි හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ රැස්වීම, 2022 මැයි 17 සිට 19 දක්වා පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම සහ 2022 ජූලි 28 සිට අගෝස්තු 8 දක්වා එක්සත් රාජධානියේ බර්මින්හැම් හි දී පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල සහ 2022 ජූලි 27 වැනි දින බර්මින්හැම් හිදී පැවැති පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා අමාත්‍යවරුන්ගේ රැස්වීම සඳහා පහසුකම් සපයන ලදී. 2022 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී වොෂින්ටන් ඩීසී සහ මොරිෂස් හි දී පැවති පොදුරාජ්‍ය මණ්ඩලයීය මහ බැංකු අධිපතිවරුන්ගේ රැස්වීම, පොදුරාජ්‍ය මණ්ඩලයීය මුදල් අමාත්‍යවරුන්ගේ රැස්වීම, පොදුරාජ්‍ය මණ්ඩලයීය නීති අමාත්‍යවරුන්ගේ රැස්වීම සඳහා පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකාවේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වන (වැඩිහිටි) රැකවරණ දෙන්නන්ගේ වීඩියෝ අන්තර්ගත පාඨමාලාව (TVET) සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආසියාව සඳහා පොදුරාජ්‍ය මණ්ඩලයීය අධ්‍යාපනික මාධ්‍ය මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී.

**යුරෝපා සංගමය -** 2022 පෙබරවාරි 8 වැනි දින බ්‍රසල්ස් හි දී පැවති යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 24 වන සැසිවාරය සඳහා පහසුකම් සැලසූ අතර, 2023 දී යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 25 වන සැසිවාරය කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී. 2022 පෙබරවාරි 2 වැනි දින සංවර්ධන සහයෝගීතාවය පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමට පහසුකම් සලසන ලදී. 2022 ඔක්තෝබර් 28 වැනි දින කොළඹදී පැවැත්වුණු පාලනය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 6 වැනි රැස්වීම පැවැත්වීම සම්බන්ධ කරුණු සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය සිදුකරන ලද අතර, එහිදී යුරෝපා සංගමය විසින් අදාළ කරුණු සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය කරන ලදී. 2022 නොවැම්බර් 17 වන දින යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේදී විදේශ අමාත්‍යවරයා සහ දකුණු ආසියානු නියෝජිත කණ්ඩායම (DSAS) ප්‍රමුඛ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සමඟ පැවැති මාර්ගගත රැස්වීමක් සම්බන්ධීකරණය කරන ලදී. යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේ විවිධ දේශපාලන කණ්ඩායම් නියෝජනය කරන මන්ත්‍රීවරුන් 22 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව 2022 ඔක්තෝම්බර් 25 වැනි දින බ්‍රසල්ස්හිදී ශ්‍රී ලංකා මිතුරන් කණ්ඩායම නැවත ආරම්භ කරන ලදී.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකාවෙන් සෞඛ්‍ය සේවා වෘත්තිකයින් තිරසාර හා සදාචාරාත්මක ලෙස බඳවා ගැනීමට ඉඩ සලසන, ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර සෞඛ්‍ය ආරක්ෂණ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අවසන් කරන ලදී (2022 ජනවාරි 18 දින අත්සන් තබන ලදී). සෞඛ්‍ය සේවා සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-එක්සත් රාජධානිය අවබෝධතා ගිවිසුම යටතේ පිහිටුවන ලද ඒකාබද්ධ කමිටුවේ පළමු රැස්වීම පැවැත්විණි. සංචාරක ප්‍රවර්ධනයට දායක වන එයරොෆ්ලොට් සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමේ ගැටලුව සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශ අතර සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා ශ්‍රී ලංකාව පිළිබඳ සංචාරක උපදේශන ලිහිල් කිරීමට පහසුකම් සැලසීම. රුසියානු සංචාරකයින්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා මහජන බැංකුව සහ මොස්කව්හි නැට්සින්ව්ස්ට්ප්‍රොම් (Natsinvstprom) බැංකුව අතර සහයෝගීතාවයක් ස්ථාපිත කරන ලදී. එක්සත් රාජධානියේ දී ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය පිළිගැනීම සඳහා ශ්‍රී ලංකාව සඳහා නම් කරන ලද තත්ත්වය ලබා ගැනීම සඳහා ලන්ඩනයේ දූත මණ්ඩලය විසින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ගයට පහසුකම් සැලසීම. යුරෝ මිලියන 10 ක් පමණ වටිනා නෝර්වේජියානු යාත්‍රාවක් වන 'මිස්ජේ වීටා' කලම්බු ඩොක්යාඩ් පීඑල්සී ආයතනය වෙත ලබා දීමට පහසුකම් සලසා ඇත. හංගේරියාවෙන් සහනදායි මූල්‍ය පහසුකම් සහිතව අධිවේගී මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී. වෝර්සෝ හි පැවති 15 වැනි ජාත්‍යන්තර පුණ්‍ය වෙළඳපොළ (Charity Bazaar) 2022 සඳහා පහසුකම් සලසන ලදී (2022 දෙසැම්බර් 5 වැනි දින).

වෙබිනාර් රැස්වීම් මාලාවක් සමඟ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල/ දූත කාර්යාල සහ පෞද්ගලික අංශය හරහා සංචාරක ප්‍රවර්ධන සිදුවීම් සඳහා පහසුකම් සලසන ලදී. ස්විට්සර්ලන්ත රජයෙන් ශ්‍රී ලංකාවේ ජනතාවට නවීකරණය කරන ලද පාපැදි පරිත්‍යාග කිරීමට පහසුකම් සලසා ඇත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගීතාවයෙන් යුතුව 2022 ඔක්තෝබර් 9-19 දිනවල දී පරිසර සංචාරවල සිට සුඛෝපභෝගී සංචාර දක්වා සංචාර ප්‍රවර්ධනය කරන පෝලන්ත සංචාරක නියෝජිතයින් 9 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා ගමනාන්ත හුරුපුරුදු වීමේ සංචාරයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකික සංචාරක සහ සත්කාරක සමාගම් 57 ක සහභාගීත්වයෙන් යුතුව නොවැම්බර් මාසයේදී ලෝක සංචාරක වෙළඳපොළ 2022 සඳහා සහභාගී විය. යුරෝපා සංගම් නිලධාරීන්, මාධ්‍ය සහ බෙල්ජියමේ කුරුඳු ආනයනය කරන්නන්ගේ සහ බෙදාහරින්නන්ගේ සහභාගීත්වයෙන් යුතුව 2022 ඔක්තෝම්බර් 18 වැනි දින බෙල්ජියමේ ලංකා කුරුඳු සඳහා EU PGI තත්ත්වය ලබා දීම පිළිබඳ දැනුම්වත් කිරීම වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. 2023 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාවේ ඩෙස්ටිනේෂන් ක්ලැසික්-ශ්‍රී ලංකා 2023 මෝටර් රථ රැලියක් පැවැත්වීම සම්බන්ධයෙන් බෙල්ජියමේ ගමනාන්ත මෝටර් රථ රැලි සංවිධායකයින්ගේ සම්බන්ධීකරණය සහ සහාය ලබා දුන්නේය. ‘Global Questions’, ‘HardTalk’ සහ ‘Newsnight’ වැඩසටහන් ශ්‍රී ලංකාවේ දී චිත්‍රපටගත කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට බීබීසී මාධ්‍ය කණ්ඩායමකට සහාය විය. SVT ආයතනය විසින් ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරන ලද ‘Geographer’s visit Prime time’ විශේෂාංග වාර්තා චිත්‍රපටිය සඳහා සහාය විය. නෙදර්ලන්තයේ කෘෂිකාර්මික සහ ආහාර සැකසුම් අංශයේ ඇති විය හැකි සෘජු විදේශ ආයෝජන අවස්ථා සඳහා සාකච්ඡා ආරම්භ කිරීම සහ නෙදර්ලන්තයේ තොරතුරු තාක්ෂණ/ තොරතුරු තාක්ෂණ සක්‍රීයකරණ සේවා සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය සඳහා සාකච්ඡා ආරම්භ කිරීම. තුර්කි බඳවා ගැනීමේ සමාගමෙන් (AST Global) ලැබුණු රැකියා ඇණවුම් පහක් (5) ලියාපදිංචි කිරීමෙන් සේවකයින් 3,220 කට අධික සංඛ්‍යාවක් (ස්පා චිකිත්සකයින්-10, ස්වර්ණාභරණ සාදන්නන්-10, බර ට්‍රක් රථ රියදුරන් - 650 සහ හෝටල් සේවකයින් - 2,550) බඳවා ගැනීමට පහසුකම් සලසා ඇත. 2022 සැප්තැම්බර් 1-4 දිනවල ඉස්තාන්බුල් හිදී පැවති ලෝක ආහාර ප්‍රදර්ශනයට සහභාගී වූ අතර, ශ්‍රී ලාංකික සමාගම් දෙකකට (2) ව්‍යාපාරාන්තර රැස්වීම් සඳහා සහභාගී වීමට පහසුකම් සලසන ලදී. මොස්කව්හි ප්‍රධාන වෙළඳ ප්‍රදර්ශනයක් වන Prodexpo-2022 සඳහා සහභාගී වීමට ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් 40 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත පිරිසක් සංවිධානය කරන ලදී. 2023 දී ව්‍යාපාරික ප්‍රතිඵල සඳහා තිරසාර ආහාර, ගෘහභාණ්ඩ, රෙදිපිළි පිළිබඳව ස්විඩන ගෝලීය දාමය සහ ශ්‍රී ලංකා නිෂ්පාදන සමාගම් සමඟ ආයතනික සාකච්ඡා ආරම්භ කරන ලදී. 2023 වසරේ පළමු කාර්තුවේදී පැවැත්වීමට නියමිත බර්ලින් හි ‘අන්තර්ජාතික හරිත සතිය’ සහ ෆ්‍රැන්ක්ෆර්ට් හි ‘ඇම්බියන්ටෙ’ යන වැඩසටහන්වල ශ්‍රී ලංකා සහභාගීත්වය සඳහා පහසුකම් සපයන ලදී.

**ආරක්ෂක සහයෝගිතාව:** විදේශයන්හි පැවැති ආරක්ෂාව සම්බන්ධ රැස්වීම් කිහිපයකට ශ්‍රී ලංකා නිලධාරීන්ට පහසුකම් සැලසීම. කොළඹ පිහිටි ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩල සහ විදේශ දූත මණ්ඩල සම්බන්ධීකරණය තුළින් ශ්‍රී ලංකා නිලධාරීන් පුහුණු කිරීම සහ ධාරිතා ඉහළනැංවීම සඳහා පහසුකම් සැලසීම. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පුද්ගලයින්, කණ්ඩායම් සහ ආයතන පිළිබඳ යුරෝපා සංගම් ලැයිස්තුවේ ද්වි-වාර්ෂික සංශෝධනයේදී එල්ටීටීඊ සංවිධානය සඳහා යුරෝපා සංගමයේ තහනම දීර්ඝ කිරීම පිණිස යුරෝපීය බාහිර ක්‍රියාකාරී සේවයේ (EEAS) සම්බාධක ප්‍රතිපත්ති අංශයට යාවත්කාලීන තොරතුරු සපයන ලදී.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය/ විදේශීය ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ්-19 හා ආර්ථික අර්බුද ආශ්‍රිත ක්‍රියාකාරකම්:** මධ්‍යම සහ නැගෙනහිර යුරෝපයේ ඩියාගෝ ගාර්ෂියා (බ්‍රිතාන්‍ය ඉන්දියානු සාගර කලාපය) ඇතුළු ප්‍රදේශවල විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් කිහිප දෙනෙකු ආපසු ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම. යුක්රේනයේ, තුර්කියේ සහ ජෝර්ජියාවේ සිටින ශ්‍රී ලාංකිකයන් නැවත ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම.

**කොවිඩ්-19 ආශ්‍රිත ආධාර:** ප්‍රංශය, තුර්කිය, ජර්මනිය සහ සර්බියාව ඇතුළු රටවල් කිහිපයකින් හදිසි ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සඳහා පහසුකම් සලසන ලදී.

**ආර්ථික අර්බුදය ආශ්‍රිත සහය:** නෝර්වීජියානු රජය විසින් 2022 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාවට කරන ලද නෝර්වීජියානු ක්‍රෝනර් මිලියන 13ක (ආසන්න වශයෙන් LKR මිලියන 490) ප්‍රදානය එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අරමුදල (UNICEF), ලෝක ආහාර වැඩසටහන (WFP) සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) හරහා ලබාදෙන ලදී. ඉතාලි රජය විසින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමේ

අරමුණින් යුතුව ජූලි මාසයේදී ශ්‍රී ලංකාවට යුරෝ 300,000 ප්‍රදානය කිරීම සඳහා පහසුකම් සලසන ලදී. ක්ෂුද්‍ර ණය, පරිසර සංරක්ෂණය සහ හරිත තාක්‍ෂණය, සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව, සංස්කෘතිය, අධ්‍යාපනය සහ පුහුණු අවස්ථා තුළින් දිළිඳුකම පිටුදැකීම සහ තිරසාර සංවර්ධනය යන අංශ සඳහා ශ්‍රී ලංකාවේ අඩු වරප්‍රසාදිත ප්‍රජාවන්ට ලන්දේසි පුණ්‍යායතන මඟින් සපයන ලද ආධාර සඳහා පහසුකම් සපයන ලදී.

නිල සංචාර සඳහා සහ මානුෂීය ගැටලු සම්බන්ධයෙන් වීසා සඳහා පහසුකම් සලසන ලදී. ජෝර්ජියානු රග්බි සංගමය සහ ශ්‍රී ලංකා රග්බි සංගමය අතර සහයෝගීතාවයට පහසුකම් සලසන ලදී.

## 2.5.5 මැද පෙරදිග අංශය

**ද්විපාර්ශ්වික සබඳතා:** බලශක්ති ක්ෂේත්‍රයේ ඇති විය හැකි සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2022 මාර්තු 2 වැනි දින, අබුඩාබි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ එවකට අබුඩාබියේ ඔටුන්න හිමි කුමරු (වත්මන් ජනාධිපති) මොහොමඩ් බින් සයීඩ් අල් නහියන් කුමරු අතර දුරකථන ඇමතුමක් සලසා දුන්නේය. ඩෝහා හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කටාර් රාජ්‍යයේ අමීර්වයා වන, ෂෙයික් තමීම් බින් හමාඩ් අල් තානි සමඟ දුරකථන ඇමතුමට පහසුකම් සැලසූ අතර, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා 2022 මාර්තු 21 වැනි දින එකිනෙක රටවලට සහයෝගය දැක්වීමේ අපේක්ෂාවන් පිළිබඳව සාකච්ඡා කළේය. ද්විපාර්ශ්වික සබඳතා නංවාලීම සඳහා විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල සහාය ඇතිව පහත සඳහන් සංචාර ඇතුළු ඉහළ මට්ටමේ සංචාර සඳහා අංශය විසින් පහසුකම් සපයන ලදී.

i. සෞදි අරාබි රාජධානියේ විදේශ කටයුතු අමාත්‍ය ෆයිසාල් බින් ෆර්හාන් අල් සවුද් කුමරු 2022 මාර්තු 14 වැනි දින ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය;

ii. කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා 2022 මාර්තු 19-21 දිනවල සෞදි අරාබි රාජධානියේ නිරත වූ සංචාරය;

iii. 2022 ජනවාරි 3 වැනි දින පැවැති එක්ස්පෝ-ශ්‍රී ලංකා ජාතික දින උත්සවයට සහභාගී වීම සඳහා හිටපු විදේශ අමාත්‍ය ජී.එල්. පීරිස් මහතා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නිරත වූ සංචාරය. සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සහ මැණික් හා ස්වර්ණාභරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා ද මෙම අවස්ථාව සඳහා සහභාගී විය.

2022 ජූලි 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ සහ බහරේනයේ රාජ්‍යතාන්ත්‍රික සහ නිල විදේශ ගමන් බලපත්‍ර සඳහා වීසා අවශ්‍යතාවලින් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සම්පූර්ණ කරන ලදී. සමුද්‍ර විපත්වලට මුහුණ දීම සඳහා MARPOL සම්මුතිය යටතේ තාක්ෂණික සහාය ලබාදීම සඳහා ඊශ්‍රායල රජය එකඟ වී ඇත.

බහරේනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා 2022 දෙසැම්බර් 24 වන දින බහරේනයේ උසස් අධ්‍යාපන කවුන්සිලයේ මහලේකම් සහ එහි භාරකාර මණ්ඩලයේ උප සභාපතිනි ආචාර්ය ෂයිකා රනා බින්ට් ඉසා බින් ඩයිජ් අල් කලීෆා මහත්මිය හමුවී දෙරට අතර උසස් අධ්‍යාපනය සඳහා සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කළේය.

කුවේටයේ ශ්‍රී ලංකා තානාපතිවරයා කුවේට් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර උපලේකම්වරයා හමුවී කුවේට් රාජ්‍ය සෞඛ්‍ය සේවා අංශයේ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට රැකියා අවස්ථා ලබා දීම සඳහා රජයන් දෙක අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පියවර ගන්නා ලදී.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** වාර්තාකරණ කාල සීමාව තුළදී මෙම අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසා ඇත.

i. 2022 පෙබරවාරි මාසයේදී අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලේ (KFAED) නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී, අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල සහ ශ්‍රී ලංකා රජය, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමට සහ උපකරණ සැපයීමට ණය ගිවිසුමකට එළැඹිණි.

ii. දෝහා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගයෙන් යුතුව, 2022 මාර්තු 10-14 දිනවල දෝහා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ (DECC) දී පැවති කටාර්හි 9 වැනි ජාත්‍යන්තර කෘෂිකාර්මික ප්‍රදර්ශනයේ AgriteQ 2022 දී හි ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

iii. ටෙල් අවිව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කෘෂිකර්ම ක්ෂේත්‍රය (බීජ අල ගොවිතැන), කිරි ගොවිතැන සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍ර සඳහා ආයෝජන යෝජනා ලබාගෙන ඇති අතර, එම යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා එම අංශය අදාළ රේඛීය ආයතන සමඟ පසු විපරම් කර ඇත. මෙම තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවෙන් ඊශ්‍රායලයට තේ ආනයනය කිරීම සඳහා ඊශ්‍රායල වාණිජ මණ්ඩලය (FICC) හරහා ප්‍රමුඛ පෙළේ ඊශ්‍රායල සුපිරි වෙළෙඳසැල් ජාලයක් වන "Shufersal" වෙතින් වෙළඳ/ව්‍යාපාරික අවස්ථාවක් ලබා ගත්තේය. ටෙල් අවිව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ප්‍රමුඛ පෙළේ ඊශ්‍රායල සමාගමක් වන "M/s Green Field Foods Ltd." (ඊශ්‍රායලයේ විශාලතම කාබනික ආහාර තොග වෙළඳ සමාගමකි) වෙතින් ශ්‍රී ලංකාවෙන් කාබනික ආහාර (මි.ලී. 300, මි.ලී. 500 සහ ලීටර් 1 ටෙට්‍රා ඇසුරුමේ 20-22% මේදය අඩංගු කාබනික පොල් ක්‍රීම්) ඊශ්‍රායලයට ආනයනය කිරීමට ඊශ්‍රායල වාණිජ මණ්ඩලය (FICC) හරහා වෙළඳ/ව්‍යාපාරික අවස්ථාවක් ලබා ගත්තේය.

iv. ශ්‍රී ලංකාව සහ බහරේනය අතර ගුවන් සේවා ගිවිසුම යටතේ, බහරේනයට උපලේඛනගත ජාත්‍යන්තර මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගුවන් සමාගමක් ලෙස FITS Aviation (Private) Limited නම් කිරීම සඳහා කළ ශ්‍රී ලංකාවේ ඉල්ලීමට බහරේන් බලධාරීන්ගෙන් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

v. අබුඩාබි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඩුබායිහි කොන්සල් ජනරාල් කාර්යාලය සහ ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය එක්ව 2022 පෙබරවාරි 17 සිට 20 දක්වා ඩුබායි ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී ව්‍යාපාරික සංසදයක් සංවිධානය කරන ලදී.

vi. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීමට කැමති ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට/ ව්‍යවසායකයින්ට සහය වීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකා වෙළඳ කාර්යාලය (Sri Lanka Trade Office Dubai LLC) ඩුබායි හිදී පිහිටුවීමට ඩුබායිහි කොන්සල් ජනරාල්වරයා විසින් පහසුකම් සලසා ඇත.

vii. රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ජෙඩාහි කොන්සල් ජනරාල් කාර්යාලය, ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව Foodex 2022-Jeddah ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර, සවුදි අරාබි රාජධානිය වෙත ආහාර නිෂ්පාදන ආනයනය කරන සමාගම් කිහිපයක් සමඟ සබඳතාවයක් ස්ථාපිත කරන ලදී.

viii. ජෝර්දානයට ශ්‍රී ලංකා කෝපි හඳුන්වාදීම සඳහා Sri Lankan Arabica Coffee ප්‍රවර්ධන වැඩසටහනක් 2022 මාර්තු 23 දින පවත්වන ලදී.

ix. ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2022 මාර්තු 5 සිට 9 දක්වා ඕමාන් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ (OCCI) සභාපතිවරයාගේ නායකත්වයෙන් යුත් 17 දෙනෙකුගෙන් යුත් ඉහළ පෙළේ ඕමාන ව්‍යාපාරික දූත පිරිසකගේ පළමු සංචාරය සංවිධානය කරන ලදී. මෙම නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ පවතින වෙළෙඳ සහ ආයෝජන අවස්ථා පිළිබඳව ගවේෂණය කළහ.

x. 2022 මාර්තු 2 වැනි දින ඉරානයේ ලංකා තේ වෙළඳපොල පිළිබඳ සාකච්ඡාවක් සහ 2022 ජූනි 27 වන දින ටෙහෙරානයේදී "ගෝල්ඩන් පැරඩයිස් වීසා වැඩසටහන" පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්:** ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර මිනිස් බල ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුම යටතේ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම සඳහා මෙම අංශය සහ අබුඩාබි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී. මෙම රැස්වීම 2022 අප්‍රේල් 6 වැනි දින අතථ්‍ය ලෙස පැවැත්විණි. සමාලෝචිත කාල සීමාව තුළ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සම්බන්ධීකරණයෙන් යුතුව කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංක්‍රමණික සේවක කොන්ත්‍රාත්තු 48,883 ක් සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා විදේශ

සේවා නියුක්ති කාර්යාංශයේ වාර්තාවලට අනුව ශ්‍රී ලාංකිකයින් 59,690 දෙනෙක් කුවේට් හි රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගොස් ඇත. කුවේට් රෙඩ් ක්‍රෙසන්ට් සංගමය, කුවේට් ආධාර ජාලය, රෝගීන්ගේ සහකාර අරමුදල, කුවේට් ගැලවීමේ හමුදාව, කුවේට් මානුෂීය සහ මිත්‍රත්ව සංගමය, සමාජ සේවක සංගමය සහ සැන්ඩිගන් කුවේට් යන ආයතනවල සහාය ඇතිව, රෝහල්වල සිටි ශ්‍රී ලාංකිකයන් ඇතුළු අවදානමට ලක්විය හැකි ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ද පහසුකම් සලසා ඇත. බහරේනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා 2022 දෙසැම්බර් 27 වන දින කම්කරු හා සමාජ සංවර්ධන අමාත්‍ය සහ බහරේනයේ කම්කරු වෙළඳපොළ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා සමඟ පැවති රැස්වීමකදී කම්කරු සබඳතා පිළිබඳව සාකච්ඡා කළේය. රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සවුදි අරාබි රාජධානියේ විවිධ රැකියා කාණ්ඩ යටතේ නව රැකියා අවස්ථා 96,188 ක් නිර්මාණය කළේය. වාර්තා කරන කාලය තුළදී ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා 10,188 ක් ලබා ගෙන ඇත. බහරේනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය සහ බහරේනයේ ඇමරිකන් මිෂන් රෝහල සමඟ එක්ව 2022 ජුනි 17 වැනි දින නොමිලේ වෛද්‍ය කඳවුරක් සහ සායනයක් සංවිධානය කළේය.

**කොවිඩ් 19 ආශ්‍රිත ක්‍රියාකාරකම්:** ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ ඖෂධ සහ කඩිනමින් වෛද්‍ය සැපයුම් අවශ්‍ය වන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා කටාර්හි රෙඩ් ක්‍රෙසන්ට් සංගමය විසින් අ.ඩො. 100,000 ක මුදලක් වෙන් කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ දී කුවේට්හි රාජ්‍ය නොවන සංවිධානයක් සහ පෞද්ගලික අංශයේ ආයතන දෙකක් විසින් අ.ඩො. 35,000කට වඩා වටිනා වෛද්‍ය උපකරණ සහ උපකරණ මිලදී ගැනීමට දායක විය. ඕමාන් රජය 2022 සැප්තැම්බර් 16 වැනි දින අ.ඩො. 1,000,000 වටිනා වෛද්‍ය ආධාර ලබා දීමට එකඟ වී ඇති අතර අංශය අදාළ බලධාරීන් සමඟ පසු විපරම් කරමින් සිටී.

## 2.5.6 දකුණු ආසියානු අංශය

**ද්විපාර්ශ්වික සබඳතා:** දකුණු ආසියානු අංශය නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව 2022 දෙසැම්බර් 20 වැනි දින ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම ලේකම් (ඉන්දියානු සාගර කලාපය) පුනීත් අග්‍රවාල්ගේ සංචාරය සඳහා පහසුකම් සැලසීය. 2022 නොවැම්බර් මාසයේදී ප්‍රවාහන සහ සම්බන්ධතා ක්ෂේත්‍රවල සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රවාහන සහ මහාමාර්ග සහ ජනමාධ්‍ය බන්දුල ගුණවර්ධන මහතා ඉන්දියාවේ නිරත වූ සංචාරය සඳහා නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී. 2022 නොවැම්බර් මස නවදිල්ලියේ පැවති 'ත්‍රස්තවාදය සඳහා මුදල් නොදෙමු' අමාත්‍ය සමුළුවට නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය. නේපාල ලෝක කටයුතු කවුන්සිලය (NCWA) සමඟ එක්ව කත්මන්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාව සහ නේපාලය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 65 වැනි සංවත්සරය සැමරීම සඳහා දෙසැම්බර් 19 වැනි දින "නේපාල-ශ්‍රී ලංකා මිත්‍රත්වය: පුරාණ බැඳීම්වල සිට වර්තමානය දක්වා" යන මාතෘකාවෙන් සංවාදයක් සංවිධානය කරන ලදී. 2022 අයෝරා සංවිධානයේ හි උප සභාපතිත්වය දරන රට ලෙස 22 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා 2022 නොවැම්බර් 24 සිට 26 දක්වා විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා ඩකා වෙත කළ සංචාරයේදී අග්‍රාමාත්‍යවරිය, විදේශ අමාත්‍යවරයා සහ බංග්ලාදේශ නාවික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සමඟ පැවති හමුවීම් සඳහා ඩකා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී. මාලේ හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 නොවැම්බර් මස ඊජිප්තුවේ දී පැවති COP27 ලෝක නායක සමුළුවට සමගාමීව පරිසර අමාත්‍ය නසීර් අහමඩ් මහතා සහ මාලදිවයිනේ පරිසර, දේශගුණික විපර්යාස සහ තාක්ෂණ අමාත්‍යවරයාගේ රැස්වීම සම්බන්ධීකරණය කරන ලදී. ඉස්ලාබාද් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 දෙසැම්බර් මාසයේදී පාකිස්ථානයේ මුදල් අමාත්‍යවරයා සහ පාකිස්ථානයේ ක්‍රමසම්පාදන අමාත්‍යවරයා සමඟ රැස්වීම් සම්බන්ධීකරණය කරමින්, මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසකට පාකිස්ථානයට පැමිණීමට පහසුකම් සැලසීය. ඉස්ලාමාබාද් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් හයිද්‍රාබාද් සඳහා ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා පත් කිරීම විධිමත් කරන ලදී.

**බහුපාර්ශ්වික සබඳතා:** 2022 නොවැම්බර් 4 වැනි දින පැවති ලෝක එක්සත් ජාතීන්ගේ දින සැමරුම නිමිත්තෙන් මාලදිවයිනේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරන ලද උත්සවයට මාලේ හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලාංකික ජනතාවගේ සහ සංස්කෘතියේ විවිධත්වය ප්‍රදර්ශනය කරන කුටියක් සමඟින් සහභාගී විය.

නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, නව දිල්ලිය පදනම් කරගත් බහුපාර්ශ්වික සංවිධානවල (AALCO, AARDO, ISA, CDRI, NAM S&T Centre ඇතුළුව) රැස්වීම්වලදී ශ්‍රී ලංකාව සම්බන්ධීකරණය කර නියෝජනය කළේය.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** ඉස්ලාමාබාද් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 15 වැනි දින අතථ්‍ය ලෙස පවත්වනු ලැබූ පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර "වෙළෙඳාම, ආයෝජන සහ වාහන අංශය" පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වැනි රැස්වීම සඳහා පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ සහයෝගීතාවයෙන් යුතුව, 2022 සැප්තැම්බර් 29-30 සහ ඔක්තෝබර් 1 දක්වා දිනවල බංග්ලාදේශයේ පැවති 9 වැනි ආසියානු සංචාරක ප්‍රදර්ශනයට (ATF) සහභාගී විය. ඩකා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ (SLBC) සහාය ඇතිව බංග්ලාදේශ සංචාරක නියෝජිතයින් 5 දෙනෙකු සහ මාධ්‍යවේදීන් 2 දෙනෙකු සඳහා 2022 නොවැම්බර් 19 සිට 25 දක්වා MICE FAM චාරිකාවක් සංවිධානය කරන ලදී. විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා 2022 නොවැම්බර් 24 වැනි දින මහ කොමසාරිස්වරයාගේ නිල නිවසේ පැවති පිළිගැනීමේ උත්සවයක දී බංග්ලාදේශයේ ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව සහ බංග්ලාදේශ ව්‍යාපාරික වෘත්තිකයන් හමුවිය. මාලේ හි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා 2022 දෙසැම්බර් 15 දින මාලදිවයිනේ රාජ්‍ය වෙළඳ සංවිධානයේ (STO) කළමනාකාර අධ්‍යක්ෂවරයා හමුවී සහ රාජ්‍ය වෙළඳ සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ සමාගම් සඳහා පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳව සාකච්ඡා කළේය. මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා සහ Cey-Nor Corporation හි සභාපතිවරයා 2022 දෙසැම්බර් 29 දින මාලදිවයිනේ ධීවර, සමුද්‍ර සම්පත් සහ කෘෂිකර්ම අමාත්‍යවරයා හමුවී අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතාවක් ගොඩනගා ගැනීම සඳහා සහයෝගිතා ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව සාකච්ඡා කළහ. ශ්‍රී ලංකාවේ පොල් කෙඳි නිෂ්පාදන, පොල්කටු අඟුරු/සක්‍රිය කාබන් නිෂ්පාදන අපනයනකරුවන් පාකිස්ථාන ආනයනකරුවන්ට හඳුන්වා දීම සඳහා කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2022 ඔක්තෝබර් 12 වැනි දින වෙබිනාර් රැස්වීමක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ දියසිඳි පොල්, මේදය ඉවත් කළපොල්, පොල්තෙල් සහ වර්ජින් පොල්තෙල් නිෂ්පාදන අපනයනකරුවන් පාකිස්ථාන ආනයනකරුවන්ට හඳුන්වා දීම සඳහා කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2022 ඔක්තෝම්බර් 19 වැනි දින වෙබිනාර් රැස්වීමක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ සෙවිලි උළු/ පිඟන් මැටි බිම් සහ බිත්ති ටයිල්/ ලී බිම් නිෂ්පාදන අපනයනකරුවන් පාකිස්ථාන ආනයනකරුවන්ට හඳුන්වා දීම සඳහා කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2022 නොවැම්බර් 16 වැනි දින වෙබිනාර් රැස්වීමක් සංවිධානය කරන ලදී.

**මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය:** බංග්ලාදේශයේ සාර්ක් කාන්තා සංගමය විසින් සංගමයේ 25 වැනි සංවත්සරය වෙනුවෙන් 2022 නොවැම්බර් 5 වැනි දින වෙස්ටින් ඩකා හෝටලයේදී සංවිධානය කරන ලද පොළකට ඩකා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය. ඩකා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 නොවැම්බර් 23 වැනි දින බංග්ලාදේශයේ Daily Star පුවත්පතේ රාජ්‍යතාන්ත්‍රික වාර්තාකරු පොරිමොල් පල්මා මහතා සමඟ විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා සඳහා පුවත්පත් සම්මුඛ සාකච්ඡාවක් සහ 2022 නොවැම්බර් 25 දින බංග්ලාදේශයේ DBC නාලිකාව සමඟ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. 2022 නොවැම්බර් 7 වැනි දින නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දී ඉන්දියාව සඳහා ප්‍රථම ශ්‍රී ලංකා නියෝජිතයා වූ ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මැතිතුමාගේ උඩුකය පිළිරුවක් නිරාවරණය කරන ලදී.

**ආරක්ෂක සහයෝගිතාව:** දකුණු ආසියානු අංශය නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමග සම්බන්ධීකරණයෙන් යුතුව 2022 දෙසැම්බර් 13-15 දක්වා දිනවල ඉන්දියාවේ නාවික මාණ්ඩලික ප්‍රධානී (CNS) අද්මිරාල් ආර්. හරි කුමාර් මහතාගේ ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පහසුකම් සැලසීය. පාකිස්ථාන - ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ආරක්ෂක සංවාදයේ (AFDD) තුන්වැනි වටය 2022 නොවැම්බර් 16-17 දිනවල කරච්චි හි එක්ස්පෝ මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

**වෙනත්:** කත්මන්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2022 ඔක්තෝබර් 12 වැනි දින ලුම්බිණියේ ජාත්‍යන්තර බෞද්ධ සංගමය විසින් භාර දෙන ලද අ.ඩො. 25,000 වටිනා සාමාන්‍ය සේලයින් ටොන් 10 ක් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ඖෂධ මෙරටට එවන ලදී. 2022 නේපාල ජාත්‍යන්තර නාට්‍ය උළෙලේ (NITFest) ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා "රජා මං වහලා" වේදිකා නාට්‍ය කණ්ඩායමට පැමිණීමට කත්මන්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී. එම කණ්ඩායම 2022 නොවැම්බර් 26 දින සිට දෙසැම්බර් 4 දින දක්වා නේපාලයේ රැඳී සිටියහ. 2022

සැප්තැම්බර් 21 වැනි දින පාකිස්ථානයේ ගංවතුරෙන් විපතට පත් වූවන්ට ලංකා තේ තොගයක් පරිත්‍යාග කිරීම සඳහා ඉස්ලාමාබාද් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

## 2.5.7 අග්නිදිග ආසියානු අංශය

**ද්විපාර්ශ්වික සබඳතා:** අක්තගන්වන ලද ගමනාන්ත සමඟ වැඩිදියුණු කරන ලද දේශපාලන උපදේශන හරහා ද්විපාර්ශ්වික සහයෝගීතාව පුනර්ජීවනය කිරීම: රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 65 වැනි සංවත්සරය සැමරීම සඳහා මැලේසියාව සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු වටය, වියට්නාමය සමඟ ආර්ථික, විද්‍යාත්මක සහ තාක්‍ෂණ විද්‍යාත්මක සහයෝගීතා ඒකාබද්ධ කොමිසමේ 4 වැනි වටය, තායිලන්තය සමඟ දේශපාලන උපදේශනවල 5 වැනි වටය සහ සිංගප්පූරුව සමඟ විදේශ කාර්යාල උපදේශනවල පළමු වටය පැවැත්වීමට කටයුතු සූදානම් කිරීම. ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල 4 වැනි වටය 2022 ජනවාරි 24 වැනි දින අන්තර්ජාල ආකෘතිය හරහා සාර්ථකව පවත්වන ලදී. පහත කරුණු පිළිබඳ ද්විපාර්ශ්වික නෛතික ලේඛන මූලාරම්භ කිරීමට, අවසන් කිරීමට සහ අලුත් කිරීමට පියවර ගන්නා ලදී: පිලිපීනය සමඟ කෘෂිකර්මය, ආරක්ෂාව, සංචාරක කටයුතු, ගුවන් සේවා, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම සහ මත්ද්‍රව්‍ය අවභාවිතයට එරෙහිව සටන් කිරීම/ ඉන්දුනීසියාව සමඟ මැතිවරණ සහයෝගීතාව, නිර්මාණාත්මක ආර්ථිකය සහ ක්‍රීඩාව/ වියට්නාමය සමඟ අධ්‍යාපනය, රේගු කටයුතු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහය, කෘෂිකර්ම සහයෝගීතාව, අන්‍යෝන්‍ය ආරක්‍ෂාව සහ වර්ගීකරණය කළ තොරතුරු හුවමාරු කර ගැනීම/ තායිලන්තය සමඟ SEP සහ සංස්කෘතිය/ කාම්බෝජය සහ ලාඕසය සමඟ සංස්කෘතික සහයෝගිතාව, අධ්‍යාපනය, සංචාරක කටයුතු, වෙළඳාම, ක්‍රීඩා සහ වාණිජ කටයුතු. ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේදී ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 70 වැනි සංවත්සරය සැමරීම සඳහා පැවති දෙමුහුන් ආකෘතියේ වෙබිනාර් රැස්වීම සඳහා පහසුකම් සලසන ලදී.

**ඉහළ මට්ටමේ අන්තර්ක්‍රියා තුළින් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම:** 2022 සැප්තැම්බර් මාසයේදී පැවති ආසියානු සංවර්ධන බැංකුවේ පාලක මණ්ඩලයේ 55 වැනි වාර්ෂික රැස්වීමට සහභාගී වීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ පිලිපීනයේ ක්‍රියාකාරී සංචාරය (ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ පිලිපීනයේ ජනාධිපති ෆර්ඩිනන්ඩ් ආර්. ජූනියර් මහතා අතර ද්විපාර්ශ්වික හමුව 2022 සැප්තැම්බර් 29 වන දින පැවැත්විණි), ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සිංගප්පූරු සංක්‍රාන්ති සංචාරය සම්බන්ධීකරණය කිරීම, සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය විවියන් බාලක්‍රිෂ්ණන් මහතාගේ ආරාධනයෙන් 2022 ජූනි මාසයේදී විදේශ කටයුතු අමාත්‍ය (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා නිරත වූ සිංගප්පූරු සංචාරය සම්බන්ධීකරණය කිරීම. 2022 මාර්තු 20 සිට 24 දක්වා ඉන්දුනීසියාවේ බාලි හි පැවති 144 වන අන්තර් පාර්ලිමේන්තු සංගමයේ රැස්වීමට පාර්ලිමේන්තුවේ කථානායකවරයා ප්‍රමුඛ නියෝජිත පිරිසක් සහභාගී විය. මහජන ආරක්‍ෂාව පිළිබඳ අමාත්‍ය ටිරාන් අලස් මහතා, ඉහළ පෙළේ නියෝජිත පිරිසක් ද කැටුව 2022 ඔක්තෝබර් 25 සිට 29 දක්වා සිංගප්පූරුවේ නිල සංචාරයක නිරත විය. 2022 වසර සඳහා වූ දේශපාලන මට්ටමේ ඉහළ මට්ටමේ කටයුතු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා සිංගප්පූරුවේ නිරත වූ සංක්‍රාන්ති සංචාරයකින් අවසන් විය.

**බහුපාර්ශ්වික සබඳතා:** එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ASEAN, ARF, CPSC, UNESCAP සහ ReCCAP සමඟ නිතර සම්බන්ධ වීම සහ රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා හවුල්කාරිත්වයන් ගොඩනැගීම. විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා 2022 අගෝස්තු මාසයේදී කාම්බෝජයේ පැවති 29 වැනි ආසියාන් කලාපීය සංසදයට (විදේශ අමාත්‍ය මට්ටමේ) සහභාගී විය. අග්නිදිග ආසියා අංශයේ අධ්‍යක්ෂ ජනරාල් 2022 අප්‍රේල් මාසයේදී තායිලන්තය සහ එක්සත් ජනපදය සමඟ සම සභාපති ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ARF 13වැනි ISM අවි ප්‍රගුණනය නොකිරීම සහ නිරායුධකරණය (NPD) රැස්වීම සඳහා අතථ්‍ය ආකෘතියෙන් සහභාගී විය. සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික බලශක්ති භාවිතය පිළිබඳ සැසියේ මුලසුන ශ්‍රී ලංකාව විසින් දරන ලදී. 2022 මාර්තු 30 වැනි දින ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ලද 5 වැනි බිම්ස්ටෙක් සමුළුවේදී මියන්මාරය නියෝජනය කරමින් සංගමයේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය වුන්නා මවුන්ග් ල්වින් මහතා සහභාගී විය. 2022 මාර්තු 30 වැනි දින ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ලද 5 වැනි බිම්ස්ටෙක් සමුළුවේදී තායිලන්ත රාජධානිය නියෝජනය කිරීම සඳහා නියෝජ්‍ය අගමැති සහ විදේශ කටයුතු අමාත්‍ය දොන් ප්‍රමුද්විනායි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේය. ලෝක මුහුදු තෘණ දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් යෝජනාව සඳහා ඉන්දුනීසියාව සම අනුග්‍රහය දැක්වූ අතර එම යෝජනාව 2022 මැයි 23 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේදී සම්මත විය.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය: අක්තගන්වන ලද රටවල අනාගත ගැනුම්කරුවන්/ ආයෝජකයින් සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පාර්ශ්වයන් අතර ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට අන්තර්ක්‍රියා සඳහා අදාළ විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා පහසුකම් සැලසීම:**

i. **ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ඉන්දුනීසියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟ රැස්වීම් පැවැත්වීම, සංජීව ආයුර්වේද නිෂ්පාදන, දන්කොටුව පෝසිලේන් සහ ඩේවිඩ් පීරිස් මෝටර් රථ සමාගම වැනි ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර අතර රැස්වීම් සංවිධානය කිරීම, 2022 ජූලි මාසයේදී ජකර්තා එක්ස්පෝ හි සංචාරක ප්‍රවර්ධන උත්සවයක් සංවිධානය කිරීම.

ii. **මැලේසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකා තේ මණ්ඩලය, වාණිජ මණ්ඩල සහ ව්‍යාපාරික ආයතන සමඟ එක්ව මැලේසියාවේ ජාත්‍යන්තර ආහාර සහ පාන දෙමුහුන් වෙළඳ ප්‍රදර්ශනය (MIFB), Agro Commodity Expo සහ Selangor International Expo (F&B) යන වෙළඳ ප්‍රදර්ශන තුනක් සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කර පහසුකම් සැලසීම.

iii. **පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** කීර්තිමත් පිලිපීන සමූහ ව්‍යාපාරයකට (Aboitiz Group, Magsaysay Group සහ Frabelle Group) ආයෝජන අවස්ථා හඳුන්වා දෙන ලදී. දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ තොතුරු තාක්ෂණ සමාගම්වලට සහාය ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන පිලිපීනයේ ප්‍රමුඛ පෙළේ සිල්ලර වෙළඳ දාම (SnR, Robinsons යනාදී) වෙත ප්‍රවර්ධනය කර ඇත.

iv. **සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** අපනයන සංවර්ධන මණ්ඩලය සහ සිංගප්පූරුවේ මැණික් වෙළෙඳුන්ගේ සංගමය සමඟ එක්ව අතථ්‍ය මිලදී ගන්නන් -විකිණුම්කරුවන්ගේ රැස්වීමක් සංවිධානය කරන ලද අතර, ශ්‍රී ලංකාවේ වෙළෙඳ අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සහ සිංගප්පූරු සමාගම් අතර අතථ්‍ය ලෙස හෝ භෞතිකව ව්‍යාපාර අතර රැස්වීම් 100 කට වඩා සංවිධානය කරන ලදී. 2022 පළමු භාගය සඳහා සිංගප්පූරුවෙන් ශ්‍රී ලංකාවට අ.ඩො.මි. 6ක ඍජු විදේශ ආයෝජන ලැබී ඇත.

v. **වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම් වන ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම, මැලිබන් බිස්කට් නිෂ්පාදන සමාගම් සහ වියට්නාම සමාගම් අතර ව්‍යාපාර අතර රැස්වීම් පහසුකම් සලසන ලදී. වියට්නාම සංචාරක නියෝජිතයින් සඳහා ශ්‍රී ලංකාව වෙත පළමු හුරුපුරුදු වීමේ සංචාරය සංවිධානය කළ අතර, එම හුරුපුරුදු වීමේ සංචාරය සඳහා සහභාගී වූවන් සහ වියට්නාම මාධ්‍ය 12ක් සමඟ අතර මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022 මාර්තු මාසයේ දී සංවිධානය කරන ලදී.

vi. **මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකාව සහ මියන්මාරය අතර ඍජු ගුවන් සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා බලධාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. සැලකිය යුතු ආගමික සංචාරක ගමනාන්තයන් සම්බන්ධ කරමින් කොළඹ - යැංගුන් - බුද්ධගයාව හෝ කොළඹ - යැංගුන් - කත්මණ්ඩු අතර චාරිකා සම්බන්ධතාවය පිළිබඳ මූලාරම්භ කිරීම් සිදු කරන ලදී. 2022 - 2023 කාලය තුළ දී මියන්මාර තැම්බූ සහල් මෙට්‍රික් ටොන් 50,000 ක් සහ මියන්මාර සුදු සහල් මෙට්‍රික් ටොන් 100,000 ක් ශ්‍රී ලංකාවට සැපයීමට දෙරට අතර ද්විපාර්ශ්වික ගිවිසුමක් 2022 ජනවාරි මාසයේදී අත්සන් තබන ලදී.

vii. කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ රට තුළ හඳුනාගත් අනෙකුත් ස්ථාන වෙත ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා අක්තගත්වන ලද රටවල රාජ්‍ය සහ පෞද්ගලික අංශ සමඟ සාකච්ඡා මාලාවක් පවත්වන ලදී.

**ප්‍රදර්ශන/ අථත්‍ය සම්මන්ත්‍රණ සහ වෙනත් වේදිකා හරහා ශ්‍රී ලාංකේය නිෂ්පාදන/ සංචාරක කටයුතු ප්‍රවර්ධනය:** **ඉන්දුනීසියාව** - ජකර්තා හි බුන්ඩරන් HI MRT දුම්රිය ස්ථානයේ දී සංචාරක ප්‍රවර්ධන උත්සවයක් සංවිධානය කරන ලදී. **මියන්මාරය** - මියන්මාරය රජය විසින් නිල වශයෙන් සහ විවෘතව ශ්‍රී ලාංකික ආයෝජකයින්ට සහ තේ සහ පොල් නිෂ්පාදන ක්ෂේත්‍රවල විශේෂඥයින්ට මියන්මාරයේ ආයෝජනය කිරීම සඳහා ආරාධනා කර ඇත. **මැලේසියාව** - මැලේසියානු ආයෝජකයෙකු විසින් Mother Vessel පිළිබඳ ආයෝජන යෝජනාවකට සහභාගී වූ අතර, ආයෝජන මණ්ඩලය යටතේ ආයෝජනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සමඟ

අතථ්‍ය රැස්වීමක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව, මැලේසියානු සංචාරකයින් අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය සඳහා WorldTEX Tourism 2022 දෙමුහුන් උත්සවය සංවිධානය කර සහභාගී විය. **සිංගප්පූරුව** – International Tea and Coffee Asia, Specialty and Fine Food Asia, Singapore International Jewellery Expo, Food and Hotel Asia, Jewellery and Gem World, ILTM Asia Pacific යන සිංගප්පූරු වෙළෙඳ සහ සංචාරක ප්‍රදර්ශන හයක් සඳහා ශ්‍රී ලාංකීය සමාගම්වල සහභාගිත්වය සම්බන්ධීකරණය කරන ලදී. **වියට්නාමය** - 2022 මාර්තු මාසයේදී හැනොයි හි පැවති වියට්නාම් එක්ස්පෝ ප්‍රදර්ශනයට සහභාගී විය. **පිලිපීනය** - පිලිපීනයේ ශ්‍රී ලාංකික කිරිතේ හිමිකාරීත්වයක් වන අයිලන්ඩ් ටී සමාගම ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

**ආරක්ෂක සහයෝගිතාව:** ආරක්ෂක ආයතන අතර සහයෝගිතාව තහවුරු කිරීම/ අදාළ අක්තගන්වන ලද ගමනාන්තයන් විසින් පිරිනමනු ලබන ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා හමුදා නිලධාරීන්ගේ සහභාගිත්වය සම්බන්ධීකරණය කිරීම. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර ආරක්ෂක සහයෝගීතාවයේ අභිප්‍රාය ලිපියට අත්සන් තැබීමට ආරක්ෂක අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබාගෙන ඇත. මැනිලා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2022 අප්‍රේල් මාසයේදී 4 වැනි ආසියානු ආරක්ෂක, ආරක්ෂාව සහ කළමනාකරණය (ADAS) 2022 සඳහා සහභාගී වී ඇත. ආරක්ෂක සහයෝගීතාව, බුද්ධි හුවමාරු සහයෝගීතාව, දේශසීමා ඉක්මවන අපරාධ ක්ෂේත්‍රයේ සහයෝගිතාව, රැඩිකල්කරණය සහ ප්‍රචණ්ඩ අන්තවාදය යන ක්ෂේත්‍රවල අක්තගන්වන ලද ගමනාන්තවල ආරක්ෂක බලධාරීන් සමඟ අවබෝධතා ගිවිසුම් අවසන් කිරීමට පියවර ගන්නා ලදී.

**මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල/ දූත කාර්යාල මගින් සංවිධානය කරනු ලබන සිදුවීම්/ ක්‍රියාකාරකම් හරහා වෙළෙඳ, ආයෝජන, සංචාරක, විදේශ රැකියා, පුද්ගලයින් අතර සම්බන්ධතා වැනි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති ඵලදායී ලෙස ප්‍රවර්ධනය කිරීම සිදුකරන ලදී. අක්තගන්වන ලද ගමනාන්තවල ආයතන, සමාගම්, සංගම් විසින් සංවිධානය කරන සමාන සිදුවීම්වලට සහභාගී විය. 2022 මැයි මාසයේ දී පැවති ජය පිරිත් මහෝත්සවයට සහභාගී වූ මහා සංඝරත්නය වෙනුවෙන් මහාකරුණා බෞද්ධ සංගමය විසින් පරිත්‍යාග කරන ලද පිරිකර ලෙස සිවුරු 1000ක් ප්‍රවාහනය කිරීම සඳහා සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සලසා ඇත. 2022 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ ප්‍රවීණ විද්වතුන් විසින් රචිත පර්යේෂණ පත්‍රිකා හයක් වියට්නාමයේ VASS/IISAS විසින් ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සඟරා කලාපයෙන් ප්‍රකාශයට පත් කිරීම.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය, එතෙර ශ්‍රී ලාංකික සහ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්:** සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය සමඟ සහයෝගයෙන් යුතුව, සිංගප්පූරු රතු කුරුස සංවිධානය විසින් පරිත්‍යාග කරන ලද මූලික තොගයක් ලෙස දළ වශයෙන් සිංගප්පූරු ඩොලර් 68,000 ක් පමණ වටිනා අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය කරන ලදී. 2021 දෙසැම්බර් මාසයේදී මියන්මාර බලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන 2022 මාර්තු මාසයේදී නැවත මෙරටට ගෙන්වා ගත් ශ්‍රී ලාංකික ධීවරයින් 7 දෙනාට සමාව ලබා ගැනීමට යැංගුන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට හැකි විය. අග්නිදිග ආසියා කලාපයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා අත්කගන්වන ලද ගමනාන්තවල වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සුභසාධනය සඳහා කොන්සියුලර් ආධාර සැපයීම: නැවත මෙරටට ගෙන්වා ගැනීම, වීසා දීර්ඝ කිරීම සහ ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන විවිධ දුක්ගැනවිලි නිරාකරණය කිරීම, මරණ පිළිබඳව කටයුතු කිරීම, ශ්‍රම හා සුබසාධනය සම්බන්ධ බොහෝ ගැටළු විසඳා ඇත.

## 2.6 කාර්ය සාධන විශ්ලේෂණය: මෙහෙයුම් අංශ

### 2.6.1 කොන්සියුලර් කටයුතු අංශය

1981 අංක 4 දරන කොන්සියුලර් කාර්ය පනතට අනුව සහ පසුව 2006 අංක 18 දරන සංශෝධිත පනතට අනුව යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල පිහිටි කොන්සියුලර් කටයුතු අංශය සහ එහි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල, ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/දූත කාර්යාල හරහා මෙරට සහ විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ට සහාය වේ. කොන්සියුලර් කටයුතු අංශය එහි කොන්සියුලර් සේවාවන් අංශ පහක් එනම්; ලේඛන සත්‍යාපනය, නැවත ගෙන්වා ගැනීම, වන්දි ගෙවීම, විදේශයන්හි සිදුවන මරණ සහ විවිධ යන අංශ හරහා සපයයි.

සලකා බලනු ලබන කාලසීමාව තුළ දී අයදුම්කරුවන් 182,438 දෙනෙකුගේ ලේඛන 444,131 ක් සත්‍යාපනය කරමින් කොන්සියුලර් අංශයට ලැබුණු මුළු ආදායම රුපියල් 307,411,908 කි. මීට අමතරව, සමාලෝචිත කාල සීමාව තුළ දී, අයදුම්කරුවන් 10,690 කට සේවා සපයමින් ලේඛන 23,336 ක් සත්‍යාපනය කරමින් යාපනයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය වෙත ලැබුණු ආදායම රුපියල් 18,687,700 කි. අයදුම්කරුවන් 12,783 දෙනෙකුට සේවා සපයමින් ලේඛන 18,133 ක් සත්‍යාපනය කරමින් මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය වෙත ලැබී ඇති ආදායම රුපියල් 13,706,100 කි. අයදුම්කරුවන් 11,598 දෙනෙකුට සේවා සපයමින් ලේඛන 18,281 ක් සත්‍යාපනය කරමින් මහනුවර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය වෙත ලැබී ඇති ආදායම රුපියල් 14,202,400 කි. අයදුම්කරුවන් 7840 දෙනෙකුට සේවා සපයමින් ලේඛන 11,997 ක් සත්‍යාපනය කරමින් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය වෙත ලැබී ඇති ආදායම රුපියල් 9,389,100 කි. අයදුම්කරුවන් 20,009 කට සේවා සපයමින් ලේඛන 29,999 ක් සත්‍යාපනය කරමින් කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය වෙත ලැබී ඇති ආදායම රුපියල් 23,495,300 කි.

පහත වගුව-III මගින් වාර්තාකරණ කාල සීමාව තුළ දී අංශයේ සහ එහි ප්‍රාදේශීය කාර්යාලවල කොන්සියුලර් ලේඛන සත්‍යාපනය පිළිබඳ සංඛ්‍යාලේඛන සාරාංශගත කරයි.

### *වගුව-III - කොන්සියුලර් ලේඛන සත්‍යාපනය-2022 සංඛ්‍යාලේඛන*

| කොන්සියුලර් කාර්යාලය | සත්‍යාපනය කළ ලේඛන සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | ඉපැයූ ආදායම (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|---|
| කොළඹ (ප්‍ර/කා) | 444131 | 182,438 | 307,411,908 |
| යාපනය (ප්‍රා/කා) | 23,336 | 10,690 | 18,687,700 |
| මාතර (ප්‍රා/කා) | 18,133 | 12,783 | 13,706,100 |
| මහනුවර (ප්‍රා/කා) | 18,281 | 11,598 | 14,202,400 |
| ත්‍රිකුණාමලය (ප්‍රා/කා) | 11,997 | 7,840 | 9,389,100 |
| කුරුණෑගල (ප්‍රා/කා) | 29,999 | 20,009 | 23,495,300 |
| සමස්තය | 545,877 | 245,358 | 386,892,508 |

### *රූපය-III - කොන්සියුලර් ලේඛන සත්‍යාපනය-2022 ආදායම*



උප්පැන්න, විවාහ සහ මරණ සහතික මෙන්ම සා. පෙළ සහ උ. පෙළ විභාග සහතිකපත්‍ර කාර්යක්ෂමව සහතික කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් මෙම අංශයේ විද්‍යුත් ලේඛන සත්‍යාපන කිරීමේ පද්ධතිය (e-DAS) ඒකාබද්ධ කිරීම සඳහා, මෙම අංශය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වී ය. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික සත්‍යාපනය කිරීමේ කර්තව්‍ය සාර්ථකව පරීක්ෂා කරන ලදී. e-DAS හරහා ලබා දෙන අඛණ්ඩ සත්‍යාපන සේවාව වැඩිදියුණු කිරීමේ දී පවතින තොරතුරු තාක්ෂණ සම්බන්ධ ගැටළු විසඳීම සහ අවම කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සහ EPIC Lanka ඇතුළු අදාළ සේවා සපයන්නන්ගේ සහභාගීත්වයෙන් සහ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්විණි.

කොළඹ කොන්සියුලර් කටයුතු අංශය තුළ සහ යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල පිහිටි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලවලින් පිටත විශාල පිරිසක් එක්රැස් වීම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මොබිටෙල් හි ඊ-චැනලින් සේවය සමඟ එක්වූ මෙම අංශය 2022 සැප්තැම්බර් 29 වැනි දින ඊ- චැනලින් ක්‍රමය ඔස්සේ වේලාව වෙන් කරගැනීමේ සේවය නිල වශයෙන් හඳුන්වා දුන්නේ ය. අදාළ කාල සීමාව තුළ කොන්සියුලර් අංශය ලැබූ ප්‍රධාන ජයග්‍රහණයක් ලෙස මෙය සැලකිය හැකි ය. ඊ- චැනලින් පද්ධතිය e-DAS පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීමට ද සාකච්ඡා ආරම්භ කර ඇත.

සමාලෝචිත කාල සීමාව තුළ, මරණ 527 ක් (කොවිඩ්-19 හේතුවෙන් හටගත් මරණ 16 ක් සහ කොවිඩ්-19 නොවන මරණ 511 ක් ඇතුළුව) සමස්තයක් ලෙස මෙම අංශයට වාර්තා වූ අතර, විදේශයන්හි මියගිය ශ්‍රී ලාංකිකයින් 250 දෙනෙකුගේ මෘත දේහ ශ්‍රී ලංකාවට ගෙන එන ලද අතර මෘත දේහ 277 ක් ජීවිතක්ෂයට පත්වූවන්ගේ ළඟම ඥාතීන්ගේ කැමැත්ත පරිදි භූමදාන කරන ලදී. විදේශ මරණ සහතික, වෛද්‍ය වාර්තා, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා, මියගිය අයගේ අවලංගු කළ විදේශ ගමන් බලපත්‍ර ආදිය ලබා ගැනීම ඇතුළු අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය සහය, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සමඟ සහයෝගයෙන් මරණ පිළිබඳ අංශය විසින් ලබා දී ඇත. අදාළ කාලසීමාව තුළ එවැනි කොන්සියුලර් මරණ සහතික 324ක් අදාළ මියගිය පුද්ගලයන්ගේ ළඟම ඥාතීන් වෙත ලබා දීමට මෙම අංශයට හැකි විය. මියගිය ශ්‍රී ලාංකිකයන් 50 දෙනෙකුගේ පෞද්ගලික බඩු බාහිරාදිය මෙරටට එවීමට අනුමැතිය ලබා දුන් මෙම අංශය, ඉන් පුද්ගලයින් 41 දෙනෙකුගේ බඩු බාහිරාදිය ශ්‍රී ලංකාවේ සිටින අදාළ පවුල්වල සාමාජිකයින් වෙත ලබාදීමට සමත් විය.

මෙම කාලය තුළ ආසන්න වශයෙන්, ශ්‍රී ලංකා රුපියල් මිලියන 600.5 ක් (ළඟම ඥාතීන් වෙත සිදු කළ සෘජු ප්‍රේෂණ- ශ්‍රී ලංකා රුපියල් මිලියන 107.5 ක් සහ GDA වෙත ශ්‍රී ලංකා රුපියල් මිලියන 493 බැර කිරීම) විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල සහය ඇතිව, වන්දි/ලේ මුදල් සහ අනෙකුත් අයවිය යුතු ගෙවීම් ලෙස පවුලේ සාමාජිකයන්/ වින්දිතයන් 160 දෙනෙකු අතර බෙදා හැර ඇත. මෙම කාල සීමාව තුළ දූත මණ්ඩල / කාර්යාලවලින් ලැබුණු වන්දි මුදල් අතරින් වැඩිම වන්දි මුදල සෞදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් ලැබුණු අතර (ශ්‍රී ලංකා රුපියල් 31,151,680 ක්) ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් ශ්‍රී ලංකා රුපියල් 86,718,000 ක් ලැබිණි.

විදේශයන්හි අතරමංව සිටින/රඳවාගෙන සිටින ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ ඉල්ලීම මත සියරට පැමිණවීම සඳහා කොන්සියුලර් අංශයේ සියරට පැමිණවීමේ අංශය, ශ්‍රී ලංකා දූත මණ්ඩල/විදේශීය දූත කාර්යාල සහ පළාත් පාලන ආයතන සමඟ සෘජුව ගනුදෙනු කරයි. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ බන්ධනාගාර නඩු 120ක් ඇතුළුව සියරට පැමිණවීමේ කටයුතු 502ක් මෙම අංශය හරහා හසුරුවන ලදී. මෙම සිදුවීම්/ දුක්ගැනවිලිවලින් වැඩි ප්‍රමාණයක් රැකියා බලපත්‍ර ලබා ගැනීමේ අරමුණින් සංචාර වීසා මත ඕමානයට සහ ඉරානයට ඇතුළු වූ වින්දිතයන් හා සබැඳි ඒවා ය. මෙම අංශය ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකායේ (NAHTTF) රැස්වීම්වලට සහභාගී වූ අතර පුද්ගල ජාවාරම් (TIP) වාර්තා සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ද සැපයුවේ ය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2022 ජූලි 19 වැනි දින නිකුත් කරන ලද 2022 TIP වාර්තාව හරහා ශ්‍රී ලංකාව 2 වැනි ස්තරය වෙත උසස් කර ඇත. ශ්‍රී ලංකාව පසුගිය වසර තුන පුරාවටම නිරීක්ෂණ ලැයිස්තුවේ 2 වැනි ස්තරයේ රැඳී සිටි අතර, 3 වැනි ස්තරයට පහත වැටී අවධියේ දී එක්සත් ජනපද ආධාර මෙන්ම බහුපාර්ශ්වික සංවර්ධන බැංකුවල ආධාර සම්බන්ධයෙන් යම් සීමාවන්ට යටත් වීමට සිදු විය.

සමාලෝචිත කාල සීමාව තුළ විවිධ කොන්සියුලර් කටයුතු ගණනාවක් මෙම අංශයේ විවිධ අංශ මඟින් මෙහෙයවන ලදී. ශ්‍රී ලංකාවේ විවිධ විදේශ දූත මණ්ඩල/කාර්යාලවලින් විදේශ පොලිස් නිෂ්කාශන සහතික 422ක් ලබා ගැනීමට සහය විය. විදේශ ගමන් බලපත්‍ර ආශ්‍රිත කරුණු සඳහා සහය ලබා දීම (388), විදේශ උපාධි සහතික සත්‍යාපනය කිරීම (204), ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම (315), ශ්‍රී ලංකා රියදුරු බලපත්‍ර ඇතුළු විවිධ

කටයුතු 907 ක පමණ කටයුතු හැසිරවී ය. ධීවර යාත්‍රා 57ක් මුදා හැරීමට සහ ආපසු ගෙන්වීමට සහය වූ අතර ධීවරයින් 293 දෙනෙකු සියරට පමුණුවන ලදී. ශ්‍රී ලංකාවෙන් පිටත උපත ලද පුද්ගලයින් සඳහා උප්පැන්න සහතික 540ක් ලබා දෙන ලදී. අයදුම්කරුවන් 86 දෙනෙකුට ඔවුන් සතු 'යන්ත්‍රානුසාරයෙන් කියවිය නොහැකි ගමන් බලපත්‍ර' (NMRPs) තහවුරු කරගැනීමටත්, ඔවුන්ගේ දරුවන්ගේ උප්පැන්න ලියාපදිංචි කිරීම සඳහා අදාළ ලියකියවිලි තහවුරු කිරීමටත් සහය විය. පුරවැසි සහතිකපත්‍ර 33ක් අදාළ අයදුම්කරුවන් වෙත භාරදුන් අතර, පුරවැසි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවස්ථා 24කට ආසන්න ප්‍රමාණයකට සහය විය. ගල්ෆ් රටවල මරණ දණ්ඩනය නියම වූ පුද්ගලයන්ගේ කටයුතු 25 ක් තිබිණි. ඉන් තිදෙනෙක් නැවත මෙරටට එවන ලදී. නීතිමය කටයුතු, ජීව විද්‍යාත්මක දෙමාපියන් සිටින ස්ථානය සොයාගැනීම ආදී කටයුතු 35කට පමණ සහය විය.

ශ්‍රී ලංකා එතෙර දූත මණ්ඩල/කාර්යාලවල කොන්සියුලර් සම්බන්ධ කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ සමකාලීන කොන්සියුලර් ගැටලු හඳුනාගැනීමේ අරමුණින්, කොන්සියුලර් කටයුතු අංශය අදාළ රාජ්‍ය ආයතනවල සහ සම්පත් දායකයින්ගේ සහය ඇතිව, කොන්සියුලර් කටයුතු ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කළේ ය. ලේඛන සහතික කිරීම සඳහා වන කොන්සියුලර් ගාස්තු ව්‍යුහය සංශෝධනය කර ඇත.

ඉහත කරුණු වලට අමතරව, කොන්සියුලර් කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ලෙස පහත කමිටු/මණ්ඩල/සම්මුඛ සාකච්ඡා මඩුලුවලට සහභාගී විය. ද්විත්ව පුරවැසි කමිටුව, එක් ගොඩනැඟිල්ලක් තුළ විදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කිරීමට අදාළ කමිටුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කොන්සියුලර් පනත යටතේ අය කරන ගාස්තු සංශෝධනය කිරීමේ කමිටුව, ඉන්දියාවේ වෙසෙන අවතැන් වූවන්ට නැවත පැමිණීමට පහසුකම් සැලසීමේ කමිටුව, ඉන්දියාවේ සිට ආපසු පැමිණි ශ්‍රී ලංකාවේ සරණාගතයින්ගේ ගැටලු හඳුනාගෙන ඒවා විසඳීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ විශේෂ කමිටුව. විදේශයන්හි හඳුනාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල රැකියා සහ සුබසාධන අංශය සඳහා නිලධාරීන් පත්කිරීමේ කමිටුවේ සේවය කිරීම සඳහා අමාත්‍යාංශය නියෝජනය කරන ලදී. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල නව රැකියා සහ සුබසාධන අංශ පිහිටුවීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ මඩුල්ලට සහ නීති විරෝධී ධීවර කටයුතු ආශ්‍රිත ගැටළු පාලනය කිරීම සඳහා වන විශේෂ කාර්ය බළකා රැස්වීමට ද සහභාගි විය. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද කොන්සියුලර් ජංගම සේවා තුනකට කොන්සියුලර් අංශය සහභාගී විය.

## 2.6.2 සාමාන්‍ය පරිපාලන අංශය

සාමාන්‍ය පරිපාලන අංශය මෙම අමාත්‍යාංශයේ පරිපාලන ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ,අමාත්‍යාංශයේ සියලු මෙහෙයුම් හා නඩත්තු කටයුතු හා ශ්‍රී ලංකා විදේශ සේවයේ හැර අනෙකුත් සියලුම දීපව්‍යාප්ත සේවා , දෙපාර්තමේන්තුගත සේවා, ආශ්‍රිත සේවා, කළමනාකරණ සේවා, සහ තෘතියික සේවාවන්හි මානව සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනයට අදාළ ව පුළුල් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් කටයුතු කරයි. එසේම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, පාර්ලිමේන්තු කාරක සභා විමසීම් සඳහා පිළිතුරු සැපයීම සහ පාර්ලිමේන්තුව විසින් යොමුකරනු ලබන වෙනත් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සිදුකරනු ලබයි.

එදිනෙදා රාජකාරිවලට අතිරේකව සාමාන්‍ය පරිපාලන අංශය විසින් 2022 ජනවාරි 1සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ දී ඉටු කරන ලද විශේෂිත රාජකාරි වල සාරාංශය පහත දැක්වේ:

**මානව සම්පත් කළමනාකරණය:** නීති උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ පටිපාටියේ සංශෝධන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලදී. MN 4 කාණ්ඩයේ සහකාර සේවා නිලධාරීන් සඳහා පැහැදිලි සහ නිවැරදි වෘත්තීය ගමන්මඟක් නිර්මාණය කිරීම සඳහා, උසස්වීම් යෝජනා ක්‍රමයක් කෙටුම්පත් කරන ලදී. තවද, ඊට අනුමැතිය ලබාගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එය ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශයේ මානව සම්පත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ගත් කළ, සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම සහ සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, ආයතනික කාර්යපටිපාටි, PSC පටිපාටි රීති, තොරතුරු තාක්ෂණය, සේවා අවශ්‍යතා අනුව දෙවන භාෂා පුහුණුව යනාදී ක්ෂේත්‍ර

කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණු වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. කාර්යාල සහායක සේවයේ කාර්ය මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා සේවා ආචාර විධි පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

**තොරතුරු තාක්ෂණයේ වර්ධනයන්:** කොන්සියුලර් අංශයෙන් ලේඛන සහතික කරගැනීම සඳහා පැමිණෙන සේවා අපේක්ෂකයින් විශාල පිරිසකට පහසුකම් සැලසීම සඳහා විද්‍යුත් ලේඛන සත්‍යාපන පද්ධති කවුන්ටර පුළුල් කිරීම. කොන්සියුලර් කටයුතු අංශයට පැමිණෙන මහ ජනතාවගේ ඒකරාශී වීම විධිමත් කිරීමේ අරමුණින්, මොබිටෙල් ආයතනය සමඟ හවුල්කාරිත්වයෙන්, පහසු වේලාවක් වෙන් කරගැනීමේ ක්‍රමයක් මහ ජනතාවට හඳුන්වා දීම. අමාත්‍යාංශයේ වත්කම් ගනුදෙනු ඩිජිටල් අයුරින් වාර්තා කිරීම සඳහා වත්කම් කළමනාකරණ මොඩියුලය සකස් කරන ලදී. ගනුදෙනු පිළිබඳ තොරතුරු වත්කම් කළමනාකරණ පද්ධතියට එකතු කෙරේ. තොරතුරු තාක්ෂණ අංශය, ඉහළ පෙළේ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික අතථ්‍ය / දෙමුහුන් රැස්වීම් සඳහා තාක්ෂණික සහය අඛණ්ඩව ලබා දුන් අතර 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අමාත්‍යාංශයේ පැවති අතථ්‍ය රැස්වීම් 300 කට අධික සංඛ්‍යාවක් සඳහා සාර්ථකව සිය තාක්ෂණික සහාය ලබා දුන්නේ ය.

**පාර්ලිමේන්තු කටයුතු:** අමාත්‍ය මණ්ඩල සංදේශ රැසකට අදාළ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට අමතරව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 32ක් ඉදිරිපත් කිරීම යනාදිය අමාත්‍ය මණ්ඩල කාර්යාලය සමඟ කාර්යක්ෂමව සම්බන්ධීකරණය කරන ලදී. පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම, අමාත්‍ය උපදේශක කාරක සභාවට සහ මහජන පෙත්සම් කාරක සභාවට වාර්තා ඉදිරිපත් කිරීම යන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**ප්‍රසම්පාදන සහ නඩත්තු කටයුතු:** අදාළ රෙගුලාසිවලට අනුකූලව සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති අතර, ශ්‍රී ලංකා දූත මණ්ඩලවල අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 9.4 ක වටිනාකමකින් යුත් ප්‍රසම්පාදන පරිමාවක් ලබා දුන් අතර, 2022 දෙසැම්බර් 31 වැනි දින වන විට දේශීය අවශ්‍යතාවලට අදාළ මිලදී ගැනීම් සඳහා තවත් රුපියල් මිලියන 99.27 ක් වැය විය. ජනරජ ගොඩනැඟිල්ලේ පුරාවිද්‍යාත්මක වටිනාකම සහ අලංකාරය ආරක්ෂා කරමින් එහි නඩත්තු කටයුතු විධිමත්ව සහ අඛණ්ඩව සිදු කරන ලදී. ජනරජ ගොඩනැඟිල්ල නඩත්තු කිරීමේ පිරිවැය 2022 වසර සඳහා රුපියල් මිලියන 2.7 ක් විය. මීට අමතරව, 2022 වසරේ දී රුපියල් මිලියන 1.9 ක සමස්ත වියදමක් දරමින්, අදාළ අලුත්වැඩියා කටයුතු ඇතුළුව නිල නිවාස 27 ක නඩත්තු කටයුතු සිදු කරන ලදී. මෙම අමාත්‍යාංශයට පවරා තිබූ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යාල අවකාශයේ අංශ තුනක් වෙනත් ස්ථානයකට ගෙන යන ලදී. එම කාර්යාල අවකාශය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 7ක වියදමක් දරන ලදී.

**ප්‍රවාහන සේවා:** වාහන පිළිබඳ වාර්තා සහ වාහන ආශ්‍රිත නඩත්තුව පවත්වාගෙන යාම සඳහා වත්කම් කළමනාකරණ පද්ධතිය යටතේ සංරචකයක් සකස් කර ඇත. සැලකිය යුතු රියදුරන් සංඛ්‍යාවක් සමඟින් වාහන 77 කින් යුත් සමූහයක් කාර්යක්ෂමව භාවිතා කරන ලදී. නව වාහන මිලදී ගැනීම් සිදු කිරීමේ දී, මහජන මූල්‍ය අපහසුතා මත අමතර බරක් පැටවීමකින් තොරව, ධාවන කාල නඩත්තුව සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සහිතව දැනට පවතින වාහන සමූහය යොදාගැනීම සඳහා අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගන්නා ලදී.

**ක්‍රියාකාරී සැලැස්ම-2022 මත පදනම් වූ ප්‍රමුඛතා ක්ෂේත්‍ර: විදේශ දූත මණ්ඩල/ කාර්යාල සඳහා පොදු වෙබ් අඩවියක් හඳුන්වාදීම -** දැනට විවිධ වාණිජ අඩවි යටතේ ලියාපදිංචි කර ඇති වෙබ් අඩවි නාමය gov.lk නමැති සම්මත නාමය බවට පත් කිරීම. දූත මණ්ඩල හතක් දැනටමත් gov.lk නාමය වෙත මාරු කර ඇති අතර අනෙකුත් දූත මණ්ඩල/ කාර්යාලවලට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී. ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම 2023 ජනවාරි මාසයේ දී ආරම්භ කෙරේ.**මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ දැනුම යෙදීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම-** කාර්යාල කටයුතු සඳහා ඉවහල් වන සයිබර් ආරක්‍ෂාව සහ තොරතුරු තාක්‍ෂණය භාවිතා කිරීමේ හොඳම භාවිතයන් පිළිබඳව අවධානය යොමු කරමින් අමාත්‍යාංශයේ සේවකයන් සඳහා තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී. **වත්කම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම-** වත්කම් කළමනාකරණ පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. නියමු වැඩසටහන අවසන් කර ඇත. මේ වන විට එම පද්ධතියට දත්ත ඇතුළත් කෙරෙමින් පවතී. **ලේඛන කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම:** අමාත්‍යාංශය සඳහා සංවර්ධනය කිරීමට නියමිත ලේඛන කළමනාකරණ පද්ධතියේ විෂය පථය තොරතුරු තාක්ෂණ ඒකකය විසින් මේ වන විට විශ්ලේෂණය කෙරෙමින් පවතී. සංවර්ධනය සඳහා යටිතල පහසුකම් ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර පද්ධති සංවර්ධනය සිදු වෙමින් පවතී. 2023 පළමු කාර්තුව තුළ

එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ. **අමාත්‍යාංශය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම:** විදේශ කටයුතු අමාත්‍යාංශය එක් ගොඩනැඟිල්ලක පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 සැප්තැම්බර් 6 වැනි දින ලබා ගත් අතර, එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 2.6.3. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත කාර්යාලවලට අවශ්‍ය ප්‍රමාණවත් මානව සම්පත් පහසුකම් නියමිත වේලාවට සැපයීම සහතික කිරීම යි. තවද, විදේශයන්හි ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට සිය මානව සම්පත් අවශ්‍යතා සහ අදාළ පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය විධානයන් මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය විසින් සපයනු ලැබේ. සමාලෝචනයට ලක් වූ කාල සීමාව තුළ, මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/කාර්යාල හැටක් (60) සමඟ නිරන්තර අන්තර්ක්‍රියා පැවැත්වී ය. තවද, අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව, තාවකාලිකව වසා දැමූ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/කාර්යාලවලට අනුයුක්තව සිටින සියරට පේරුවේ සහ දේශීය කාර්ය මණ්ඩලවලට සම්බන්ධ සියලු කටයුතු සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය දායක විය.

**දූත මණ්ඩල/කාර්යාල සඳහා නව ප්‍රධානීන් පත් කිරීම:** මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ඉතාලිය, මැලේසියාව, දකුණු අප්‍රිකාව, මියන්මාරය, මාලදිවයින, දකුණු කොරියාව, ඕමානය, ජෙඩා (සෞදි අරාබිය), ටොරොන්ටෝ (කැනඩාව), මෙල්බර්න් (ඕස්ට්‍රේලියාව), ග්වැන්ෂු (චීනය), ටෝකියෝ, අන්කාරා සහ මෙල්බර්න් හි දූත මණ්ඩල/ කාර්යාලවල ප්‍රධානීන් දාහතර (14) දෙනෙකුගේ පත්වීම් හා සබැඳි විධිමත් කටයුතුවලට සහභාගි විය. තවද, ඕස්ට්‍රේලියාව, බහරේනය, ඉතියෝපියාව, ප්‍රංශය, ජර්මනිය, ඊශ්‍රායලය, ජපානය, ජෝර්දානය, කුවේට්, ලෙබනනය, නේපාලය, සෞදි අරාබිය, පිලිපීනය, තුර්කිය, වියට්නාමය සඳහා නව දූත මණ්ඩල/කාර්යාල ප්‍රධානීන් දහඅටක් (18) පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ස්විට්සර්ලන්තයේ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල ප්‍රධානියා සහ ඉතාලියේ මිලාන් සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි කොන්සල් ජනරාල්වරුන් පත් කිරීම හා සබැඳි කටයුතුවලට අදාළ පියවර ද ගන්නා ලදී. දූත මණ්ඩල/කාර්යාල ප්‍රධානීන් දහඅට දෙනෙකුගේ (18) රාජකාරී චාරිකා අවසන් කිරීමට අදාළ විධිමත් කටයුතු සඳහා ද මෙම අංශය දායක විය.

**විදේශ සේවා නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම්:** ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හතළිස් නව දෙනෙකු (49) රාජ්‍යතාන්ත්‍රික පත්වීම් සඳහා විදේශයන්හි තෝරාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාල වෙත මාරු කරන ලදී. විදේශ දූත මණ්ඩලවල සිය රාජකාරි නිම කළ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හය දෙනෙකුගේ (6) ස්ථාන මාරු ලබා දෙන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සම්බන්ධීකරණය/අනුමැතිය අනුව, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් දාහතර දෙනෙකු (14) මීළඟ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි ද මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය විසින් සකස් කරන ලදී. තවද, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හතර දෙනෙකුගේ (4) විශ්‍රාම ගැන්වීම් ක්‍රියාවලියට අදාළ අවශ්‍ය විධිවිධාන සැලසීම සඳහා මෙම අංශය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ බලධාරීන්ගේ සම්බන්ධීකරණය යටතේ සිය දායකත්වය සැපයී ය. 2016 ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවේ විශේෂ ශ්‍රේණියේ විධිවිධාන ආයතනගත කිරීමේ අදහසින්, මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා සබැඳි කටයුතු සමඟ සාධනීය ලෙස සම්බන්ධ වෙමින් එම කටයුතු ආරම්භ කර සම්බන්ධීකරණය කිරීමේ කටයුතු සිදු කළේ ය. පළමු සම්මුඛ පරීක්ෂණය 2022 ජූලි 1 වැනි දින පවත්වන ලදී. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ සලකා බැලීම සහ අවසාන අනුමැතිය/උසස් කිරීම ලබා දීම සඳහා, එම නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය:** මීට පෙර විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල සේවය කර ඇති අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා නිලධාරීන්, එළඹෙන *"විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරීන්ගේ 2020 (2022) සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට"* පෙනී සිටීම සඳහා අවසර ඉල්ලා යොමු කළ අභියාචනාවලට විසඳුම් සෙවීම සඳහා මෙම අංශය විසින් මූලිකත්වය ගන්නා ලදී. එලෙසම, මීට පෙර විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල සේවය කළ අමාත්‍යාංශයේ පුද්ගලික සහකාරවරුන් එළඹෙන *"විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුද්ගලික සහකාර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගයට"* පෙනී සිටීමට අවස්ථාව ඉල්ලමින් ඉදිරිපත් කළ අභියාචනාවලට අනුව, එම පුරප්පාඩු පිරවීම සඳහා ද පහසුකම් සපයන ලදී. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාලවල සිය සේවා කාලය සම්පූර්ණ කළ සේවකයින්ගෙන් ලැබුණු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආපසු ගෙවීම සඳහා වන අයදුම්පත් හතළිස් පහක් (45) මෙම අංශය විසින් සකස් කර ඊට පහසුකම් සලසන ලදී.

**රාජ්‍ය වියදම් පාලනය කිරීම:** විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල කටයුතු කළමනාකරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලද විවිධ මූලපිරීම් සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය දායක විය. වියදම් සීමා කිරීම, එක් එක් දූත මණ්ඩල / කාර්යාල සඳහා වෙන් කර ඇති කාර්ය මණ්ඩලය සීමා කිරීම සහ එක් එක් දූත මණ්ඩල / කාර්යාල සඳහා අනුමත කර ඇති සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම යනාදිය ඊට ඇතුළත් ය. තවද, රාජ්‍ය වියදම් පාලනය කිරීමේ කොටසක් ලෙස, සියරට පේරුවේ කළමනාකරණ සේවා නිලධාරීන් තිස්දෙදෙනෙකුගේ සේවා කාලය ආදේශ කිරීමකින් තොරව අවසන් කරන ලදී. ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවලට අනුයුක්තව සිටි පුද්ගලික සහකාරවරුන් දහතුන්දෙනෙකු (13) සහ අනෙකුත් රාජ්‍යතාන්ත්‍රික නොවන නිලධාරීන් තිදෙනෙකු (3) සිය රාජකාරි නිම කිරීමෙන් අනතුරුව, කිසිදු ආදේශයකින් තොරව ඔවුන්ගේ සේවා කාලය අවසන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**වගකීම් පිළිබඳව වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීම:** විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල කාර්ය මණ්ඩල සම්බන්ධ කරුණු පිළිබඳ වාර්තා සකස් කිරීම සහ දීමනා ගෙවීම සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල වියදම් ක්‍රියා පටිපාටි ආදියට අදාළ ඕනෑම පැහැදිලි කිරීමක් මෙම අංශය මඟින් කාර්යක්ෂමව සිදු කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලය, විගණකාධිපති, පාර්ලිමේන්තු මහලේකම්, ගරු නීතිපතිවරයා සහ ජනාධිපති කොමිෂන් සභා යනාදිය මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ විෂය පථය යටතේ ඇති දූත මණ්ඩල කාර්ය මණ්ඩලය සහ විදේශ දීමනා කළමනාකරණය සම්බන්ධයෙන් යොමු කළ විමසීම්වලට මෙම අංශය විසින් පිළිතුරු සපයන ලදී. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ විමසීම්, පාර්ලිමේන්තු ප්‍රශ්න, සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාලවලට අනුයුක්තව සිටින රාජ්‍යතාන්ත්‍රික සහ රාජ්‍යතාන්ත්‍රික නොවන නිලධාරීන්ට එරෙහි පැමිණිලිවලට අදාළ කරුණු අදාළ බලධාරීන් සහ දූත මණ්ඩල/කාර්යාලවල ප්‍රධානීන් සමඟ කාලෝචිත අයුරින් සහ රහසිගතභාවය සුරක්ෂිත කරමින් සම්බන්ධීකරණය කරන ලදී.

මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ අපේක්ෂිත ඵලදායිතාව සහතික කිරීමේ අරමුණින්, එම අංශයේ විෂය පථය යටතට ගැනෙන අදාළ සියලු කටයුතු සහ දැනට ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් විදේශ ලේකම්වරයාගේ නියමයන්ට අනුව ස්ථාපිත රෙගුලාසි / ක්‍රියා පටිපාටිවලට අනුකූලව සහ අදාළ බලධාරීන්ගේ / අංශවල කැමැත්ත / නිරීක්ෂණ / නිර්දේශ මත සිදු කරන ලදී. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල ඵලදායී මානව සම්පත් කළමනාකරණය සහතික කිරීමේ අදහසින්, එක් එක් අධීක්ෂණ නිලධාරියා විසින් මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය යටතේ ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රගතිය නිරන්තරව ඇගයීමට ලක් කරන ලදී.

**මුහුණ දුන් අභියෝග:** ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතය දරුණු අන්දමින් ව්‍යාප්ත වූ පසුබිමක, "නිලධාරින්ගේ සීමාව රාජ්‍ය නිලධාරීන්ට සීමා කිරීම" යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුව අනෙකුත් රාජ්‍ය අංශයේ නිලධාරීන් වටමාරු පදනම මත නිවසේ සිට දුරස්ථව තම රාජකාරි ඉටු කළ අතර, මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයට අනුයුක්ත නිලධාරීන් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල මානව සම්පත් සම්බන්ධ කාර්යයන් සුමට ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අමාත්‍යාංශය වෙත පැමිණ සිය රාජකාරිවල නිරත විය.

**දූත මණ්ඩල ප්‍රධානීන්ගේ දේශීය/ජාත්‍යන්තර සංචාර:** සමාලෝචිත කාල සීමාව තුළ, දූත මණ්ඩල/කාර්යාලවල ප්‍රධානීන්ගේ නිල සංචාර විසිඑකක් (21) සඳහා අවශ්‍ය අනුමැතිය සහිතව පහසුකම් සලසා ඇත.

## 2.6.4. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල /දූත කාර්යාල සහ මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ එන අනෙකුත් ආයතනවල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය අධීක්ෂණය හා ඇගයීම සහ සමස්ත කාර්ය සාධනය සහ අනුකූලවීම් සඳහා මඟ පෙන්වමින් ආයතනයේ මෙහෙවරට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් ලබා දීමයි.

i. අමාත්‍යාංශය, අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අනෙකුත් ආයතන සහ විදේශයන්හි දූත මණ්ඩල / කාර්යාල සඳහා මෙම අංශය විසින් විගණන විමසුම් 9ක් ඉදිරිපත් කර ඇත.

ii. 2019මාර්තු මස 6 වැනි දින එක් එක් අංශ හා පක්ෂ සමඟ සම්බන්ධීකරණයෙන් පැවැති මහජන ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත.

iii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලද අතර එහි තීරණ සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කරන ලදී.

iv. සාමාන්‍ය විගණන විමසුම් 21 න් 18 ට පිළිතුරු සම්පාදනය කිරීම සඳහා සම්බන්ධීකරණය කරන ලදී.

v. අමාත්‍යාංශය නියෝජනය කරමින් රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සම්බන්ධ මහාධිකරණ නඩු දෙකක් සඳහා තොරතුරු ලබා දෙන ලදී.

## 2.6.5 නීති අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ, අමාත්‍යාංශ ලේකම්වරයා හරහා අමාත්‍යවරයාට, විදේශ අමාත්‍යාංශයේ අනෙකුත් අංශ වෙත, විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවලට මෙන්ම වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වෙත ජාත්‍යන්තර නීතිය හා සම්බන්ධ කරුණු පිළිබඳව නීති උපදෙස් ලබා දීම යි .ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් තැන්පතුව ද නීති අංශය භාරයේ පවතී .තවද, සියලුම ප්‍රතිපත්තිමය තීරණවල නීතිමය අංශ සහ විශේෂයෙන්, භූමි ප්‍රදේශ පිළිබඳ හිමිකම් සහ සීමාවන්, ත්‍රස්තවාදය හා සම්බන්ධ ගැටලු, ගිවිසුම් සබඳතා පිළිගැනීම, රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද, එක්සත් ජාතීන්ගේ සම්බාධක තන්ත්‍රය සහ ඒකපාර්ශ්වික සම්බාධක යනාදිය වැනි, ජාත්‍යන්තර ගැටලු සම්බන්ධයෙන් උපදෙස් සපයයි .විවිධ විද්වත් කමිටු තුළ නීති අංශයේ නිලධාරීන් ද අමාත්‍යාංශය නියෝජනය කරති.ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක :PS/SP/SB/ චක්‍රලේඛය 06/2019/ප්‍රකාරව, 2022 ජනවාරි මස 1 සිට දෙසැම්බර් 31 දක්වා කාල රාමුව තුළ නීති අංශය විසින් අවබෝධතා ගිවිසුම් 280 කට වැඩි ප්‍රමාණයක් සඳහා නීතිමය නිරීක්ෂණ /නීතිමය නිෂ්කාශන ලබා දී ඇත .ඉහත කරුණු වලට අමතරව, නීති අංශය පහත සඳහන් සැලකිය යුතු ප්‍රධාන කාර්ය සාධනයන් අත්කර ගෙන ඇත.

**සාගර නීතිය:** ජාතික සාගර කටයුතු කමිටුවේ (NOAC) කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ නීති අංශය විසිනි. මහාද්වීපික තටකයේ පිටත සීමාවන් පිළිබඳ කටයුතු නිම කිරීමට අදාළව ශ්‍රී ලංකාවේ මහාද්වීපික ආන්තිකය ස්ථාපිත කිරීමට අවශ්‍ය නිර්ණායක හතර ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණ කරන ලද බවට වන ශ්‍රී ලංකාවේ ප්‍රකාශය ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටාකයේ සීමාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාව විසින් පත් කරන ලද උප-කොමිසම (UNCLOS) තාවකාලිකව පිළිගෙන ඇත. 350M (නාවික සැතපුම්) සීමාව ශ්‍රී ලංකාවට අදාළ කරගැනීමට එරෙහිව මතු වූ තර්ක, 2022 ඔක්තෝබර් 25 සිට නොවැම්බර් 2 දක්වා පැවැති එක්සත් ජාතීන්ගේ උපකොමිසම සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා වන කමිටුව සමඟ වැඩිදියුණු කරන ලදී.

**නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) පිළිබඳ ද්විපාර්ශ්වික සාකච්ඡා:** නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පිහිටුවා ඇති ආයෝජන නෛතික ක්‍රියාකාරී කණ්ඩායම් තුළ නීති අංශය නියෝජනය වන අතර පහත සඳහන් කර්තව්‍යයන් සඳහා සිය දායකත්වයන් ලබා දී ඇත.

පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා ඉදිරි මාවත සැකසීම සම්බන්ධයෙන් ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව සමඟ සම්බන්ධ වී ඇත:

i. චීනය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම;

ii. තායිලන්තය සමඟ වරණීය වෙළෙඳ ගිවිසුම;

iii. සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ සමාලෝචනය; සහ

iv. 2023 ජනවාරි මාසයේ පැවති සාකච්ඡාවලට පෙර තායිලන්තය සමඟ පවත්නා නිදහස් වෙළෙඳ ගිවිසුමේ පාඨය සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලදී.

**ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම්:** නීති අංශය යනු ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සඳහා වන කේන්ද්‍රස්ථානයයි.

**තුර්කිය-** තුර්කිය සමඟ ආරම්භ කරන ලද ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් නීතිපති සමාලෝචනය සඳහා ශ්‍රී ලංකාවේ නව BIT ආකෘතියට අනුකූලව සංශෝධනය කරන ලදී. **එක්සත් අරාබි එමීර් රාජ්‍යය-** ගිවිසුමේ පාඨය අවසන් කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ නීතිපතිවරයා සමඟ සම්බන්ධ වීම. ජාතික අධිකරණ බල ප්‍රදේශවලින් ඔබ්බට (BBNJ) පිහිටි සමුද්‍ර ජෛව විවිධත්වය පිළිබඳව යෝජිත, ජාත්‍යන්තර වශයෙන් බැඳීමක් සහිත නීතිය පිළිබඳ අන්තර්-රාජ්‍ය සාකච්ඡා පවත්වන ලදී. 3 වැනි අන්තර් රාජ්‍ය සාකච්ඡා සඳහා සිය නියෝජනය ලබා දුන් නීති අංශය, සාකච්ඡාවට බඳුන් වූ තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳව ශ්‍රී ලංකාව දක්වන උනන්දුව තහවුරු කළේ ය.

***මුක්තිය සහ වරප්‍රසාද:*** *හරිත දේශගුණික අරමුදල (GCF) සහ සත්කාරක රට අතර ගිවිසුම අවසන් කිරීම හා සබැඳි ගැටලු සාකච්ඡා කිරීම සඳහා පවත්වන ලද අන්තර් අමාත්‍යාංශ රැස්වීම්වලට සහභාගී විය. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) අතර සත්කාරක රාජ්‍ය ගිවිසුමට ප්‍රවේශ වීමේ නෛතික උපකරණය පිළිගැනීමට සහ තැන්පත් කිරීමට අවසන් අවසරය ලබා දී ඇත. ශ්‍රී ලංකා රජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර සත්කාරක රාජ්‍ය ගිවිසුම අවසන් කරන ලද අතර 2022 සැප්තැම්බර් 14 වැනි දින ඊට අත්සන් තබන ලදී. එම ගිවිසුමට අනුකූලව අදාළ ICRAF නියෝජිතයින් සඳහා ලබා දී ඇති මුක්තිය සහ වරප්‍රසාද ගැසට් කිරීමට නීති අංශය කටයුතු කරමින් සිටී. නීති අංශය බ්‍රසීලය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ස්විට්සර්ලන්තය, ඉන්දුනීසියාව යන රටවල තානාපති කාර්යාල සහ UNDP සහ SACEP යන කාර්යාල සඳහා මුක්තිය සහ වරප්‍රසාද පිළිබඳ කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දී ඇත.*

**මිනිස් ජාවාරම් (TIP):** නීති අංශය යනු ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකායට (NAHTTF) අදාළ අමාත්‍යාංශ කේන්ද්‍රස්ථානය යි. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තුමේන්තුවේ වාර්තාවට අනුව ශ්‍රී ලංකාව මෙම වසරේ දී 2 වැනි ස්ථරයේ නිරීක්ෂණ ලැයිස්තුවේ සිට 2 වැනි ස්ථරය දක්වා උසස් කර ඇත. මූල්‍ය බුද්ධි ඒකකය (FIU) විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ ජාතික අවදානම් තක්සේරුව සඳහා නීති අංශය දැනට සම්බන්ධ වී සිටින අතර එය අවසන් අදියරේ පවතී. 2025 දී පැවැත්වෙන මීළඟ APG ඇගැයීම සඳහා සූදානම් වීමට නීති අංශය FIU සමඟ කටයුතු කරයි.

**නැවත ඇතුළත් කිරීම:** බෙනෙලක්ස් කලාපය වෙනුවෙන් ඉතාලිය, ප්‍රංශය සහ නෙදර්ලන්තය සමඟ යුරෝපා සංගමයේ නැවත ඇතුළත් කිරීමේ සන්ධාන පිළිබඳ සාකච්ඡා අවසන් කරන ලද අතර එම සන්ධාන අත්සන් තැබීම සඳහා අවසන් කළ හැකි ය. මේ වන විට මෙම අංශය දෙපාර්ශ්වයටම පහසු දිනයක අත්සන් කිරීමට පහසු වන පරිදි සහ මුද්‍රණය කිරීමට හැකි වන පරිදි මෙම සන්ධාන කටයුත්ත අවසන් කිරීමට නෙදර්ලන්තය සමඟ සම්බන්ධ වී කටයුතු කරයි.

**ද්විත්ව බදුකරණයෙන් වැළකීම පිළිබඳ ගිවිසුම්:** චෙක් ජනරජය, ඉරාකය, හංගේරියාව, ඩෙන්මාර්කය, මෝල්ටාව, ඉන්දියාව (සන්ධාන), පාකිස්ථානය (සන්ධාන), මාලදිවයින, ඔස්ට්‍රියාව, රුමේනියාව, ඊජිප්තුව, ඉරානය, අසර්බයිජානය, මැසිඩෝනියාව සහ සෞදි අරාබි රාජධානිය සමඟ ද්විත්ව බදුකරණය වැළැක්වීමට අදාළ ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීමටත්, ආදායම් මත පනවන බදු සම්බන්ධයෙන් සිදු වන මූල්‍ය පැහැර හැරීම වැළැක්වීම පිළිබඳව සාකච්ඡා කිරීමටත් ක්‍රියාකාරීව සහභාගී විය.

**ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ කරුණු:** නීති අංශයේ ප්‍රධානියා ජාත්‍යන්තර මානුෂීය නීතියේ ජාතික කමිටුවේ සභාපති වේ. කොවිඩ්-19 වසංගතයෙන් පසුව එම කමිටුව ප්‍රතිසංවිධානය කරන ලද අතර විදේශ අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) විසින් සම අනුග්‍රහය දක්වන අදාළ පාර්ශ්වකරුවන් අතර ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පහත වැඩමුළු පවත්වන ලදී:

i. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය විසින් ජාත්‍යන්තර මානුෂීය නීතිය (IHL) සහ මානුෂීය රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳව සංවිධානය කරන ලද වැඩමුළුව;

ii. IHL බුද්ධි කලම්බන වැඩසටහන: ජාතික IHL කමිටුව සහ ICRC සංවිධානය ජාත්‍යන්තර මානුෂීය නීතිය ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව, 2022 දෙසැම්බර් 1-2 දක්වා පවත්වන ලද බුද්ධි කලම්බන වැඩසටහන; සහ

iii. 2022 ඔක්තෝම්බර් 30 සිට නොවැම්බර් 2 දක්වා “Bringing IHL Home” යන තේමාව යටතේ කත්මණ්ඩු හි පැවති දකුණු ආසියාව සඳහා වූ කලාපීය IHL සම්මන්ත්‍රණයට නීති අංශය සහභාගී විය.

iv. ජිනීවා සම්මුතීන් ජාතික භාෂාවලට පරිවර්තනය කර ගැනීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ විය.

**අධිකරණ නඩු:** විදේශ කටයුතු අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට එරෙහිව කරන ලද 44 FR සහ CA අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දී නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ විය.

**ගුවන් සේවා ගිවිසුම්:** නීති අංශයේ නියෝජිතයන් ද්විපාර්ශ්වික ගුවන් සේවා පිළිබඳ සාකච්ඡා කණ්ඩායමේ සාමාජිකයින් වේ. නෙදර්ලන්තය සමඟ පවත්නා ගුවන් සේවා ගිවිසුම පිළිබඳ කටයුතු අවසන් කර ඇති අතර ඊට අත්සන් තැබීමට නියමිත ය. 2003 දී ඊශ්‍රායලය සමඟ අත්සන් කරන ලද ගුවන් සේවා ගිවිසුමේ සන්ධාන කටයුතු  අවසන් කර ඇති අතර ඊට අත්සන් තැබීමට නියමිත ය. ඉන්දුනීසියාවේ ජාතික සෙවුම් සහ ගලවා ගැනීමේ නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අතර සෙවුම් සහ ගලවා ගැනීමේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අලුත් කිරීම සහ ඉන්දියාව සමඟ ගගනගාමී සෙවීම් සහ ගලවාගැනීමේ සේවාවන් පිළිබඳ සහයෝගීතාව පිළිබඳ ගිවිසුම අවසන් කිරීම ඇතුළුව ඇතැම් සෙවීම් සහ ගලවාගැනීමේ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ඉල්ලීම මත සහ ශ්‍රී ලංකාව සමඟ අත්සන් කරන ලද ගුවන් සේවා ගිවිසුම් යටතේ කුවේට්, බංග්ලාදේශය, නේපාලය, පාකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, බහරේනය, මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව සහ සිංගප්පූරුව යන රටවල් සඳහා මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කිරීම සඳහා Fits Air නමැති ගුවන් සේවය නම් කිරීමට නීති අංශය කටයුතු කර ඇත.

**බිම්ස්ටෙක්:** නීති අංශය විසින් බිම්ස්ටෙක් ප්‍රඥප්තිය, සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහය ලබා දීම පිළිබඳ බිම්ස්ටෙක් සම්මුතිය, බිම්ස්ටෙක් තාක්ෂණ හුවමාරු පහසුකම පිහිටුවීම සඳහා වූ ගිවිසුම සහ රාජ්‍යතාන්ත්‍රික පුහුණු ක්ෂේත්‍රයේ අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ බිම්ස්ටෙක් අවබෝධතා ගිවිසුමට 2022 මාර්තු 30 වැනි දින අත්සන් තබන ලදී.  බිම්ස්ටෙක් ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන රැස්වීමට සහභාගී වූ අතර සමුද්‍රීය ප්‍රවාහන සහයෝගීතාව පිළිබඳව කෙටුම්පත් කරන ලද සහයෝගිතා ගිවිසුමේ කටයුතු අවසන් කිරීමට සහය විය. මූලික බිම්ස්ටෙක් යාන්ත්‍රණ, ආංශික බිම්ස්ටෙක් යාන්ත්‍රණ සහ බිම්ස්ටෙක් ලේකම් කාර්යාලයෙන් ලැබුණු බාහිර සම්බන්ධතා/අනෙකුත් කටයුතු සඳහා වන රීති ක්‍රියාපටිපාටිය පිළිබඳ නිරීක්ෂණ සපයන ලදී. 2022 දෙසැම්බර් 21-22 දක්වා බංග්ලාදේශයේ ඩකා හි පැවති බිම්ස්ටෙක් නිත්‍ය ක්‍රියාකාරී කමිටුවේ (S-BPWC) විශේෂ රැස්වීමට සහභාගී විය. මූලික බිම්ස්ටෙක් යාන්ත්‍රණ සඳහා වන ක්‍රියා පටිපාටි රීති, ආංශික බිම්ස්ටෙක් යාන්ත්‍රණ සඳහා වන ක්‍රියා පටිපාටි රීති, බිම්ස්ටෙක් සංස්කෘතික කර්මාන්ත කොමිෂන් සභාවේ ක්‍රියා පටිපාටි රීති සහ බිම්ස්ටෙක් හි ඉදිරි දිශානතිය පිළිබඳ කීර්තිමත් පුද්ගලයින්ගේ කණ්ඩායම සඳහා වූ ක්‍රියා පටිපාටි රීති යනාදිය පිළිබඳ කටයුතු මෙම රැස්වීමේ දී අවසන් කරන ලදී.

**ත්‍රස්තවාදයට එරෙහිව ශ්‍රී ලංකාව තුළ යෝජිත නීති සම්පාදන කටයුතු:** ඉහත නීති සම්පාදනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව තුළ නීති අංශය නියෝජනය වන අතර, කෙටුම්පත් කරන ලද පාඨයට අදාළ නිරීක්ෂණ මෙම අංශය විසින් ලබා දී ඇත.

**පූර්ණ බලතල සහිත නෛතික උපකරණ නිකුත් කිරීම:** විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අත්සන ලබාගැනීම සඳහා නීති අංශය විසින් පූර්ණ බලතල සහිත නෛතික උපකරණ විසිහතරක් (24) සකස් කර ඇත.

**අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ:** විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ පනස් නවය (59) සමාලෝචිත කාල සීමාව තුළ නීති අංශය විසින් සකස් කරන ලදී.

**විදේශ සිතාසි:** අධිකරණ අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් විදේශ සිතාසි 337ක් ඉදිරියට සම්ප්‍රේෂණය කිරීමට නීති අංශය පහසුකම් සලසා ඇත. 2017 අංක 27 දරන පනත හරහා සංශෝධිත 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව ඉරානය, ප්‍රංශය, නෙදර්ලන්ත රාජධානිය සහ ඕස්ට්‍රේලියාව යන රටවල සිද්ධීන් හතරකට අදාළව ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා හරහා සාක්ෂි ලබා ගැනීමට නීති අංශය විසින් පහසුකම් සලසන ලදී.

**අන්‍යෝන්‍ය නෛතික සහාය, පිටුවහල් කිරීම සහ වැරදිකරුවන් මාරු කිරීම සඳහා වන ඉල්ලීම්:** 2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අන්‍යෝන්‍ය නෛතික සහය ඉල්ලීම් 34ක්, පිටුවහල් කිරීමේ ඉල්ලීම් 16ක් සහ වැරදිකරුවන් මාරු කිරීම සඳහා වන ඉල්ලීම් 10ක් සඳහා පහසුකම් සලසා ඇත.

**අත්සන් තබන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්: 2022** ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා නීති අංශයේ ගිවිසුම් තැන්පතු 27 කට අත්සන් තබා තැන්පත් කරන ලදී. **බුඩාපෙස්ට් සම්මුතිය:** සහයෝගීතාව සහ විද්‍යුත් සාක්ෂි හෙළිදරව් කිරීම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් සයිබර් අපරාධ පිළිබඳ සම්මුතියේ (බුඩාපෙස්ට් සම්මුතිය) දෙවන අතිරේක සන්ධානයට 2022 නොවැම්බර් 30 වැනි දින ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.

**නීති උපදෙස්/නිරීක්ෂණ සැපයීම:** විදේශ රාජ්‍යයන්, ජාත්‍යන්තර සංවිධාන සහ ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වන ලද දූත මණ්ඩල සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ/ආයතන පවත්නා අන්තර්ක්‍රියා පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය අවසන් කිරීමට නීති අංශය සම්බන්ධ විය. විදේශ ලේකම්වරයාට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට නීතිමය අදහස් සහ උපදෙස් 230කට වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත. 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නීති අංශය විසින් ආසන්න වශයෙන් ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 625ක් නිෂ්කාශනය කර ඇති අතර විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් උපදෙස් 125ක් පමණ ලබා දී ඇත.

නීති අංශයේ නිලධාරීන් පහත සඳහන් අමාත්‍ය මණ්ඩල කමිටු සහ අනෙකුත් කමිටු නියෝජනය කළහ:

i. ත්‍රස්ත මර්දන නීති සම්පාදනය කිරීමේ කමිටුව.

ii. ජාතික සාගර කටයුතු කමිටුව (NOAC)

iii. උපායමාර්ගික වෙළඳ පාලනය පිළිබඳ නීති කමිටුව (STC) සඳහා සහ STC පිළිබඳ නීති කෙටුම්පත් අවසන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රතිපත්ති සහ නීතිමය යෙදවුම් සපයන ලදී.

iv. මූල්‍ය බුද්ධි ඒකකය, ජාතික සම්බන්ධීකරණ කමිටුව සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් සමූහය (APG) සහ මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සම්බන්ධ සියලුම අමාත්‍යාංශ කටයුතු සිදු කරයි.

v. APG අන්‍යෝන්‍ය ඇගයීම සඳහා අවශ්‍යතාවයක් වන මූල්‍ය බුද්ධි අංශය විසින් පවත්වනු ලබන ජාතික අවදානම් තක්සේරු කමිටුව.

vi. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීමේ කමිටුව.

**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම්:** 2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් 34ක් ලැබී ඇත. එම ඉල්ලීම් 34න් ඉල්ලීම් 30කට පිළිතුරු සපයා ඇත.

## 2.6.6. විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය

**ලේඛන කළමනාකරණ පද්ධතිය සංඛ්‍යාංකනය කිරීම:** අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශයේ සහය ඇතිව ලේඛන කළමනාකරණ පද්ධතිය සංඛ්‍යාංකනය කිරීම හඳුන්වා දීමට මෙම අංශය කටයුතු කර ඇත. ඒ අනුව, මෙම අමාත්‍යාංශයේ පරිපාලන හා මුදල් අංශයේ සහය ඇතිව, 2022 මුදල් වර්ෂයේ දී එම පද්ධතිය මිලදී ගෙන ඇත. ලේඛන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2023 ජනවාරි මස අවසන් වන විට එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ. 2023 පෙබරවාරි මස දෙවන සතියේ එය පරීක්ෂා කිරීමටත්, මාර්ගගත ආකාරයෙන් එය භාවිතා කරන ආකාරය පිරික්සීමටත් මෙම අංශය අපේක්ෂා කරයි.

**වත්කම් කළමනාකරණ පද්ධතිය සංඛ්‍යාංකනය කිරීම, විදේශ දූත මණ්ඩල / කාර්යාල සමඟ අමාත්‍යාංශය ජාලගත කිරීම:** මෙම අංශය, ඉහත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය සමඟ පසු විපරම් කරයි. දත්ත පෝෂණය කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර එය 2023 පෙබරවාරි පළමු සතිය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා චෙන්නායි හි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මෙම කමිටුව විසින් තෝරාගෙන ඇති අතර, එය 2023 පෙබරවාරි මස දෙවැනි සතියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

**දිගුකාලයක් මුළුල්ලේ නොවිසඳුණු විගණන විමසුම්වල ප්‍රගතිය:** 2021 වසර සඳහා වූ අමාත්‍යාංශයේ අවසාන ගිණුමෙහි දක්වා ඇති පාඩු ඉවත් කිරීම, අත්හැරීම සහ කපා හැරීම සඳහා විදේශ කටයුතු ලේකම් විසින් මෙම කමිටුව පත් කරන ලදී. විමසුම් 21 න් 12 ක් කපා හරින ලදී. විමසුම් 21 න් විමසුම් දෙකක් අවසන් ගිණුමෙන් ඉවත් කර ඇත. විමසුම් 7ක් විසඳීම සඳහා වැඩිදුර කාල සීමාවක් අවශ්‍ය වේ. විමසුම් 7න් 6ක් 2023 ජනවාරි මස අග වන විට සමථයකට පත් කළ හැකි ය.

**ශ්‍රී ලංකා රජයට අයත් අතහැර දමා ඇති දේපළ පිළිබඳ විදේශ කටයුතු ලේකම් වෙත යෝජනා/නිර්දේශ සැපයීම සඳහා වන කමිටුව:** මෙම කමිටුව විසින් වාර්තාව සම්පූර්ණ කරන ලදී (ස්ටොක්හෝම් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දේපළ හැර)

**දූත මණ්ඩලවල වියදම් කප්පාදු කිරීම පිළිබඳ යෝජනා සැපයීම සඳහා වන කමිටුවේ ප්‍රගතිය:** අවසන් වාර්තාව 2023 ජනවාරි මාසයේ දී ඉදිරිපත් කෙරේ.

## 2.6.7. සන්ධාන අංශය

උත්සව කටයුතු සම්බන්ධීකරණය, විදේශ රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයින්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි විශේෂිත ආයතන සහ ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති ජාත්‍යන්තර සංවිධාන වෙත ලබා දී ඇති රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද සඳහා පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම, ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා පහසුකම් සැලසීම (කොළඹ සිටින සහ අනෙකුත් දූත මණ්ඩල සඳහා සමගාමීව අක්ත ගන්වන ලද) සහ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය සැපයුම් සහ සන්ධාන විධිවිධාන සඳහා පහසුකම් සැලසීම සන්ධාන අංශයේ කාර්යභාරය වේ.

**මුක්තිය සහ වරප්‍රසාද: නිෂ්කාශන සහතික නිකුත් කිරීම-** විදේශ දූත මණ්ඩල සඳහා සහතික 970 ක් (සහතික 50 ක් සහිත ග්‍රන්ථ 19 ක්) සහ ජාත්‍යන්තර සංවිධාන වෙත සහතික 400 ක් (සහතික 50 ක් සහිත ග්‍රන්ථ 8 ක්) නිකුත් කරන ලදී.

**රේගු පහසුකම් - ආනයන:** (විදේශ දූත මණ්ඩල සඳහා 1730 ක් සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සඳහා 380ක්) **රේගු පහසුකම් - අපනයන:** (විදේශ දූත මණ්ඩල සඳහා 148 ක් සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සඳහා 27 ක්)

**වාහන (රාජ්‍යතාන්ත්‍රික /එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන):** වාහන විකිණීම-292, වාහන ලියාපදිංචි කිරීම-94, ආදායම් බලපත්‍ර නිකුත් කිරීම-740, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම-187, පෙට්‍රල් කූපන් පොත් නිකුත් කිරීම-210.

**වීසා බලපත්‍ර:** විදේශ දූත මණ්ඩල සඳහා වන වීසා බලපත්‍ර - 922, විදේශ දූත මණ්ඩල සඳහා වන වීසා බලපත්‍ර-නේවාසික වීසා බලපත්‍ර 1200, ජාත්‍යන්තර සංවිධාන සඳහා වන වීසා බලපත්‍ර - ඇතුළත් වීමේ වීසා බලපත්‍ර 174 සහ නේවාසික වීසා බලපත්‍ර 220, කෙටි කාලීන වීසා බලපත්‍ර-42.

**ගුවන් තොටුපොළ අවසරපත්:** ස්ථිර අවසරපත් 98ක් සහ තාවකාලික අවසරපත් 45ක්, ස්ථිර බලපත්‍ර අලුත් කිරීම් 138ක් සහ තාවකාලික අවසරපත් අලුත් කිරීම් 30ක්.

**VIP විවේකාගාර සඳහා බලපත්‍ර:** විදේශීය මගීන් 5155 ක් සහ දේශීය මගීන් 3645 ක්.

**රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශන:** විදේශ ගුවන් යානා සඳහා අනුමැතිය ලබා දීම් 111ක් (මිලිටරි සහ රාජ්‍ය සතු), විදේශ නැව් සඳහා අනුමැතිය ලබා දීම් 33ක් (මිලිටරි සහ පර්යේෂණ), හමුදා අභ්‍යාස 17ක් සහ ආයුධ නිෂ්කාශන 9ක්.

**හැඳුනුම්පත් (රාජ්‍යතාන්ත්‍රික / එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන):** ගුවන් තොටුපළ අවසරපත් 793 ක්, ජාතික දින සුබ පැතුම් පණිවිඩ 316ක් සහ ජාතික දින උත්සව16 ක්.

**දූත මණ්ඩල ප්‍රධානීන්/නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම්:** ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති විදේශ තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සඳහා අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව සංවිධානය කිරීම සහ ශ්‍රී ලංකාව සිය නේවාසික දූත මණ්ඩල පිහිටුවා ඇති රටවලට පත් කර ඇති ශ්‍රී ලංකා තානාපතිවරුන්/ මහ කොමසාරිස්වරුන් සඳහා එකඟත්වය සහතික කිරීම සන්ධාන අංශයේ වගකීම වේ. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් සහ ශ්‍රී ලංකාව සඳහා වන වෙනත් රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් සම්බන්ධයෙන් ද සන්ධාන අංශය වගකීම දරයි. ඒ අනුව, අක්තපත්‍ර ප්‍රදානෝත්සව 5ක්, ශ්‍රී ලංකාව සඳහා විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් පත්කිරීම් 30ක්, විදේශයන් සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් 24ක් පත්කිරීම යන කටයුතු සමාලෝචිත කාල සීමාව තුළ මෙම අංශය විසින් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන්ගේ ධුර කාල අවසන් කිරීම් 3 සහ පත්කිරීම් 4 ට අමතරව, ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් 21 ක් සහ සේවා කාලය දීර්ඝ කිරීම් 33 ක් සඳහා පහසුකම් සලසන ලදී.

## 2.6.8. හදිසි ප්‍රතිචාර ඒකකය

විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීම, වෛද්‍ය උපකරණ පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ නිෂ්කාශනය, එන්නත් මිලදී ගැනීම සහ පරිත්‍යාග කිරීම යනාදී වශයෙන් කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2020 මාර්තු මස කොවිඩ්-19 කේන්ද්‍රස්ථානයක් පිහිටුවන ලදී.

රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ කොවිඩ්-19 කේන්ද්‍රස්ථාන අංශය මෙම අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර අංශය ලෙස ද කටයුතු කළ අතර ඖෂධ, වෛද්‍ය උපකරණ, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය සැපයුම් ආදිය සම්බන්ධයෙන් වූ හිඟය පියවීම සඳහා අදාළ පාර්ශ්ව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කළේ ය.

විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්, විදේශීය රජයන්, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් දානපතියන් මෙරට අවශ්‍යතා සපුරාලීම සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හරහා පිරිනැමූ ඖෂධ, වෛද්‍ය උපකරණ, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය සැපයුම් තොග 122ක කටයුතු මෙම ඒකකය විසින් සම්බන්ධීකරණය

කර පහසුකම් සලසන ලදී (NMRA නිෂ්කාශනය සහ අවශ්‍ය අනෙකුත් අනුමැතිය ලබා ගැනීම, නොමිලේ ප්‍රවාහනය කරන ලෙස ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ඉල්ලා සිටීම සහ වරාය නිෂ්කාශනය සහ භාරදීම මීට ඇතුළත් වේ).

දැඩි සත්කාර ඒකක සහ පිළිකා රෝගීන් සඳහා අත්‍යවශ්‍ය ඖෂධ සහ ඇනස්ට්‍රසෝල්, ඇසිත්‍රොමයිසින්, එපිලෙක්ස්, ෆ්ලුකනසෝල්, ෆ්ලුඩ්රොකෝර්ටිසෝන්, ඉට්රකොනසෝල්, ලෙනොලින්ඩොමයිඩ්, ලෙවෙටයරසෙටම්, පැන්ටොප්‍රෙසෝල්, ටෙමොසොලමයිඩ්, ටැබ් ෆොලිනික් අම්ලය යනාදී අත්‍යවශ්‍ය ඖෂධ මෙන්ම ඩොලර් මිලියන 41 කට අධික වටිනාකමකින් යුක්ත වෙන්ටිලේටර, සිරින්ජර, ET ටියුබ්, RAT කට්ටල, රුධිර මළු, රසායනික විෂබීජ නාශක, ශල්‍ය කටයුතු සඳහා භාවිතා කරන ද්‍රව්‍ය සහ අනෙකුත් ඖෂධ ද්‍රව්‍ය සහ සහල් මෙ.ටොන් 1340ක් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 100කට වැඩි ප්‍රමාණයක් සහ පාසල් උපකරණ ද්‍රව්‍ය මෙ.ටොන් 1.25ක් මෙම අංශයේ සම්බන්ධීකරණය යටතේ ශ්‍රී ලංකාවට හිමි විය.

සමාලෝචිත කාලය තුළ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හරහා මූල්‍ය පරිත්‍යාග වශයෙන් අමෙරිකානු ඩොලර් 57, 302 ක මුදලක් ද ශ්‍රී ලංකාවට ලැබිණි. මෙම ඒකකය විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සහ කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල හරහා කොවිඩ්-19 එන්නත් පරිත්‍යාග කිරීමට පහසුකම් සලසා ඇත.

රටවලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් සපුරාලිය යුතු අවශ්‍යතා, ගමන් සීමා ඉවත් කිරීම සහ එන්නත් සහතික අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ද මෙම අංශය විදේශීය රජයන් සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කළේ ය. ශ්‍රී ලංකාව රටවල් 92 ක කොවිඩ්-19 එන්නත් සහතික පිළිගෙන ඇත.

ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ සංචාරවල නිරත වීමේදී ශ්‍රී ලාංකිකයන් ලබා සිටිය යුතු කොවිඩ්-19 එන්නත් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මාර්ගෝපදේශයක් ද මෙම අංශය විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල සහය ඇතිව සකස් කළ අතර අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන ද නිරන්තරයෙන් යාවත්කාලීන කළේ ය.

## 2.7. 2022 වසරේ සුවිශේෂී අවස්ථා




ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඊජිප්තුවේ පැවැති **COP - 27** සමුළුවට සහභාගී වීම



ශ්‍රී ලංකාවට සහය වීම සඳහා තොරතුරු සෙවීමේ මෙහෙයුමක නිරත වූ ජපානයේ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා



2022 සැප්තැම්බර් 24 වැනි දින නිව්යෝර්ක් නුවර

එක්සත් ජාතීන්ගේ 77 වැනි මහා මණ්ඩල සැසිවාරයේ මහා විවාදය අතරතුර විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මැතිතුමා




සාමාජික රටවල ඉහළ පෙළේ සම්භාවනීය අමුත්තන් 2022 මාර්තු 20 වැනි දින කොළඹ පැවති 5 වැනි බිම්ස්ටෙක් සමුළුවට සහභාගී වීම




එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 51 වැනි සැසිවාරයේ දී විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මැතිතුමා සිදු කළ ප්‍රකාශය



2023-2027 කාලය සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව (UNSDCF)



විදේශ කටයුතු ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය වියානා හි පැවති විස්තීරණ පරීක්ෂණ තහනම් ගිවිසුමේ (CTBTO) 3 වැනි විද්‍යා රාජ්‍යතාන්ත්‍රික සමුළුවේ ඉහළ මට්ටමේ කොටසේ ප්‍රධාන දේශනය පවත්වයි.



විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මැතිතුමා නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව ජාත්‍යන්තර සම්භාවනීය අමුත්තන් හමුවෙයි



එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලින්කන් මැතිතුමා සමඟ විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මැතිතුමා පැවැත්වූ හමුව



***USAID*** හි ශ්‍රී ලංකා පරිපාලකවරයා සමඟ විදේශ කටයුතු අමාත්‍යවරයා පැවැත්වූ හමුව



කැනඩාවේ සිටින, ශ්‍රී ලාංකික උරුමයක් සහිත ඉහළ පෙළේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් මෙරට සිදු කළ සංචාරය



2022 ජූලි 15 වැනි දින පැවති ජපාන ශ්‍රී ලංකා තෙවැනි ප්‍රතිපත්ති සංවාදය

# 3 වැනි පරිච්ඡේදය: මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**Statement of Financial Performance**
**for the period ended 31st December 2022**

(Rs.)

| Budget 2022 Rs. | | Note | Actual 2022 Rs. | Actual 2021 Rs. | |
|---|---|---|---|---|---|
| | **Revenue Receipts** | | | | |
| - | Income Tax | 1 | | - | ACA-1 |
| - | Taxes on Domestic Goods & Services | 2 | | - | ACA-1 |
| - | Taxes on International Trade | 3 | | - | ACA-1 |
| - | Non Tax Revenue & Others | 4 | | - | ACA-1 |
| - | **Total Revenue Receipts (A)** | | - | - | |
| - | **Non Revenue Receipts** | | | | |
| | Treasury Imprests | | 11,508,887,742 | 9,369,712,663 | ACA-3 |
| | Deposits | | 2,104,922,230 | 2,076,010,925 | ACA-4 |
| 30,400,000 | Advance Accounts | | 61,860,671 | 51,762,773 | ACA-5 |
| | Other Main Ledger Receipts | | | - | |
| **30,400,000** | **Total Non Revenue Receipts (B)** | | **13,675,670,643** | **11,497,486,361** | |
| **30,400,000** | **Total Revenue Receipts & Non Revenue Receipts C = (A)+(B)** | | **13,675,670,643** | **11,497,486,361** | |
| | **Remittance to the Treasury (D)** | | **339,634,673** | **100,000,476** | |
| **30,400,000** | **Net Revenue Receipts & Non Revenue Receipts E = (C)-(D)** | | **13,336,035,970** | **11,397,485,885** | |
| | **Less: Expenditure** | | | | |
| | **Recurrent Expenditure** | | | | |
| 10,898,730,000 | Wages, Salaries & Other Employment Benefits | 5 | 9,030,773,672 | 6,803,407,447 | ACA-2(ii) |
| 5,531,850,500 | Other Goods & Services | 6 | 4,834,536,272 | 3,907,979,711 | ACA-2(ii) |
| 808,910,500 | Subsidies, Grants and Transfers | 7 | 730,970,638 | 470,003,154 | ACA-2(ii) |
| - | Interest Payments | 8 | - | - | ACA-2(ii) |
| 140,120,000 | Other Recurrent Expenditure | 9 | 108,441,860 | 6,368,744 | ACA-2(ii) |
| **17,379,611,000** | **Total Recurrent Expenditure (F)** | | **14,704,722,442** | **11,187,759,056** | |
| | **Capital Expenditure** | | | | |
| 360,572,000 | Rehabilitation & Improvement of Capital Assets | 10 | 49,030,997 | 120,744,787 | ACA-2(ii) |
| 105,527,000 | Acquisition of Capital Assets | 11 | 42,215,696 | 63,415,740 | ACA-2(ii) |
| 2,000,000 | Capital Transfers | 12 | 1,000,000 | - | ACA-2(ii) |
| - | Acquisition of Financial Assets | 13 | - | - | ACA-2(ii) |
| 2,300,000 | Capacity Building | 14 | 1,202,050 | 2,062,858 | ACA-2(ii) |
| 10,000,000 | Other Capital Expenditure | 15 | 84,213 | 1,737,946 | ACA-2(ii) |
| **480,399,000** | **Total Capital Expenditure (G)** | | **93,532,956** | **187,961,331** | |
| | **Deposit Payments** | | 1,978,580,402 | 2,050,025,630 | ACA-4 |
| 36,000,000 | **Advance Payments** | | 52,110,527 | 39,143,701 | ACA-5 |
| | **Other Main Ledger Payments** | | | | |
| **36,000,000** | **Total Main Ledger Expenditure (H)** | | **2,030,690,929** | **2,089,169,331** | |
| **17,896,010,000** | **Total Expenditure I = (F+G+H)** | | **16,828,946,327** | **13,464,889,718** | |
| **(17,865,610,000)** | **Balance as at 31st December J = (E-I)** | | **(3,492,910,357)** | **(2,067,403,833)** | |
| | **Balance as per the Imprest Reconciliation Statement** | | (5,179,573,718) | **(3,076,705,760)** | ACA-7 |
| | **Imprest Balance as at 31st December** | | 1,686,663,361 | **1,009,301,927** | ACA-3 |
| | | | **(3,492,910,357)** | **(2,067,403,833)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### Statement of Financial Position
### As at 31st December- 2022

| | Note | Actual 2022 Rs | 2021 Rs |
|---|---|---|---|
| **Non Financial Assets** | | | |
| Property, Plant & Equipment | ACA-6 | 12,734,553,377 | 12,740,581,583 |
| **Financial Assets** | | | |
| Advance Accounts | ACA-5/5(a) | 101,349,648 | 111,099,792 |
| Cash & Cash Equivalents | ACA-3 | 1,686,663,361 | 1,009,301,927 |
| **Total Assets** | | 14,522,566,386 | 13,860,983,302 |
| **Net Assets / Equity** | | | |
| Net Worth to Treasury | | (400,043,205) | (263,943,109) |
| Property, Plant & Equipment Reserve | | 12,734,553,377 | 12,740,581,583 |
| Rent and Work Advance Reserve | ACA-5(b) | | |
| **Current Liabilities** | | | |
| Deposits Accounts | ACA-4 | 501,392,853 | 375,042,901 |
| Unsettled Imprest Balance | ACA-3 | 1,686,663,361 | 1,009,301,927 |
| **Total Liabilities** | | 14,522,566,386 | 13,860,983,302 |

Detail Accounting Statements in ACA format Nos. 1 to 7 presented in pages from ...**06**.. to...**113**... and Annexures to accounts presented in pages from ...**114**.... to ...**219**.. form an integral part of these Financial Statements. The Financial Statements have been prepared in complying with the Generally Accepted Accounting Principles whereas most appropriate Accounting Policies are used as disclosed in the Notes to the Financial Statements and hereby certify that figures in these Financial Statements, Notes to accounts and other relevant accounts were reconciled with the Treasury Books of Accounts and found in agreement.
We hereby certify that an effective internal control system for the financial control exists in the Reporting Entity and carried out periodic reviews to monitor the effectiveness of internal control system for the financial control and accordingly make alterations as required for such systems to be effectively carried out.

...............................
**Chief Accounting Officer**
**Name :**
**Designation :** Ms. Aruni Wijewardane
**Date : 27.02.2023**
Secretary
Ministry of Foreign Affairs
Colombo-01.

...............................
**Accounting Officer**
**Name :**
**Designation :**
**Date : 27.02.2023**
Ms. Aruni Wijewardane
Secretary
Ministry of Foreign Affairs
Colombo-01.

...............................
**Chief Financial Officer/ Chief Accountant/ Director (Finance)/ Commissioner (Finance)**
**Name :**
**Date : 27.02.2023**
P. D. L. Kularathna
Chief Financial Officer
Ministry of Foreign Affairs
Colombo 1.

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### Statement of Cash Flows
### for the Period ended 31st December 2022

| | Actual 2022 Rs. | 2021 Rs. |
|---|---|---|
| **Cash Flows from Operating Activities** | | |
| Total Tax Receipts | - | - |
| Fees, Fines, Penalties and Licenses | - | - |
| Profit | - | - |
| Non Revenue Receipts | - | - |
| Revenue Collected on behalf of Other Revenue Heads | 5,300,032,911 | 3,221,067,854 |
| Imprest Received | 10,499,585,815 | 9,278,182,565 |
| Recoveries from Advance | 69,985,852 | 56,789,023 |
| Deposit Received | 2,104,196,970 | 2,076,010,925 |
| **Total Cash generated from Operations (A)** | **17,973,801,548** | **14,632,050,367** |
| **Less - Cash disbursed for:** | | |
| Personal Emoluments & Operating Payments | 13,947,288,855 | 10,837,484,562 |
| Subsidies & Transfer Payments | 730,970,638 | 470,003,154 |
| Expenditure incurred on behalf of Other Heads | 208,262,003 | 149,014,309 |
| Imprest Settlement to Treasury | 339,634,673 | 100,000,476 |
| Advance Payments | 58,604,194 | 44,334,666 |
| Deposit Payments | 1,978,566,577 | 2,050,025,630 |
| **Total Cash disbursed for Operations (B)** | **17,263,326,940** | **13,650,862,797** |
| **NET CASH FLOW FROM OPERATING ACTIVITIES(C )=(A)-( B)** | **710,474,608** | **981,187,570** |
| **Cash Flows from Investing Activities** | | |
| Interest | - | - |
| Dividends | - | - |
| Divestiture Proceeds & Sale of Physical Assets | 9,102,522 | - |
| Recoveries from On Lending | - | - |
| **Total Cash generated from Investing Activities (D)** | **9,102,522** | **-** |
| **Less - Cash disbursed for:** | | |
| Purchase or Construction of Physical Assets & Acquisition of Other Investment | 42,215,696 | 63,415,742 |
| **Total Cash disbursed for Investing Activities (E)** | **42,215,696** | **63,415,742** |
| **NET CASH FLOW FROM INVESTING ACTIVITIES ( F)=(D)-(E)** | **(33,113,174)** | **(63,415,742)** |
| **NET CASH FLOWS FROM OPERATING & INVESTMENT ACTIVITIES (G)=( C) + (F)** | **677,361,434** | **917,771,828** |
| **Cash Flows from Fianacing Activities** | | |
| Local Borrowings | - | - |
| Foreign Borrowings | - | - |
| Grants Received | - | - |
| **Total Cash generated from Financing Activities (H)** | **-** | **-** |
| ***Less - Cash disbursed for:*** | | |
| Repayment of Local Borrowings | - | - |
| Repayment of Foreign Borrowings | - | - |
| **Total Cash disbursed for Financing Activities (I)** | **-** | **-** |
| **NET CASH FLOW FROM FINANCING ACTIVITIES (J)=(H)-(I)** | **-** | **-** |
| **Net Movement in Cash (K) = (G) + ( J )** | **677,361,434** | **917,771,828** |
| **Opening Cash Balance as at 01st January 2022** | **1,009,301,927** | **91,530,099** |
| **Closing Cash Balance as at 31st December 2022** | **1,686,663,361** | **1,009,301,927** |

# Basis of Reporting

1) **Reporting Period**

The reporting period for these Financial Statements is from 01st January to 31st December 2022.

2) **Basis of Measurement**

The Financial Statements have been prepared on historical cost modified by the revaluation of certain assets and accounted on a modified cash basis, unless otherwise specified.

The figures of the Financial Statements are presented in Sri Lankan rupees rounded to the nearest rupee.

3) **Recognition of Revenue**

Exchange and non exchange revenues are recognised on the cash receipts during the accounting period irrespective of relevant revenue period.

4) **Recognition and Measurement of Property, Plant and Equipment (PP&E)**

An item of Property, Plant and Equipment is recognized when it is probable that future economic benefit associated with the assets will flow to the entity and the cost of the assets can be reliably measured.

PP&E are measured at a cost and revaluation model is applied when cost model is not applicable.

5) **Property, Plant and Equipment Reserve**

This reserve account is the corresponding account of Property Plant and Equipment.

6) **Cash and Cash Equivalents**

Cash & cash equivalents include local currency notes and coins in hand as at 31st December 2022.

* In cases where there are transactions which are specific to a particular reporting entity, relevant information can be entered in to the Financial Statements with approval of Department of State Accounts and the disclosure required for those specific transactions may be included under "Reporting Basis".

* Only the accounting policies relevant to the reporting entity should be disclosed under the reporting basis.

## 3.4 ආදායම් රැස් කිරීම පිළිබඳ කාර්ය සාධනය

**ශ්‍රී.ලං.රු. 000'**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කළ ආදායම් 2022 දෙසැ.31 වැනි දිනට | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසාන | මුදල (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (%) |
| 2002-01-01 | රජයේ ගොඩනැඟිලි සහ නිවාස සඳහා කුලිය | 2,900 | 3,000 | 2,834 | 94% |
| 2002-09-99 | වෙනත් ආදායම් | 5,000 | 7,500 | 13,711 | 183% |
| 2003-02-07 | විදේශ ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 2,800,000 | 3,150,000 | 3,376,584 | 107% |
| 2003-02-13 | විභාග ගාස්තු සහ වෙනත් ගාස්තු | 35 | 15 | - | 0% |
| 2003-02-14 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 25,000 | 29,000 | 29,108 | 100% |
| 2003-02-99 | කොන්සියුලර් ගාස්තු | 600,000 | 1,000,000 | 1,284,204 | 128% |
| 2003-99-00 | වෙනත් ලැබීම් | 150,000 | 210,000 | 558,595 | 266% |
| 2004-01-00 | සමාජ ආරක්ෂණ දායකත්වය)-මධ්‍යම රජය) | 30,000 | 38,000 | 34,343 | 90% |
| 2004-02-00 | සමාජ ආරක්ෂණ දායකත්වය - (පළාත් සභා) | 550 | 700 | 654 | 93% |
| 2006-02-01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම) වාහන) | 6,000 | 6,000 | 5,839 | 97% |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්) | 200 | 200 | 3,263 | 1631% |
| එකතුව | | 3,619,685 | 4,444,415 | 5,309,135 | |

## 3.5 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම පිළිබඳ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | 2022 වසර සඳහා ප්‍රතිපාදන | | තථ්‍ය වියදම (2022 දෙසැ.31 වැනි දිනට) | ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙසට (2022 දෙසැ.31 වැනි දිනට) |
|---|---|---|---|---|
| | මූලික | අවසාන | | |
| පුනරාවර්ථන | **17,393,010** | **17,379,611** | **14,704,722** | **85%** |
| ප්‍රාග්ධන | **467,000** | **480,399** | **93,533** | **19%** |
| එකතුව | **17,860,010** | **17860,010** | **17,798,255** | |

## 3.6 අමාත්‍යාංශයේ වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම

**ශ්‍රී.ලං.රු. 000'**

| අනුක්‍රමික අංකය (ශීර්ෂ අංකය) | ප්‍රතිපාදන ප්‍රදානය කළ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන වෙන් කළ හේතුව | ප්‍රතිපාදන වෙන් කිරීම | | තථ්‍ය වියදම | ප්‍රතිපාදන උපයෝගිතාව අවසාන වෙන් කිරීමේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසන් වෙන් කිරීම | | |
| 001 | ජනාධිපති කාර්යාලය | VVIP චාරිකා | **62,178** | **62,178** | **59,020** | **95%** |
| 002 | අග්‍රාමාත්‍ය කාර්යාලය | චාරිකා සඳහා වෙන් කිරීම | **2,918** | **2,918** | **2,904** | **100%** |
| 101 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | ආගමික ක්‍රියාකාරකම් සඳහා වියදම් | **5,988** | **5,988** | **5,917** | **99%** |
| 102 | මුදල් අමාත්‍යාංශය | VVIP චාරිකා සඳහා වෙන් කිරීම | **2,520** | **2,520** | **2,520** | **100%** |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | ආරක්ෂක භාරයේ වියදම් | **1,116** | **1,116** | **1,116** | **100%** |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | VVIP චාරිකා සඳහා වෙන් කිරීම | **100** | **100** | **100** | **100%** |

ශ්‍රී.ලං.රු. 000'

| අනුක්‍රමික අංකය (ශීර්ෂ අංකය) | ප්‍රතිපාදන ප්‍රදානය කළ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන වෙන් කළ හේතුව | ප්‍රතිපාදන වෙන් කිරීම | | තථ්‍ය වියදම | ප්‍රතිපාදන උපයෝගිතාව අවසාන වෙන් කිරීමේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසන් වෙන් කිරීම | | |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | කියුබානු උපාධි අපේක්ෂකයින් සඳහා දීමනාව සහ සම්බන්ධීකරණ නිලධාරියාගේ වැටුප් ගෙවීම, යුනෙස්කෝ දායකත්වය | 115,485 | 115,485 | 115,431 | 100% |
| 222 | ශ්‍රී ලංකා යුධ හමුදාව | අතිරික්ත ගමන් මලු මුහුදෙන් ප්‍රවාහනය කිරීම, නීති ගාස්තු සහ නිල වාහනයක් අලුත්වැඩියා කිරීම | 16,450 | 16,450 | 16,272 | 99% |
| 224 | ශ්‍රී ලංකා ගුවන් | අතිරික්ත ගමන් මලු මුහුදෙන් ප්‍රවාහනය කිරීම | 930 | 930 | 782 | 84% |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | INTERPOL වාර්ෂික මූල්‍ය දායකත්වය මහලේකම් කාර්යාලය සහ VVIP චාරිකා | 12,332 | 12,332 | 12,276 | 100% |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලාංකික ධීවරයින් බේරා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම | 476 | 476 | 476 | 100% |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | 4,890 | 4,890 | 4,287 | 88% |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(ශ්‍රී.ලං.රු. 000')

| වත්කම් කේතය | කේත විස්තරය | 2022 දෙසැ.31 වැනි දිනට සමීක්ෂණ වාර්තා කමිටුවට අනුව ශේෂය | 2022 දෙසැ.31 වැනි දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | තව දුරටත් ගිණුම් ගත කිරීමට ඇති | වාර්තාකරණ ප්‍රගතිය ප්‍රතිශතයක් (%) ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | - | 10,059,336 | - | 100% |
| 9152 | යන්ත්‍ර හා උපකරණ | - | 1,580,961 | - | 100% |
| 9153 | ඉඩම් | - | 1,010,362 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 27,909 | - | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | නොනිමි වැඩ | - | 55,985 | - | 100% |
| 9180 | | - | | - | |

## 3.8 2022 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

(ශ්‍රී.ලං.රු. 000')

| ප්‍රවර්ගය | 2022 ඇස්තමේන්තුගත | 2022 තථ්‍ය | හිඟය/ අතිරික්තය | *විචල්‍යතාවයන් සඳහා ඉවහල් වන ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම (අදාළ වේ නම්) | 4,444,415 | 5,309,135 | | කොන්සියුලර් සේවාව සහ වීසා ඉල්ලීම් සඳහා මතු වූ අනපේක්ෂිත ඉල්ලුම |
| සම්පූර්ණ වියදම | 17,860,010 | 14,798,255 | | |
| පුනරාවර්තන | 17,379,611 | 14,704,722 | | භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස් අනුව වියදම් පාලනය කරන ලදී. |
| ප්‍රාග්ධන | 480,399 | 93,533 | | ආර්ථික අභියෝග හමුවේ භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති උපදෙස් අනුව, කැන්බරා සහ ස්ටොක්හෝම් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල තුළ සිදු කිරීමට අපේක්ෂිත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකෙරිණි. |

*ආදායම් සහ වියදම්වල සැලකිය යුතු විචලනයන් සඳහා වන ප්‍රධාන හේතු මෙහි කෙටියෙන් දක්වා ඇත.

## 3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/A/FM/02/2022/10    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2023 මැයි 19 දින

ලේකම්
විදේශ කටයුතු අමාත්‍යාංශය

**ශීර්ෂය - 112- විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 112- විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2019 වර්ෂයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත පවරන ලද රු.16,000,000ක් වූ වාහනයක් හා 2020 වර්ෂයේ අපහරණය කරන ලද රු.21,250,000ක වාහන 05ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර රු.4,200,000ක් වූ වාහනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මගීවාහන ශේෂය තුළ දෙවරක් සටහන් කර තිබුණි.

(ආ) වාහන 10ක් හා වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත්ව නොතිබුණු අතර වාහනය කුමක්ද යන්න හඳුනා ගැනීමට වාහන අංකයක් නොමැතිව වැන් ලෙස එක් වාහනයක් සඳහා රු.252,730ක් ඇතුළත් කර තිබුණි.

### 1.6.2. විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ විදේශ දූත මණ්ඩල 66ක රු.12,302,725,029ක පුනරාවර්තන වියදම් හා රු.39,229,873ක මූලධන වියදම් සඳහා වවුචර්, රු.3,736,755ක ආරක්ෂිත තැන්පතු/තත්කාර්ය අතුරු අග්‍රිම කපා හැරීම/ පියවීම සඳහා අදාළ ලේඛන, රු.11,508,887,742ක භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් සඳහා උපලේඛන හා රු.7,264,782,498ක වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි හෝ විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 දරන මුදල් රෙගුලාසිය | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් එකතුව රු. 699,419ක් වූ තැන්පතු 06ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | අනුයුක්ත කළ නිලවාහන හිමිකම් ඇති නිලධාරීන් තම මූල්‍යමය සීමාවන් තුළ සිය රාජකාරී අවශ්‍යතා සපුරාගත යුතු අතර අතිරේක ඉන්ධන ලබාගන්නේ නම් අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවද නිලධාරීන් 06 දෙනෙකු රු.186,920ක අතිරේක ඉන්ධන ලබාගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 142 ඡේදය | රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදාහැරීම අදාළ පත්කිරීම් බලධරයාගේ අනුමැතිය මත සිදුකල යුතු වුවත් අමාත්‍යාංශය මඟින් ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය වෙත එසේ විධිමත්ව මුදාහැරීමක් සිදුනොකර නිලධාරීන් අනුයුක්ත කිරීමක් සිදුකර ඔවුන්ගේ වැටුප් ලෙස රු.12,917,591ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඇ) 2016 ජනවාරි 08 දිනැති අංක 01/ 2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා 2019 ජූලි 22 දිනැති අංක 01/ 2016 (i) දරන චක්‍රලේඛය | රජයට අවශ්‍ය හදිසි සේවා සැපයීම සඳහා 2021 අගෝස්තු 01 දින සිට බලාත්මක වන පරිදි උපාය මාර්ගික සන්නිවේදන ඒකකයක් නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුක්තව පිහිටුවා තිබුණි. චක්‍රලේඛ උපදෙස්වලට අනුව මෙවැනි කාර්යයන් සඳහා ගෙවීම් දින 90ක් නොඉක්මවන කොන්ත්‍රාත් සඳහා පමණක් සීමා විය යුතු නමුත් වර්ෂයක කාලයක් සඳහා මෙම නිලධාරීන් බඳවාගෙන තිබුණි. චක්‍රලේඛ උපදෙස් පරිදි කොන්ත්‍රාත් කාර්ය සඳහා ලබාදිය හැකි උපරිම දීමනාව රු.150,000ක් වුවත් ඔවුන් වෙනුවෙන් රු.3,796, 550ක් වැයකර තිබුණි. |
| (ඉ) 2015 ජූලි 23 දිනැති අංක 07/ 2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 08 vii ඡේදය | එක් එක් මාසයේ දායක මුදල ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබීමට සැලැස්විය යුතු වුවත්, 2022 ජුනි 30 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත්කර තිබූ රු.716,784ක දායක මුදල් එසේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යවා නොතිබුණි. |

## 2.2 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

### (අ) 7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුම

(i) මෙම අග්‍රිම ගිණුමේ ශේෂය 2013 හා ඊට පෙර වර්ෂවලට අදාළ නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ රු.89,919,237ක් වූ අග්‍රිම ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,958,719 ක් එනම් සියයට 4.4 ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණක් නිරවුල් කර තිබුණි.

(ii) විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්ය මණ්ඩලයට ලබාදෙන ලද නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වලින් රු.55,619,842ක් වූ තැන්පතු 242ක්ම භාවිතා නොකරන නිවාසවලට අදාළ වී තිබුණි. මෙයින් රු.12,296,875ක් වර්ෂ 20 ඉක්මවා තිබුණි. රු.39,482,801ක් වර්ෂ 10ත් 20ත් අතරද රු.3,840,166ක් වූ ඉතිරිය වර්ෂ 09 ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 250 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(iii) කාර්ය නිමවූ විගස තත්ත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් නොපියවූ අග්‍රිම ශේෂය තුළ රු.29,861,398ක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම 127ක් පැවති අතර ඉන් රු.699,358ක් වර්ෂ 20ක් ඉක්මවා තිබූ අතර රු.12,834,946ක් වර්ෂ 10ත් වර්ෂ 20ත් අතරද රු.16,327,094ක් වූ ඉතිරිය වර්ෂ 08ක්ද ඉක්මවා තිබුණි.

### (ආ) 7002-0-0-35-22 අග්‍රිම ගිණුම

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම අග්‍රිම ගිණුම් ශේෂය තුළ නොපියවූ අත්තිකාරම් රු. 364,525,410ක් වූ අතර එම වටිනාකමින් රු.318,762,686ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වී තිබුණි. මෙයින් රු.62,637,985ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 108කට අදාළ වූ අතර එයින් රු.2,237,738ක් වර්ෂ 20ක් ද රු.14,338,555ක් වර්ෂ 10ක් ද ඉක්මවා තිබුණි. රු.22,712,529ක් වර්ෂ 05ක් සහ වර්ෂ 10ත් අතර විය.

(ii) වසා දමන ලද දූත මණ්ඩල 04කට අදාළ දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබන ලද නිරවුල් නොකරන ලද තැන්පතු මුදල රු.19,573,769ක් වී තිබුණි.

(iii) නොපියවූ අත්තිකාරම් තුළ රු.17,486,532ක් තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර එයින් වර්ෂ 20 ඉක්මවූ රු.2,526,120ක් ද වර්ෂ 10 ඉක්මවූ රු.2,227,286ක් ද වර්ෂ 05 ඉක්මවූ රු.5,458,192ක් ද වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 අනුව අතුරු අග්‍රිමයක් දෙන කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවත් අලාභහානි යටතේ දක්වා තිබූ විදේශ දූත මණ්ඩල 02කට අදාළව දෙන ලද එකතුව රු.548,054ක නොපියවූ අත්තිකාරම් සඳහා වර්ෂ 09 සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) විදේශ දූත මණ්ඩල කාර්යාල 07ක බැංකු සැසඳුම් ප්‍රකාශයේ මුදල් පොතට අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සටහන (viii) (අ) හි දක්වා ඇති මුදල් පොතේ ශේෂය අතර නොසැසඳීම් හා විදේශ දූත මණ්ඩල කාර්යාල 08ක බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන බැංකු ප්‍රකාශය අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සටහන (viii) (අ) හි දක්වා ඇති බැංකු ශේෂය අතර නොසැසඳීම් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ වලංගු කාලය ඉක්මවන අමාත්‍යාංශයේ හා පැවති රාජ්‍ය අමාත්‍යාංශය රු.6,509,030ක් වූ චෙක්පත් 120ක් හා විදේශ දූත මණ්ඩලයක ඇ.ඩො. 2500ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා කාලය තුළ අමාත්‍යාංශයේ රු.1,003,884ක් වූ චෙක්පත් 14ක් හා 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ කැන්බරා හා බර්ලින් දූත මණ්ඩලවල තැන්පත් කළ චෙක්පත් 05ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උපලබ්ධි වී නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේ සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුළ අමාත්‍යාංශයේ රු.3,185,169ක් හා විදේශ දූත මණ්ඩල දෙකක චෙක්පත් 12ක් 2000 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසයක හඳුනාගෙන නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශයෙහි 2021 වර්ෂයේ දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුළ බැංකු ගිණුමට සෘජුව කරන ලද ලැබීම් රු.5,620,093ක් හඳුනාගෙන නොතිබුණි.

(ඊ) ලොස් ඇන්ජලීස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ.ඩො.1583ක් නිරවුල් කර නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 395 (ආ) අනුව දූත මණ්ඩල 05ක ගිණුම් 07ක් සඳහා පිළියෙළ කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම.

(අ) සෞදි අරාබියේ රැකියාවක් සඳහා පිටත්ව ගොස් තිබුණු පුද්ගලයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් ව තිබුණු අතර අනතුර සිදු වී වර්ෂ 10 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු වන්දි මුදලක් ලැබී නොතිබුණි. මේ සම්බන්ධ ගොනුව වර්ෂ 03කට ආසන්න කාලයක් රටවාහන දෙපාර්තමේන්තුව තුළ අස්ථානගත වීම සම්බන්ධයෙන් සොයා නොබැලීම, නියමිත නඩුවාර සඳහා තානාපති කාර්යාලය අධිකරණයට ඉදිරිපත් නොවීම සහ 2019 වර්ෂයේදී පෞද්ගලික නීති සේවා සපයන ආයතනයකට නඩුව භාරදීමට කටයුතු කරන බව සඳහන් වුවද 2022 වර්ෂය දක්වා එම කාර්යන් ඉටු නොවීම යනාදී කරුණු මෙම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වී පවතින බව නිරීක්ෂණය විය.

(ආ) කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා 2009 දෙසැම්බර් 19 දින විදේශ ගත වූ තැනැත්තියක් 2012 ජනවාරි 29 දින මියගොස් තිබූ අතර මරණයට ආසන්න හේතුව හෘදයාබාදයක් ලෙසද මරණයට බලපෑ හේතුව විමර්ශනය කරමින් පවතින බවද මරණ සහතිකයෙහි සඳහන් කර තිබුණි. තවද ශ්‍රී ලංකාවට රැගෙන ආ මෘත දේහය සම්බන්ධයෙන් සිදුකරන ලද හදිසි මරණ පරීක්ෂණය අනුව මියගිය තැනැත්තියගේ අවයව ඉවත් කර ඇති බවත් ශරීරයේ සීරීම් ලකුණු විශාල ප්‍රමාණයක් ඇති බවත් සඳහන් කර තිබුණි. මරණය සිදු වී වර්ෂ 10ක් ගත වුවද මෙම මරණයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමට තානාපති කාර්යාලය අසමත් වී තිබූ අතර මෙම තැනැත්තියට කිසියම් වන්දි මුදලක් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමේදී තානාපති කාර්යාලයේ නිලධාරීන් කාර්යක්ෂමව කටයුතු සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂ 17ක පමණ කාලයක් කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවයේ යෙදී සිටි තැනැත්තියක් තමා අසනීපයෙන් පසුවන බැවින් ප්‍රතිකාර ලබාගැනීමට අවස්ථාව ලබානොදෙන බව පවසමින් 2011 ඔක්තෝබර් 13 වන දින තානාපති කාර්යාලයේ සුරක්ෂාගාරයේ (Safe house) නැවතීමට පැමිණ තිබුණු අතර 2011 ඔක්තෝබර් 17 වන දින මෙම තැනැත්තිය

සුරක්ෂාගාරය තුළම මරණයට පත්ව තිබුණි. මියගිය අය ජීවතුන් අතර සිටියදී හාම්පුතා විසින් වකුගඩුවක් ඉවත් කරගත් බවට චෝදනා ඇති බැවින් ඒ සඳහා අදාළ විමර්ශනයන් සිදුකර වාර්තාවක් ලබාගැනීමත් මරණ පරීක්ෂණ වාර්තාවක් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමටත් කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් (කොන්සියුලර්) විසින් නියමකර තිබුණද මරණය සිදු වී වර්ෂ 11 ක් ගත වුවද එම වාර්තා ලබාගැනීමට තානාපති කාර්යාලය අසමත් වී තිබුණි.

(ඇ) ජෙද්දාහිදි 2011 වර්ෂයේදී මරණයට පත්වූ පුද්ගලයෙකුගේ මරණයට හේතුව සියදිවි නසාගැනීමක්ද නැතහොත් අනතුරකින් සිදු වූවක්ද යන්න සනාථ කරගැනීම සඳහා පොලිස් වාර්ථා ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නොහැකි වී තිබුණි. මේ නිසා රක්ෂණාවරණ ලබාගැනීම සහ වන්දි මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් තානාපති කාර්යාලය කාර්යක්ෂමව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) රියාද් විදේශ දූත මණ්ඩලයෙහි 2012 වර්ෂයේ වන්දි ඉල්ලීම් ලිපිගොනු 2018 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොමැති බවත් වසර 10ක් ගතවුවද වන්දි හිමිකම් පවතීද යන්න සනාථ කර ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිවයුතු අන්දමින් කටයුතු කර නොමැති බවත් ඒ සම්බන්ධයෙන් කරන ලද නියැදි නිරීක්ෂණය විය.

(ඊ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් වන අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණ ද මෙම වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇති කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 17ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

(අ) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලවලට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු වලින් රු.19,640,441ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු.16,141,919ක අලාභ හානි සම්බන්ධයෙන් ගත් නෛතික ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි. වර්ෂ 05ත් වර්ෂ 10ත් අතර කාල පරාසයක පවතින නොවිසඳී ඇති රු.1,275,303 ක් වූ අලාභ හානි ද විය.

(ආ) හේග් විදේශ දූත මණ්ඩලයේ සිද්ධීන් 04 කට අදාළව රු. 661,093 ක් සිංගප්පූරු විදේශ දූත මණ්ඩලයේ සිද්ධීන් 05කට අදාළව රු.605,810ක්, වියානා විදේශ දූත මණ්ඩලයේ සිද්ධීන් 02කට අදාළව රු.905,901ක් හා ෆ්‍රැන්ක්ෆට් විදේශ දූත මණ්ඩලයේ සිද්ධියකට අදාළව රු.297,045 ක් ලෙස එකතුව රු.2,469,849ක නිවාස ආරක්ෂිත තැන්පතු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා වර්ෂ 08 සිට 20 දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 104 (i) අනුව පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු වුවත් 2014 හා 2015 වර්ෂවලදී පිටෝරියා විදේශ දූත මණ්ඩලයේ සිදු වූ එකතුව රු. 606,827ක වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් හා විදේශ දූත මණ්ඩල 03ක සිද්ධීන් 04කට අදාළව රු.259,800ක නැතිවීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 106 අනුව ඌනතාවයක්, අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා මුදල්, මුද්දර, ටිකට්පත් ආදිය නැතිවූ විටක ඒ නැති වූ මුදල වහාම පූරණය කල යුතු වුවත් ලන්ඩන් විදේශ දූත මණ්ඩලයේ රු. 1,014,295ක මුදල් සොරකම් කිරීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) විදේශ දූත මණ්ඩල පවතින ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දූත මණ්ඩල දෙකක් සඳහා නිල නිවාස කුලී වශයෙන් රු.55,583,113ක් ගෙවා තිබුණි.

(ආ) විදේශ තානාපති කාර්යාල සඳහා කාර්ය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 04 වගන්තිය අනුව ලබාගත් ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමට පෙර නිලධාරියෙකු මියගිය හොත් හෝ විශ්‍රාම ගිය හොත් ඔහුගෙන් රජයට අයවිය යුතු සියලුම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් මියගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.472,532ක ණය ශේෂයක් අයකර ගැනීමට පවතින අතර ඉන් රු.273,560ක් වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවතුණු අතර විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.962,265ක ණය ශේෂයක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) සේවය හැර ගොස් ඇති නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු.1,317,101ක ශේෂයක් අයවිය යුතුව පවතින අතර එම ණය ශේෂය තුළ වර්ෂ 05ට වැඩි ශේෂය රු.662,946ක් විය.

(ඉ) සේවය අවසන් කළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.347,495ක ණය ශේෂයක් අයවිය යුතුව පවතින අතර වර්ෂ 5ට වැඩි රු.299,955ක් ද පැවතුණි.

(ඊ) වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරින් 14 දෙනෙකුගේ රු.1,499,176ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 611ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 620ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 21ක් හා අතිරික්ත තනතුරු 30ක් විය. දූත මණ්ඩල අනුමත කාර්ය මණ්ඩලය 528ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 370ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 158ක් විය. තවද දූත මණ්ඩලවල ස්ථානීය නොවන කාර්ය මණ්ඩලය 582ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 403ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 179ක් විය.

(ආ) අමාත්‍යාංශයේ ද්විතියික මට්ටමට අයත් අනුමත සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පිළිවෙලින් 74ක් හා 169ක් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 100ක් හා 194ක් වූයෙන් අතිරික්තය 26ක් හා 25ක් විය.

(ඇ) අනුමත අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සංඛ්‍යාව 09ක් වුවද විධිමත් අනුමැතියකින් තොරව වැඩ බැලීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරු 10 දෙනෙක් ඇතුළුව තථ්‍ය ප්‍රමාණය 01ක් විය.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

# 4 වැනි පරිච්ඡේදය : ප්‍රධාන කාර්ය සාධන දර්ශක

## 4.1. අමාත්‍යාංශයේ සමස්ත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සාක්ෂාත් කර ගැනීම

ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු තුළින් විදේශයන් තුළ ශ්‍රී ලංකාවේ ජාතික අභිලාෂයන් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා, 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල සාරාංශය මෙම පරිච්ඡේදය ඔස්සේ විග්‍රහ කෙරේ.

අමාත්‍යාංශය සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල මඟින් ඉටු කරනු ලබන රාජකාරී සහ කාර්යයන් බොහෝමයක් නියෝජන භූමිකාවකින් යුක්ත බැවින්, එහි රාජකාරී හා කාර්යයන් බොහෝ දුරට අස්පෘශ්‍ය ස්වභාවයක් ගනී.

2022 වසරේ දී අමාත්‍යාංශයේ කාර්ය සාධනය ගත් කල මූලික වශයෙන් අවධානය යොමු වූයේ කොවිඩ්-19 වසංගතය සහ ඉන් පසුව ඇති වූ ගෝලීය අර්බුද හේතුවෙන් අහිතකර බලපෑම්වලට ලක් වූ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි ය. මෙම පසුබිම තුළ, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සිය ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික කටයුතු හරහා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය, රැකියා, වෙළෙඳාම සහ ආයෝජන පුළුල් ලෙස ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළෝය. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල පහත සඳහන් ප්‍රමුඛතා ක්ෂේත්‍ර කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින් සිය රාජකාරී සහ කාර්යයන් ඉටු කළහ.

- ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)
- දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)
- බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු
- සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මිනිසුන් අතර සබඳතා
- ආරක්ෂක සහයෝගීතාව
- මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු
- කොන්සියුලර් සහය, සංක්‍රමණික කම්කරු සුබසාධනය සහ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්
- විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු
- මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය
- වෙනත්

2022 වසරේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව අමාත්‍යාංශය සිය ප්‍රධාන කාර්ය සාධන දර්ශක හරහා සාක්ෂාත් කර ගත් සමස්ත කාර්ය සාධනය පහත වගුව-IV හි පෙන්වා ඇත.

*වගුව-IV- ප්‍රධාන කාර්ය සාධන දර්ශක*

| # | ප්‍රමුඛ අවධානයක් යොමු කෙරෙන අංශ/ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානයන් | | |
|---|---|---|---|---|
| | | 100-70% | 70-40% | 40ට අඩු% |
| 1. | බහුපාර්ශ්වික සංසද හමුවේ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | | |
| 2. | කලාපීය සංවිධාන සමඟ සම්බන්ධ වීම | | | |
| 3. | ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික සංචාර සංඛ්‍යාව | | | |
| 4. | ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන/ඒකාබද්ධ කමිටු/ රැස්වීම්/ සාකච්ඡා සංඛ්‍යාව | | | |
| 5. | විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන් සමඟ පවත්නා සබඳතා | | | |
| 6. | කොවිඩ්19 ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගත් පියවර | | | |
| 7. | සෞඛ්‍ය රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ සහයෝගීතාව | | | |
| 8. | අමාත්‍යාංශයේ උපායමාර්ගික සන්නිවේදන ප්‍රවේශය යටතේ සිදු කළ මුලපිරීම් සංඛ්‍යාව | | | |
| 9. | ආරම්භ කළ/අවසන් කළ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව | | | |
| 10. | ජනමාධ්‍ය සමඟ පැවැත්වූ නිරතවීම් (විදේශයන් තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සිදු කළ රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ඵලදායීත්වය) | | | |
| 11. | වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | |
| 12. | සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | |
| 13. | අපනයන ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | |
| 14. | ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | |
| 15. | අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ සිදු කළ මුලපිරීම් සංඛ්‍යාව | | | |
| 16. | ආරක්ෂක සහයෝගීතාව සම්බන්ධ කටයුතු | | | |
| 17. | සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | |
| 18. | ශ්‍රී ලාංකිකයන් සඳහා ලබා දුන් ශිෂ්‍යත්ව අවස්ථා /විදේශ අධ්‍යාපන බලධාරීන් සමඟ සිදු කළ නිරතවීම් | | | |
| 19. | විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව වැඩිදියුණු කිරීම | | | |
| 20. | කොන්සියුලර් සේවා සහ කම්කරු සුභසාධනය යටතේ සිදු කළ මුලපිරීම් සංඛ්‍යාව | | | |
| 21. | මානව සම්පත් ඉහළ නැංවීම්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය | | | |

## 4.2. ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සාක්ෂාත් කරගැනීම: හරස් කැපුම් කෂේත්‍ර සහිත අංශ

### 4.2.1 ආර්ථික කටයුතු අංශය

| ආර්ථික කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික)**<br>- අපනයන ප්‍රවර්ධනය කිරීම<br>- ඍජු විදේශ ආයෝජන ලබා ගැනීම<br>- සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම<br>- විදේශ රැකියා ප්‍රවර්ධනය<br>- වෙළඳ සාකච්ඡා සඳහා ක්‍රියාශීලීව සහභාගි වීම | | 85% | |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (බහුපාර්ශ්වික)**<br>- බහුපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- සිදු කළ සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ නියෝජිතයන් සිදු කළ සාකච්ඡා | 90% | | |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (තාක්ෂණික සහයෝගීතාව)**<br>- බහුපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- සිදු කළ සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ නියෝජිතයන් සිදු කළ සාකච්ඡා | | 85% | |

## 4.2.2 ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්ත මර්දන අංශය

| ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්ත මර්දන අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **එල්ටීටීඊ සංවිධානය ආශ්‍රිත ක්‍රියාකාරකම්**<br><br>- රටවල් 32 ක් තුළ කොටි සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීම පවත්වාගෙන යාම<br><br>- විදේශගත එල්ටීටීඊ සාමාජිකයින් සම්බන්ධ නඩු සම්බන්ධයෙන් පියවර ගැනීම<br><br>- ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම්වලට අදාළව පවතින නඩු පිළිබඳ වාර්තා කිරීම | 95% | | |
| **ත්‍රස්තවාදයට එරෙහි ප්‍රයත්නයන්ට සහය වීම**<br><br>- ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය ප්‍රවර්ධනය කරන ත්‍රස්තවාදී අන්තර්ගතයන් සහ වෙනත් පණිවිඩ පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කිරීම<br><br>- ප්‍රතිත්‍රස්තවාදය සම්බන්ධ තොරතුරු හුවමාරු කිරීම සම්බන්ධීකරණය කිරීම<br><br>- ප්‍රතිත්‍රස්තවාදයට අදාළ කාරණාවලදී විදේශ රටවල් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා පහසුකම් සැලසීම<br><br>- පුහුණු, අරමුදල් සහ තාක්ෂණික අවශ්‍යතා සඳහා දේශීය නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහය වීම | | 82% | |
| **ත්‍රස්තවාදයට එරෙහි නීතිමය රාමුව**<br><br>- ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයට එරෙහිව ජාත්‍යන්තර මට්ටමේ දක්වන දායකත්වයට සහය ලබා දීම<br><br>- ප්‍රතිත්‍රස්තවාදී ප්‍රයත්නවලදී කලාපීය සම්බන්ධීකරණය ඇති කිරීම/සංවර්ධනය කිරීම<br><br>- ද්විපාර්ශ්වික සම්බන්ධීකරණය පිළිබඳ විධිමත් රාමුවක් සකස් කිරීම. ප්‍රතිත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදයට එරෙහි වීම (CVE)/ ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම (PVE)<br><br>- දේශීය උත්සාහයන්ට සහය වීම | | 82% | |
| **ප්‍රචණ්ඩකාරී අන්තවාදී (CVE) ප්‍රයත්නයන්ට එරෙහිව සහාය වීම**<br><br>- PVE/CVE සම්බන්ධ ව්‍යාපෘති සඳහා ද්විපාර්ශ්වික හවුල්කරුවන් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය<br><br>- දේශීය විමසීම් සඳහා සහය වීම | 95% | | |

## 4.2.3 සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය

| සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය තුළ සාගර කටයුතු සම්බන්ධයෙන් නිශ්චිත අවධානයක් ලබා දීම**<br><br>ශ්‍රී ලංකාව තුළ සමුද්‍රීය ආපදා සඳහා සූදානම් වීමේ යාන්ත්‍රණයක්/අධිකාරියක් ඕස්ට්‍රේලියාව සමඟ එක්ව ස්ථාපිත කිරීම.<br><br>සමුද්‍රීය ආපදා සඳහා සූදානම් වීමේ යාන්ත්‍රණය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම<br><br>ජාත්‍යන්තර මුහුදු පත්ල අධිකාරිය (ISA) සමඟ ශ්‍රී ලංකාව පවත්නා සබඳතා ප්‍රවර්ධනය කිරීම<br><br>ජාත්‍යන්තර මුහුදු පත්ල අධිකාරිය (ISA) සමඟ පවත්නා සබඳතා සම්බන්ධයෙන් පැවති පාර්ශ්වකරුවන්ගේ රැස්වීම<br><br>2022 අප්‍රේල් 13-14 යන දිනවල පලාවු හි පැවති 7 වැනි Our Ocean සමුළුවට සහභාගී වීම සහ තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුද සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාරව භාවිතා කිරීම නමැති 14 වැනි තිරසාර සංවර්ධන අභිලාෂය ක්‍රියාවට නැංවීම සඳහා 2022 ජූනි 27-ජූලි 1 දක්වා ලිස්බන් හි පැවති එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගී වීම. | | 75% | |
| **ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තුළ පරිසරය සහ දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් නිශ්චිත අවධානයක් ලබා දීම**<br><br>බ්ලූ ප්ලැනට් අරමුදල යටතේ එක්සත් රාජධානියේ රජය සමඟ එක්ව ප්ලාස්ටික් කසළ, ජෛව විවිධත්වය සහ මුහුදු ආහාර කර්මාන්තය පිළිබඳ සහයෝගීතාව පැවැත්වීම<br><br>සමුද්‍රීය ආරක්ෂාව (MSS) ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මැක්ස් ප්ලාන්ක් පදනම සහ UNODC සමඟ සහයෝගීතාව පැවැත්වීම<br><br>දේශගුණික විපර්යාස පිළිබඳ මූලපිරීම්, සමුද්‍රීය ආපදා සූදානම් වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම<br><br>2022 නොවැම්බර් **7-8** යන දිනවල ඊජිප්තුවේ පැවති UNFCCC කෝප් **27** සමුළුවට සහභාගී වීම | | 87% | |

| සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ**<br>ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා MSR නිෂ්කාශන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සඳහා සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ (MSR) මාර්ගෝපදේශ සහ රෙගුලාසි සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම. | | | 50% |
| **ජාත්‍යන්තර, කලාපීය සහ උප කලාපීය සංවිධාන හමුවේ ශ්‍රී ලංකාවේ කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම, එම සංවිධානවල අරමුණු ශක්තිමත් කිරීම සහ රටවල් එකිනෙකට සම්බන්ධ කරන්නෙකු ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදහා දැක්වීම සහ, එමඟින් රටේ අවශ්‍යතා සම්බන්ධයෙන් ගත හැකි ලාභාංශ ඉහළ නැංවීම**<br>ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IORA) ආශ්‍රිත රැස්වීම්: සම්බන්ධීකරණ රටවල සහ IORA ක්‍රියාකාරී ප්‍රධානීන්ගේ මඩුල්ලේ පළමු රැස්වීම<br>සාගර විද්‍යාව සහ පරිසරය පිළිබඳ විශිෂ්ටත්වය සඳහා වන IORA මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම<br>ශ්‍රී ලංකාව වටා ඇති සමුද්‍ර ආරක්ෂිත ප්‍රදේශ (MPA) සම්බන්ධයෙන් අදාළ රේඛීය ආයතන (ප්‍රධාන වශයේ ධීවර හා වනජීවී අමාත්‍යාංශ) සම්බන්ධීකරණය කිරීම.<br>ජාත්‍යන්තර මුහුදු තෘණ දිනය ප්‍රකාශයට පත් කිරීම<br>පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්: පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තියට අදාළ දේශීය රැස්වීම්<br>දේශගුණික සහ සාගර අවදානම් දර්ශකය [CORVI] වේගවත් තක්සේරුව | 90% | | |

## 4.2.4 ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය

| ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **ප්‍රතිපත්ති අරමුණු (ප්‍රතිපත්ති සහ පර්යේෂණ), ප්‍රමුඛතා, ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධක දර්ශක**<br>- අංශ/දූත මණ්ඩල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කාලෝචිත ලෙස සකස් කිරීම<br>- සකස් කළ පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව<br>- සංවිධානය කළ වෙබිනාර් සාකච්ඡා/නිල නොවන සාකච්ඡා/ සාකච්ඡා සංඛ්‍යාව | | 75% | |
| **කාර්ය සාධනය ඇගයීම සහ අධීක්ෂණය**<br>- අංශ/දූත මණ්ඩල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>- නියමිත වේලාවට වාර්තා සම්පූර්ණ කිරීම සහ ඉදිරිපත් කිරීම | 100% | | |
| **මානව සම්පත් සංවර්ධනය**<br>- ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගැනීම සඳහා වන විවෘත තරඟ විභාග පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය පිළිබඳව සාකච්ඡා කිරීමට/එම කටයුතු සංවිධානය කිරීමට/අවසන් කිරීමට පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වී සිදු කළ නිරතවීම් සංඛ්‍යාව<br>- විවෘත තරඟ විභාගය පැවැත්වීමට කටයුතු කිරීම | 100% | | |
| **ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටළු පිළිබඳව සහ දීප ව්‍යාප්ත සේවා සඳහා නව ප්‍රවර්ධන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳව සාකච්ඡා කිරීම**<br>- පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන සමඟ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව<br>- මෙම කාරණය සම්බන්ධයෙන් පත් කරන ලද අභ්‍යන්තර කමිටුව සමඟ පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව | | | 50% |

| ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **පුහුණුවීම් සහ සංවර්ධනය**<br><br>**-** සම්බන්ධීකරණය කළ විදේශ ලද පුහුණුවීම් සංඛ්‍යාව<br><br>- විදේශ පුහුණුවීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සංඛ්‍යාව<br><br>- විදේශ පුහුණුවීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන නිලධාරීන් සංඛ්‍යාව<br><br>- සම්බන්ධීකරණය කළ විදේශීය පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සංඛ්‍යාව<br><br>- ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වන 1 වැනි සහ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය පිළිබඳව සාකච්ඡා කිරීමට/සංවිධානය කිරීමට/අවසන් කිරීමට පාර්ශවකරුවන් සමඟ සිදු කළ නිරතවීම් සංඛ්‍යාව<br><br>- පුහුණුවීම් සඳහා සහභාගී වූ තානාපතිවරුන්/නම් කළ මහ කොමසාරිස්වරුන් සංඛ්‍යාව<br><br>- සංවිධානය කරන ලද දේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br><br>- පුහුණුව ලැබූ ශ්‍රී ලංකා විදේශ සේවයේ/ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන නිලධාරීන් සංඛ්‍යාව | | **75%** | |

## 4.2.5 මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය

| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලට අදාළ මෙවලම් භාවිතා කිරීම**<br>මාධ්‍ය නිවේදන සහ සමාජ මාධ්‍ය පළ කිරීම් සංඛ්‍යාව<br>පවත්වන ලද මාධ්‍ය සාකච්ඡා සංඛ්‍යාව<br>පහසුකම් සපයන ලද විදේශීය මාධ්‍යකරුවන්/කණ්ඩායම් සංඛ්‍යාව<br>නිකුත් කළ ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | **100%** | | |

## 4.2.6 සාර්ක් අංශය

| සාර්ක් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු - කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංගමය (SAARC) සමඟ සම්බන්ධ වීම**<br>අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් කෘෂිකර්මය, සෞඛ්‍ය, බලශක්තිය සහ සංස්කෘතික යන ක්ෂේත්‍රවලට අදාළව SAARC ආශ්‍රිත රැස්වීම් (අථත්‍ය/භෞතික), ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සහ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකාවේ නිලධාරීන් සඳහා පහසුකම් සැලසීම<br>අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් කෙටුම්පත් සඳහා එකඟතාව ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම<br>SAARC මහ ලේකම් කාර්යාලය සඳහා ශ්‍රී ලංකාවෙන්ඩෙස්ක් නිලධාරියකු බඳවා ගැනීම<br>SAARC කලාපීය මධ්‍යස්ථාන සහ SAARC විශේෂිත ආයතන සඳහා වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් තොරතුරු බෙදා හැරීම<br>SAARC කලාපීය මධ්‍යස්ථාන/සාර්ක් විශේෂිත ආයතනවලින් ලැබෙන ශිෂ්‍යත්ව පිළිබඳ තොරතුරු අදාළ රේඛීය ආයතන සමඟ බෙදා ගැනීම<br>සාර්ක් ලේකම් කාර්යාලය, සාර්ක් කලාපීය මධ්‍යස්ථාන සහ සාර්ක් විශේෂිත ආයතනවල වාර්ෂික කොටස් දායකත්වය ලබා දීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශය සහ අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධ වීම | **90%** | | |

## 4.2.7 එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

| එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **මානව හිමිකම්**<br><br>මාර්තු, ජූනි සහ සැප්තැම්බර් යන මාසවල මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී සිදු කළ සැලකිය යුතු මැදිහත්වීම් සහ දායකත්වයන් සංඛ්‍යාව<br><br>ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉදිරිපත් කළ රැස්වීම්/අවස්ථා සංඛ්‍යාව<br><br>මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේදී සහය දක්වන ලද/ සම අනුග්‍රහය දක්වන ලද යෝජනා සංඛ්‍යාව<br><br>ශ්‍රී ලංකාවේ වාරිකා වාර්තා ඉදිරිපත් කිරීම (CEDAW, CMW, ICESCR, ICCPR, ICED, CAT)<br><br>විශේෂ වාර්තාකරුවන්ගේ මෙරට සංචාර<br><br>ශ්‍රී ලංකාව පිළිබඳ UPR නිර්දේශ මත සිදු කරන ලද පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව (විදේශ කටයුතු අමාත්‍යාංශය මෙම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරනු ඇත) | **95%** | | |
| **මානුෂීය කටයුතු**<br><br>- **UNHCR -** පවත්වන ලද අන්තර්ක්‍රියා සංඛ්‍යාන සහ ප්‍රතිඵල<br><br>- **ICRC -** පවත්වන ලද අන්තර්ක්‍රියා සංඛ්‍යාව සහ ප්‍රතිඵල | **95%** | | |
| **එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවේ 77 වැනි සැසි වාරය**<br><br>2022 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල සමුළුවේ 77 වැනි සැසිවාරයේ ඉහළ පෙළේ කොටස සඳහා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ නියෝජිත පිරිස සාර්ථකව සහභාගී වීම<br><br>77 වැනි සැසියේ දී සිදු කළ මැදිහත්වීම් /ප්‍රකාශ සංඛ්‍යාව<br><br>77 වැනි සැසියේ දී ශ්‍රී ලංකාව විසින් සහය දක්වන ලද මුලපිරීම් / යෝජනා සංඛ්‍යාව | **100%** | | |

| එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **සමාන අදහස් ඇති අනෙකුත් කණ්ඩායම් හමුවේ ශ්‍රී ලංකාව**<br>**NAM -** සම්බන්ධීකරණය කළ රැස්වීම් සංඛ්‍යාව<br>- මැදිහත්වීම් සකස් කිරීම<br>- ශ්‍රී ලංකාව විසින් අනුග්‍රහය දක්වන ලද මුලපිරීම් සංඛ්‍යාව<br>**G 77 -** සම්බන්ධීකරණය කළ රැස්වීම් සංඛ්‍යාව<br>- මැදිහත්වීම් සකස් කිරීම<br>- ශ්‍රී ලංකාව විසින් අනුග්‍රහය දක්වන ලද මුලපිරීම් සංඛ්‍යාව | **95%** | | |
| **අපේක්ෂකත්වය**<br>- එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ පවත්නා ද්විපාර්ශ්වික සහයෝගීතාව ගැඹුරු කිරීමට දායක වන අයුරින් ශ්‍රී ලංකාව විසින් සහය දක්වන ලද වෙනත් රටවල අපේක්ෂකත්ව සංඛ්‍යාව<br>- අපේක්ෂක දත්ත සමුදාය යාවත්කාලීන කෙරිණි<br>- ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති මුලපිරීම් සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා ලබා ගත් අන්‍යෝන්‍ය විධිවිධාන සංඛ්‍යාව | **95%** | | |
| **සාමය ආරක්ෂා කිරීම**<br>භට පිරිස් කාලානුරූපීව යෙදවීම සහ සැපයුම් බෙදා හැරීම<br>සාම සාධක හමුදා යෙදවීම් සම්බන්ධ ද්විපාර්ශ්වික කාරණා සම්බන්ධයෙන් DPKO සමඟ සිදු කළ නිරතවීම් සංඛ්‍යාව<br>බහුපාර්ශ්වික සාම සාධක සංවාද හමුවේ සිදු කළ නිරතවීම් සංඛ්‍යාව | **95%** | | |
| **ජාත්‍යන්තර සංසදවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම**<br>2022 සැප්තැම්බර් මස දක්වා සකස් කර නිකුත් කරන ලද අක්තපත්‍ර සංඛ්‍යාව | **100%** | | |

| එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතාවය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආරක්ෂක සහයෝගීතාව**<br>**නිරායුධකරණය සහ න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීම**<br>ශ්‍රී ලංකාව නියෝජනය කළ රැස්වීම් සංඛ්‍යාව<br>සිදු කරන ලද මැදිහත්වීම් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුලපිරීම් සංඛ්‍යාව<br>අනෙකුත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් සහය දක්වන ලද මුලපිරීම් සංඛ්‍යාව (සම අනුග්‍රාහකත්වය දැක්වීම, ඡන්දය ප්‍රකාශ කිරීම)<br>ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව<br>අදාළ බිම්බෝම්බ තහනම් කිරීමේ කමිටුව සහ ජාතික බිම් බෝම්බ ක්‍රියාකාරී මධ්‍යස්ථානය සමඟ පවත්වන ලද උපදේශන සංඛ්‍යාව<br>එක් එක් නීති සම්පාදන පියවර මත සිදු කරන ලද පසු විපරම් සංඛ්‍යාව<br>සිදු කළ සහ ගෙවන ලද දායකත්වයන් සංඛ්‍යාව<br>නිරායුධකරණ සම්මුතීන්ට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br>ශ්‍රී ලාංකිකයන් සඳහා ලබා ගත් අනුග්‍රාහකත්ව සංඛ්‍යාව | **95%** | | |
| **සෞඛ්‍ය රාජ්‍යතාන්ත්‍රික කටයුතු (බහුපාර්ශ්වික)**<br>ජිනීවා නුවර එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිතායතනය (PRUN) හරහා ශ්‍රී ලංකාව නියෝජනය කළ රැස්වීම් සංඛ්‍යාව<br>සිදු කරන ලද මැදිහත්වීම් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය වී, උපදෙස් යවා ඇති ස්ථාවරයන්/ ප්‍රතිපත්ති සංඛ්‍යාව<br>ඉදිරිපත් කළ ප්‍රකාශ සංඛ්‍යාව<br>සම අනුග්‍රහය දක්වන ලද/සහය දක්වන ලද යෝජනා / ඒකාබද්ධ මුලපිරීම් සංඛ්‍යාව | **95%** | | |

| එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු- යුනෙස්කෝ**<br>වැඩසටහන්, මුලපිරීම් සහ වාර්තා සංඛ්‍යාව<br>සම්බන්ධීකරණය කළ ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව<br>සම්බන්ධීකරණය කරන ලද නාමයෝජනා සංඛ්‍යාව | | 80% | |

## 4.3 කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කරගැනීම: භෞමික අංශ

### 4.3.1 අප්‍රිකානු කටයුතු අංශය

| අප්‍රිකානු කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික)**<br>**ශ්‍රී ලංකාවට උපරිම වෙළඳ සහ ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අප්‍රිකානු කලාපයේ රටවල් සමඟ ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම:**<br>ආර්ථික සහ ආයෝජන සම්බන්ධ අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් සම්බන්ධයෙන් සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව සහ වෙළඳාමට අදාළ පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රතිපත්ති විශ්ලේෂණ සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල සිටින ශ්‍රී ලංකා තානාපතිවරු සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා<br>රේඛීය ආයතන සමඟ පැවැත්වූ සන්නිවේදන කටයුතු/පසු විපරම් ක්‍රියා සංඛ්‍යාව<br>2022 දී පවත්වන ලද ඒකාබද්ධ කොමිෂන් සභා / ඒකාබද්ධ කමිටු සංඛ්‍යාව | | 84% | |

| අප්‍රිකානු කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/ බහුපාර්ශ්වික)**<br>**අප්‍රිකානු කලාපයේ සියලුම රාජ්‍යයන් 55 සමඟ පවත්නා රාජ්‍යතාන්ත්‍රික කටයුතු ඉහළ නැංවීම:**<br>සමගාමී අක්තගැන්වීම් තාර්කිකරණය කිරීම පිළිබඳව සිදු කළ සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල සිටින ශ්‍රී ලංකා නියෝජිතයන් අප්‍රිකානු රටවල නියෝජිතයන් සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>අප්‍රිකානු කලාපයේ නිර්වේතනික කොන්සල් තනතුරු සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම<br>අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ සන්ධාන අංශය සමඟ පැවැත්වූ සන්නිවේදන කටයුතු/පසු විපරම් ක්‍රියා සංඛ්‍යාව | | 87.5% | |
| **ශ්‍රී ලංකාව අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා අත්සන් තබා ඇති රටවල් සමඟ ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීම:**<br>2022 දී පැවැත්වූ ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව<br>රේඛීය ආයතන සහ අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/පසු විපරම් සංඛ්‍යාව | | 85% | |
| **ඒකාබද්ධ කොමිෂන් සභා සහ ද්විපාර්ශ්වික උපදේශන ආදිය පිළිබඳව සිදු කෙරෙමින් පවතින ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් අවසන් කිරීම**<br>ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රතිපත්ති විශ්ලේෂණ සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල සිටින ශ්‍රී ලංකා නියෝජිතයන් අප්‍රිකානු රටවල මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | | 85% | |
| **අප්‍රිකාව සමඟ සම්බන්ධ වීම:**<br>දූත මණ්ඩල පිහිටුවීම සම්බන්ධයෙන් සිදු කළ සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල සිදු කළ සංචාර සංඛ්‍යාව<br>සංවිධානය කරන ලද ඉහළ මට්ටමේ රැස්වීම් සංඛ්‍යාව<br>සිදු කළ පසු විපරම් කටයුතු සංඛ්‍යාව | | 82.5% | |

| අප්‍රිකානු කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89% - 75%** | **74% -50%** |
| **අප්‍රිකාවේ කලාපීය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ පවත්නා සහයෝගීතාව වැඩි දියුණු කිරීම**<br><br>ඉහළ මට්ටමේ බාහිර සංචාර සංඛ්‍යාව<br><br>ශ්‍රී ලංකා තානාපතිවරුන් කලාපීය සංවිධානවල ඉහළ පෙළේ නිලධාරීන් සමඟ පැවැත්වූ රැස්වීම්/ අන්තර් ක්‍රියා සංඛ්‍යාව<br><br>කලාපීය සංවිධානවල සුවිශේෂී වැඩසටහන් සඳහා ආරාධනා ලබා ගැනීමට ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය වීම<br><br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | | 89% | |
| **මානව හිමිකම් කවුන්සිලය (HRC) හමුවේ අප්‍රිකානු සාමාජික රටවල් සමඟ අන්තර්ක්‍රියා පැවැත්වීම:**<br><br>මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකයින් වන අප්‍රිකානු කලාපයේ රටවල් සමඟ පැවැත්වූ රැස්වීම් / දුරකථන සංවාද / අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br><br>විදේශ කටයුතු අමාත්‍යවරයා සාමාජික රටවල සිදු කළ සංචාර සංඛ්‍යාව<br><br>ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල වෙත සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව සහ පසු විපරම් ක්‍රියා | | 82% | |
| **බහුපාර්ශ්වික සංසද හමුවේ ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා අප්‍රිකානු රාජ්‍යවල සහය ලබා ගැනීම තහවුරු කිරීම**<br><br>අපේක්ෂකත්වය සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් අප්‍රිකානු රාජ්‍යයන් සමඟ පැවැත්වූ රැස්වීම් / දුරකථන සංවාද / අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br><br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | | 88% | |

| අප්‍රිකානු කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| **අප්‍රිකානු කලාපය තුළ ආරක්ෂක සහයෝගීතාව ඉහළ නැංවීම:**<br>රේඛීය ආයතන සහ අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/පසු විපරම් සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | | 83% | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ පුද්ගලාන්තර සබඳතා**<br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (මාධ්‍ය නිවේදන සහ සමාජ මාධ්‍ය පළ කිරීම්)<br>පළ කළ මාධ්‍ය නිවේදන සංඛ්‍යාව | | 85% | |
| **අප්‍රිකානු කලාපය තුළ ආරක්ෂක සහයෝගීතාව ඉහළ නැංවීම:**<br>රේඛීය ආයතන සහ අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/පසු විපරම් සංඛ්‍යාව<br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව | | 83% | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ පුද්ගලාන්තර සබඳතා**<br>අප්‍රිකානු රටවල ශ්‍රී ලංකා තානාපතිවරුන් සිය මිත්‍ර පාර්ශ්ව සමඟ සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (මාධ්‍ය නිවේදන සහ සමාජ මාධ්‍ය පළ කිරීම්)<br>පළ කළ මාධ්‍ය නිවේදන සංඛ්‍යාව | | 85% | |

## 4.3.2 අමෙරිකානු අංශය

| අමෙරිකානු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/ බහුපාර්ශ්වික):**<br>රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩි දියුණු කිරීම (සමගාමී අක්ත ගැන්වීම් තාර්කික කිරීම සම්බන්ධයෙන් පැවැත්වූ සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර් ක්‍රියා සංඛ්‍යාව)<br>ගරු විදේශ අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා, විදේශ ලේකම්වරයා, අතිරේක විදේශ ලේකම්වරයා, ඇමරිකා අංශයේ ද්විපාර්ශ්වික කටයුතු (බටහිර) පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇමරිකා අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් විදේශ නියෝජිතයන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සහ සංචාරය සඳහා පැමිණෙන සම්භාවනීය අමුත්තන් සමඟ පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>ශ්‍රී ලංකා තානාපතිවරුන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡා සංඛ්‍යාව<br>වැදගත් දේශපාලන වර්ධනයන් පිළිබඳව සිදු කළ සන්නිවේදන කටයුතු සහ විශ්ලේෂණ සංඛ්‍යාව<br>මෙරට වෙත සහ බාහිර වශයෙන් සිදු වන සංචාර සඳහා පහසුකම් සපයන ලද සංඛ්‍යාව<br>රේඛීය ආයතන සමඟ පවත්වන ලද ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන/ පසු විපරම් සංඛ්‍යාව<br>එක්සත් ජනපද දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා රජයේ **2022** පුද්ගල ජාවාරම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා පවත්වන ලද සන්නිවේදන කටයුතු, සාකච්ඡා සහ රැස්වීම් සංඛ්‍යාව<br>අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සංඛ්‍යාව<br>අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අවසන් කිරීම සඳහා පවත්වන ලද රැස්වීම්/සාකච්ඡා සහ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව | | **86%** | |

| අමෙරිකානු අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතාවය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89% - 75%** | **74% -50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/ බහුපාර්ශ්වික):**<br>ද්විපාර්ශ්වික වෙළඳාම, ආයෝජන, සංචාරක සහ සංවර්ධන ආධාර වැඩි දියුණු කිරීම<br>ශ්‍රී ලංකා තානාපතිවරුන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අදාළ රටවල අදාළ නියෝජිතායතනවල නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡා සංඛ්‍යාව<br>පවත්වන ලද සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සමඟ සිදු කළ අන්තර් ක්‍රියා සංඛ්‍යාව.<br>විදේශීය දූත පිරිස් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අතර පැවති සාකච්ඡා සංඛ්‍යාව<br>අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා ගණන | | **88%** | |
| **ආරක්ෂක සහයෝගීතාව:**<br>ආරක්ෂක කටයුතු ආශ්‍රිත සංචාර සංඛ්‍යාව (මෙරටට පැමිණෙන සහ බාහිර වශයෙන්)<br>යුධ උපකරණ පරිත්‍යාග සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ හමුදාවන්ට පිරිනැමූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br>ඒකාබද්ධ යුද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | **86%** | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පුද්ගලාන්තර සබඳතා:**<br>අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ (OSL) සහභාගීත්වයෙන් සුවිශේෂී සංස්කෘතික හා ආගමික උත්සව සැමරීම සඳහා දූත මණ්ඩල විසින් සංවිධානය කරන ලද උත්සව සංඛ්‍යාව<br>අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකිකයන් විසින් සංවිධානය කරන ලද සංස්කෘතික/ආගමික වැඩසටහන් සඳහා දූත මණ්ඩල නියෝජිතයින්ගේ සහභාගීත්වය<br>ආර්ථිකය යථා තත්ත්වයට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ගමන්මගට සහය වීම සඳහා අදාළ රටවල පරිත්‍යාගශීලී ආයතන සමඟ සම්බන්ධ වීම | **90%** | | |

| අමෙරිකානු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89% - 75%** | **74% -50%** |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්:**<br><br>මහජනතාවට කඩිනම් සේවා සැපයීම සඳහා ඇතැම් කොන්සියුලර් ක්‍රියාකාරකම් ඩිජිටල්කරණයට ලක් කිරීම<br><br>දූත මණ්ඩල විසින් පවත්වන ලද ජංගම කොන්සියුලර් සේවා වැඩසටහන් සංඛ්‍යාව<br><br>වීසා බලපත්‍ර සංඛ්‍යාව සහ ගෙවීම් රහිත වීසා බලපත්‍ර පහසුකම් සැලසීම් සංඛ්‍යාව<br><br>වීසා සම්බන්ධයෙන් රේඛීය ආයතන, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ නේවාසික දූත මණ්ඩල වෙත සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br><br>පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br><br>ආර්ථිකය යථා තත්ත්වයට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ගමන්මගට සහය වීම සඳහා අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකික සංවිධාන සමඟ සම්බන්ධ වීම | **90%** | | |

| අමෙරිකානු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| ශ්‍රී ලංකා තානාපතිවරුන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් විදේශ කටයුතු අමාත්‍යංශයේ අදාළ නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡා සංඛ්‍යාව<br>වැදගත් දේශපාලන වර්ධනයන් පිළිබඳව සිදු කළ සන්නිවේදන කටයුතු සහ විශ්ලේෂණ සංඛ්‍යාව<br>මෙරට වෙත සහ බාහිර වශයෙන් සිදු වන සංචාර සඳහා පහසුකම් සපයන ලද සංඛ්‍යාව<br>රේඛීය ආයතන සමඟ පවත්වන ලද ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන/ පසු විපරම් සංඛ්‍යාව<br>එක්සත් ජනපද දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා රජයේ 2022 පුද්ගල ජාවාරම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා පවත්වන ලද සන්නිවේදන කටයුතු, සාකච්ඡා සහ රැස්වීම් සංඛ්‍යාව<br>අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සංඛ්‍යාව<br>අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අවසන් කිරීම සඳහා පවත්වන ලද රැස්වීම්/සාකච්ඡා සහ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව | | 86% | |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික):**<br>ද්විපාර්ශ්වික වෙළඳාම, ආයෝජන, සංචාරක සහ සංවර්ධන ආධාර වැඩි දියුණු කිරීම<br>ශ්‍රී ලංකා තානාපතිවරුන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අදාළ රටවල අදාළ නියෝජිතායතනවල නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡා සංඛ්‍යාව<br>පවත්වන ලද සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සමඟ සිදු කළ අන්තර් ක්‍රියා සංඛ්‍යාව.<br>විදේශීය දූත පිරිස් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අතර පැවති සාකච්ඡා සංඛ්‍යාව<br>අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා ගණන | | 88% | |

| අමෙරිකානු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89% - 75% | 74% -50% |
| **ආරක්ෂක සහයෝගීතාව:**<br>ආරක්ෂක කටයුතු ආශ්‍රිත සංචාර සංඛ්‍යාව (මෙරටට පැමිණෙන සහ බාහිර වශයෙන්)<br>යුධ උපකරණ පරිත්‍යාග සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ හමුදාවන්ට පිරිනැමූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br>ඒකාබද්ධ යුද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | 86% | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පුද්ගලාන්තර සබඳතා:**<br>අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ (OSL) සහභාගීත්වයෙන් සුවිශේෂී සංස්කෘතික හා ආගමික උත්සව සැමරීම සඳහා දූත මණ්ඩල විසින් සංවිධානය කරන ලද උත්සව සංඛ්‍යාව<br>අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකිකයන් විසින් සංවිධානය කරන ලද සංස්කෘතික/ආගමික වැඩසටහන් සඳහා දූත මණ්ඩල නියෝජිතයින්ගේ සහභාගීත්වය<br>ආර්ථිකය යථා තත්ත්වයට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ගමන්මගට සහය වීම සඳහා අදාළ රටවල පරිත්‍යාගශීලී ආයතන සමඟ සම්බන්ධ වීම | 90% | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්:**<br>මහජනතාවට කඩිනම් සේවා සැපයීම සඳහා ඇතැම් කොන්සියුලර් ක්‍රියාකාරකම් ඩිජිටල්කරණයට ලක් කිරීම<br>දූත මණ්ඩල විසින් පවත්වන ලද ජංගම කොන්සියුලර් සේවා වැඩසටහන් සංඛ්‍යාව<br>වීසා බලපත්‍ර සංඛ්‍යාව සහ ගෙවීම් රහිත වීසා බලපත්‍ර පහසුකම් සැලසීම් සංඛ්‍යාව<br>වීසා සම්බන්ධයෙන් රේඛීය ආයතන, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ නේවාසික දූත මණ්ඩල වෙත සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>ආර්ථිකය යථා තත්ත්වයට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ගමන්මගට සහය වීම සඳහා අදාළ රටවල සිටින විදේශගත ශ්‍රී ලාංකික සංවිධාන සමඟ සම්බන්ධ වීම | 90% | | |

## 4.3.3 නැගෙනහිර ආසියානු අංශය

| නැගෙනහිර ආසියානු අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතාවය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100% - 90%** | **89% - 75%** | **74% - 50%** |
| ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික) | **92%** | | |
| දේශපාලනික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහු පාර්ශ්වික) | **92%** | | |
| ආරක්ෂක සහයෝගීතාව | **83%** | | |
| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු | | **74%** | |
| කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම් | | | **54%** |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පුද්ගලාන්තර සබඳතා** | | | **64%** |
| මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය | | | **52%** |
| වෙනත් (විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු, අධ්‍යාපනය) | **95%** | | |

## 4.3.4 යුරෝපය, මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩල අංශය

| යුරෝපය, මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩල අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%)ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100% -90% | 89% -75% | 74% - 50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>**(ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික):**<br>උදා: ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>පැවැත්වූ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, ක්‍රියාත්මක කළ පසු විපරම් ක්‍රියාමාර්ග<br>ශ්‍රී ලංකා තානාපතිවරුන් විසින් කරන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා සංඛ්‍යාව | | **80%** | |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>**(ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>උදා: රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල නිරතවීම වැඩි දියුණු කිරීම<br>සමගාමී අක්ත ගැන්වීම් තාර්කිකකරණය කිරීම සම්බන්ධයෙන් වන සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ දූත පිරිස් සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්<br>පවත්වන ලද ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව<br>රේඛීය ආයතන සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/ පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් සකස් කළ පොලිස් විශ්ලේෂණ සංඛ්‍යාව | **95%** | | |

| යුරෝපය, මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදු රාජ්‍ය මණ්ඩල අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%)ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100% -90%** | **89% -75%** | **74% - 50%** |
| බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු | 90% | | |
| ආරක්ෂක සහයෝගීතාව (සංචාර, පුහුණුවීම්) | 90% | | |
| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු | | 85% | |
| කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම් | | | 75% |
| විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු | | | 60% |
| සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ පුද්ගලාන්තර සබඳතා | | | 70% |

## 4.3.5 මැද පෙරදිග අංශය

| මැද පෙරදිග අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතාවය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%)ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100% -90% | 89% -75% | 74% - 50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු:**<br>ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- පැවැත්වූ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, ක්‍රියාත්මක කළ පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකා තානාපතිවරුන් විසින් කරන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>- අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා සංඛ්‍යාව | 90% | | |
